# කුවේණි අස්න සහ සිහබා අස්න.

දොඩන්දුවේ

ශ්‍රී ධර්මරත්න ස්ථවිරයන් වහන්සේ

විසින් ලියනලද

## ශබ්ද පද වර්ණනා

සහිතයි.

හෙන්නාතොට

ඒ. විලියම් ද සිල්වා විසින්

ප්‍රකාශිතයි.

# KUWENI ASNA & SIHABA ASNA

## *WITH GLOSSARY*

BY

REV. SRI. DHARMARATNA STHAVIRA

OF

DODANDUWA

Published

BY

U. A. WILLIAM DE SILVA.

Hennatota, Dodanduwa.

1927.

SRIEMATHI PRINTING WORKS-H KKADUWA.

# සංඥපනය.

කුවෙණි අස්න, හා සිහබා අස්න, යනමේ ග්‍රන්ථවය කිනම් කාලක කවරකු විසින් රචිතදැයි විනිශ්චය කිරීමට සෑහෙන කාරණ නොදක්නා ලැබේ. එසේදවුවත් කුවෙණිඅස්න සවැනි ශ්‍රී පරාක්‍රමබාහු මනුජෙන්ද්‍රයන්ට සෙත් වැඩීම පිණිස කරනලද හෙයින් ශ්‍රී බුඬ වර්ෂ 1958 වත් 2010 වත් අතර කාලයෙහි විරචිතයයිද සිහබා අස්න ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ මනුජේන්ද්‍රයාන්ට සෙත් වැඩුම් වස් කරනලද හෙයින් ශ්‍රී බුඬවර්ෂ 2244 වත් 2267 වත් අතර කාලයෙහි විරචිත යයිද සැලකිය යුතුවේ. එහෙයින් කුවෙණි අස්න මෙයින් හවුරුදු 460 කට පෙරද සිහබා අස්න 226 කට පෙරද විරචිතයයි නිර්ණය කළ හැක්කේය. සාමාන්‍ය වශයෙන් කාලනිර්ණය මෙසේ දක්විය හැකි වුවත් කර්තෘවරයන් ගැන එපමණවත් යමක් දක්විම අතිශයින් දුෂ්කරබැව් කියමු. එසේවුවත් මේ ග්‍රන්ථවය කළ කර්තෘවරයන් සිංහල සංස්කෘතාදී නෛකභාෂාශාස්ත්‍ර විශාරද බුඬිමත් පණ්ඩිතරත්නයන් බැව් මේ අස්න් දෙක සමාලොචනයෙන් නිශ්චය කළහැකිවේ. කුවෙණි අස්නට ඌරුඅස්න යන අපර නාමයෙක්ද පිටපත්හි දක්නාලැබේ.

## ග්‍රන්ථාන්තවිවේචනය.

කුවේණි අස්නෙහි:- වනාහි විජය රජුට කුවෙණිය ගෙන් දිව්දෙස් පැමිණි අසුරුන් එය දෙව බලයෙන් වළක්වාලූ අසුරුන් තදනන්තරව පඬුවස්දෙව්රජුට වැදුණු දිව්දෙස් සක්දෙව්දුගේ උපදෙසින් වළකාගත් පරිදිත් එසේම ශ්‍රී පරාක්‍රමබාහු රාජයා ආරක්ෂාකරගන්නා ලෙස දෙවියන්ගෙන් ආයාචනයත් සංගෘහීතව පෙනේ. සිහබා අස්නෙහිද කථාශරීරය කුවෙණි අස්නට සමානවූයේය. එය ශ්‍රී විරපරාක්‍රම නරේන්ද්‍රසිංහ නරේන්ද්‍රයන්ට සෙත් වැඩීමෙන් අවසාන කොටතිබේ.

මේ ග්‍රන්ථවය වනාහී අනුප්‍රාසරස සංයුක්තගම්භීරපදවලින් සමුපලක්ෂිත මධුර මනොහර වෘත්තගන්ධි නම් ගද්‍යකාව්‍යයෝ වෙත්.

කාව්‍යය නම්:- කවිහුගේ ඉෂ්ටාර්ථ ප්‍රසවය කරන්නාවූ ව්‍යවච්ඡින්නවූ පදවලියයි. නොහොත් රසාත්මක බන්ධයයි. හේ වනාහී දෘශ්‍ය කාව්‍යයයි ශ්‍රව්‍යකාව්‍යය ද්විප්‍රභෙදවේ. ඔවුනතුරෙන් ප්‍රසිඬ ව්‍යක්තයන් ගෙන් රචිත පඤ්චසන්ධීන් යුක්ත විලාසාදීන් ගුණවත්වූ නානාවිභූති ඇති "ශකුන්තලාදි (නාට්‍ය) ග්‍රන්ථයෝ

දෘශ්‍යකාව්‍ය නම් වෙත් තදන්‍යවූ සකල ග්‍රන්ථයෝ ශ්‍රව්‍යකාව්‍ය
නම්වෙත්. ඒ ශ්‍රව්‍යකාව්‍යය තෙමේ මහාකාව්‍ය ඛණ්ඩකාව්‍ය වශ
යෙන්ද ද්විප්‍රකාරවේ. කශ්චිත්වෘත්තාශ්‍රිත රාජෝදයාදී විවිධ
වර්ණනා සහිත සර්ගබන්ධයෙන් ග්‍රථිත "නෛෂධචරිතා"දී ග්‍රන්ථ
යෝ මහාකාව්‍ය නම්. සර්ගබන්ධයෙන් විරහිතවූ "මෙඝදූතාදී" ග්‍රන්ථ
යෝ ඛණ්ඩ කාව්‍ය නම්. තවද:- කාව්‍යය පද්‍යය-ගද්‍යය-මිශ්‍රය යන
භෙදයෙන්ද තෙපරිදිවේ. පද්‍ය නම්:- චතුෂ්පදයෙන් යුත් බන්ධ
යයි "සිවුපද=ගාථා= ශ්ලෝක" යනුද මීටම අපර නාමධෙය
යෝ වෙත්. හේ පද්‍යයද ජාතිය- වෘත්තයයි විභෙදවේ ජාතිය
ආර්‍ය්‍යා ගීතිය- වෛතාලීය- මාත්‍රා සමක"යයි චතුර්විධවේ.
වෘත්තය වනාහි:-උක්තා අත්‍යුක්තාදී සව්සිසි ඡන්දසුන්හි ඇතුළත් ශ්‍රී
ආදීන්ගේ වශයෙන්ද අර්ණාර්ණවාදී දණ්ඩකයන්ගේ වශයෙන්ද
බහුවිධ වේ තවද:- පද්‍යය වනාහි "මුක්තකය-යුග්මකය-විශෙෂකා
ය-කලාපකය-කුලකය-කොෂය-සංඝාත"යයි සප්තවිධවේ. අනික්
ශ්ලෝකයක් හා අසම්බන්ධවූ කෙවලපද්‍යය "මුක්තක"නම්. අන්‍යොන්‍යා
න්‍යය සම්බන්ධවත් ශ්ලොකවය "යුග්මක"නම්. එසේම ශ්ලොකත්‍රය
කින් යුක්තවූයේ "විශෙෂක නම්. සන්දානිතක"යනුද මීටම නමෙ
කි. එසේම ශ්ලොක චතුෂ්කයකින් යුක්තවූයේ "කලාප"නමි.
එසේම පඤ්චාදියකින් යුක්තවූයේ "කුලක" නම් ඇතැම් ආචාර්‍ය්‍ය
කෙනෙක් ශ්ලොක පඤ්චකයකින් යුක්තවූයේ "වාණවාලි"යයි ද
ෂයකින් යුක්තවූයේ "කරහාටක"යයිද කියත්. අන්‍යොන්‍ය සම්බ
න්ධ විරහිත ශ්ලොක සමූහය "කොෂ" නමි. යම් කාව්‍යයෙක් කි
වෙනවෙනම නිෂ්ඨාකරන ලද අර්ථවත් පද්‍යයන්ගෙන් කථාව
ගේ නිර්වාහ කරනුලැබේද, ඒ වනාහි "සංඝාත"නම්.

ගද්‍යය නම්:- ඡන්දස් විරහිතවූ පද්‍යයට නොනැගු කදම්බයාදී
කෙවල කථා ප්‍රබන්ධයයි. හේ වනාහි "වෘත්තකය-උත්කලිකාප්‍රාය
-වෘත්තගන්ධියයි ත්‍රි භෙදයෙක් ඇත්තේය. මෘදු කොමලාක්ෂර
ඇති ස්වල්පසමාස ඇති ගද්‍යය "වෘත්තක නම්. දෘඪවූ අක්ෂර ඇති
සමාසාඪ්‍යගද්‍යය "උත්කාලිකාප්‍රාය" නම්. වෘත්තයන්ගේ ඒක
දෙශසම්බන්ධය ඇත්තේ "වෘත්තගන්ධික"නම්.

මිශ්‍රය නම්:- පද්‍ය- ගද්‍යවයෙන් සිද්ධ කාව්‍යයයි. මීටම චම්පූය
යිද කියති. ජාතකමාලාදී ග්‍රන්ථයෝ චම්පූලක්ෂණයෙන් යුක්ත
වෙති.

තවද:- උත්තම-මධ්‍යම-අධමවශයෙන්ද කාව්‍යයාගේ භෙද
ත්‍රයෙක් විද්‍යමානයහ. වාච්‍යාර්ථය අතිශයින් ඉක්ම පවත්නාවූ
අනුසාරයෙන් ගතයුතුවූ අර්ථඇත්තේ "උත්තම"කාව්‍ය නම්. මීටම
"ධ්වනි"කාව්‍යයයිද කියත්. වාච්‍යාර්ථය ස්වල්ප වශයෙන් ඉක්ම
සිටින්නාවූ කාව්‍යය "මධ්‍යම" නම්. ශබ්දාර්ථයන්ගෙන් විචිත්‍රවූ
වාච්‍යාර්ථය ඉක්ම නොසිටින්නාවූ හෙවත් ව්‍යඞ්ගරහිතවූ කාව්‍යය
"අධම"නම්. තවද:- ඇතම් ප්‍රාඥයෝ "උත්තමොත්තම-උත්තම-
මධ්‍යම"අධම"යයි චතුර්විධ කොටද දැක්වූහු. මෙහි තත්වය පෙ
රකිතසින්ම දතහැකි හෙයින් ප්‍රපඤ්ච කථා නොලියනු ලැබේ.

**අපගේ සංස්කරණය හා උපකාරාභිස්මරණය.**

---

මේ ග්‍රන්ථය මීට පෙර දෙවරක්ම මුද්‍රිත බැව් පෙනේ. පාංශුප්‍රච්ඡන්න මාණික්‍යරත්නයක්සේ ගුප්තව පැවති මේ ග්‍රන්ථය මුද්‍රණයෙන් ප්‍රචාරයට පැමිණවූ ඒ උතුමෝ මහාජන ප්‍රසාදය ලැබීමට සුදුස්සෝ වූහ.

ඒ දෙවරෙහිම පෙළ පමණක් මුද්‍රිතවිය. අතිශය ගම්භීර පදාර්ථවත් මේ ග්‍රන්ථයෙහි අර්ථවිවරණය නවීනයන්ට තබා ප්‍රවීනයන්ටද දුරවබෝධවේ. මෙය ග්‍රන්ථිපද විවරණයකින් යුක්තකොට මුද්‍රණය කළොත් ආධුනික ජනානුග්‍රහයක් වන බැව් ගන්දර ආණ්ඩුවේ පාඨශාලාවේ උපාචාර්යවූද සිංහලළමයා සඟරාවේ කතෘවූද **පී. ඞී. ඇස්. වීරසූරිය මහතා** විසින් අපවෙත දන්වා පුස්කොළපිටපතක්ද සපයාදී ග්‍රන්ථිපදවිවරණයක් කරනලෙස සමාරාධිත බැවින් පෙළද යථාශක්තීන් සංශෝධනය කොට අතිපරිශ්‍රමයෙන් ග්‍රන්ථිපදවිවරණයක්ද සම්පාදනය කරනලදී.

අපගේ සංස්කරණයට ද්විතීය සංස්කරණය උපස්ථම්භකවූ බැවිද කෘතඥතා පෙරටුව සඳහන් කරමු. තවද:- අපගේ ධර්මාචාර්යවූ තංගල්ලේ ශ්‍රී ගෞතම විද්‍යාලයාධිපති පණ්ඩිතාචාර්ය භදන්ත ශ්‍රී **වැලිපටන්විල දීපඞ්කරාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන්** වහන්සේගෙන් ග්‍රන්ථ්‍යර්ථ විවේචනාදී වශයෙන් උපකාර ලැබුණුබවද ගෞරව පෙරටුව සිහිපත්කරම්හ. අපමිත්‍ර කළුවාමෝදර කල්‍යාණාරාමාධිවාසී **මොරගල්ලේ සිරි ඤාණෝභාස තිස්ස** යතිවරයන්වහන්සේද මේ සඳහා අපට උපස්ථම්භකවූ බැව් සතුටින් සඳහන්කරමු.

අපගේ ප්‍රව්‍රජ්‍යාචාර්යවූ කුමාරමහාරහාර පාරම්පරික දෙඛන්දූව කුමාරමහාවිහාරය තිරාණගම සුනන්දාරාමය යන උභය විහාරාධිපත්‍යයෙන් වැඩසිට ස්වර්ගස්ථවී වදාළ සම්භාව්‍ය ගුණගණසමුපේත තිරාණගම **සිරිපවර සද්ධානන්දාභිධාන මහාස්ථවිරපාදයන්** වහන්සේ මෙහිදී සම්භාවනා සහිතව අනුස්මරණය කරනලදින් මේ සත්කෘත්‍යයෙන් ජනිත පුණ්‍ය ස්කන්ධයද එතුමන්වහන්සේ වෙත ප්‍රේමයෙන් සම්පීණය කරමු.

මීට, ශාසනරසික,

**දෙඛන්දූවේ. ධම්මරත්න ස්ථවිර.**

2470
1927-7

සුනන්දාරාමය
තිරාණගම.

# කුවේණි අස්න.

ස්වස්ති වරත්‍රිභුවනාධාර ගුණරත්නාවාරාකාරොදාරදුතීරතර ඝොරමාරාරිහඞ්කාරකළහාරහරතාරඝනසාරකහ්ලාරඛණ්ඩරසිත ක්ෂීරමෘතසාරඅවිශෙෂසදෙෂාෂමයවෛශධර කීර්තිපරිවෙෂයෙන් ශොෂකළ'ශෙෂත්‍රිභුවනභවනකුහර ඇති, ජගත්ගුරු සුගත් මුනි තුමාණන් විවිධමෘදුපිකව ශතපත්‍රයෙන් විත්‍රඅරවින්ද ඉන්දීවරකන්ද මකරන්ද මධුගන්ධයෙහි ලුබ්ධඅතිමුග්ධ ෂට්පාදයන් නාදදුන් චනි තජලහරිත ගම්භීර උත්තුඞ්ගප්‍රාකාරපරික්ෂිප්තාස්ඵටිකමණිහිති ස්තම්භශොපානගොපුරවාරප්‍රකාරහිමධවළශිඛරප්‍රතිභාගමන් දිරොපජ්ජෘම්ග ශෘඞ්ගාරමදපඞ්කජලහෘඞ්ගගණ*ශෘඞ්ඛලිතානඞ්ගර ණ රඞ්ගරිපුත්ඞ්ගකළ හෘඞ්ගකුලතුඞ්ගමාතඞ්ගතුඞ්ගතුරඞ්ග ඈදි චතුරඞ්ගසෙනා සමෘඬාදියෙන් අසිරිමත් සසිරිබර එකුසිනාරා නුවර වුලල † භුජඋලලසිත වුලලසරසිජවදන මලලරාජයන්ගේ පල්ලවිතවෘන්තඵලපත්‍රසංඝකනවවටිටපමධුමත්තකොකිලධ්වනිපු ක්ත ගිරිරඞ්ගයෙහි නෘත්ත ශිඛිපිච්ඡ ආවර්තයෙන් ව්‍යක්ත උප වර්තන නම් සාලඋද්‍යානයට තික්ම මුනි යුග්මසාලයන්ගේ මධ්‍යයෙහි ශුඩවූ ශයනයෙහි ශයනාකාර නිවන්පුර වදිනදින ප්‍රවරතරතුමූල බලභද්‍රසමශක්තිඇති උත්තුඞ්ගබාහුවෙන් නන්රුපුන් මන් ඔබා භානුකර සන්නිභා තෙජසින් තත්පහා දුරුරු රණ රන් ගුහා වෙන් පසිඳු වෙන්සුබාවෙන් දෙරණ ඉන්ඝබාවෙන් දුරු සිංහබාහුනම්රජුගෙ පුත්‍රවූ නිජයසසඅමෘතනාද විජයසිරි භජ නකළ රජයකළ කොසරපුර විජයරජකුමරවර සමරභටනිවිර ඝනපටලපුටපාටනොදිත තරුණඅරුණකරකිරණසුරු තෙජ සම්භාර වරරොධයුත් යෝධයන් සත්සියක් රැගෙන දඹදි වින් නැව්නැග, ප්‍රබලඝනපවනබලලුලිතජලජවලිහසංඝාතසම භුතමණිසඞ්ගරලහඞ්ගසංඝට්ටිතොත්තුඞ්ගගිරිසාටසාතටළලිතශීඝ්‍ර රාසාරයෙන් ගම්භීරවූ, චණ්ඩවෙතණ්ඩශුණ්ඩකාරුණ්ඩකුණ්ඩලිති භවන්තිසවාහධුමනිබිලදෘසවඩබනලමුහුදුදර යෙන් තිස්ව ද්වා සැඬවබදියෙහි තොලස්වම මෙලක්දිව පැමිණ, පළදොළදුවලල කළදලපබලවැලතරලරැළිති'පිලිපිලකොළිනමින්වැල ගසළ ඔස ල සක්පෙළිනුදුල තරල විසුලලෙළ වෙරළුතට නිසාවවැසිඛාය

---

* "ඝන" † තුල්ල

සෙන් ප්‍රකටවූ තෘප්තිමදගන්ධයෙන් බමනමත්බමරගණ මුඛර
ඣඞ්කාරනාදයෙන් කෝලාහලෙන් මණිනිපිතගණ්ඩස්ථලිවන්‍ය
මදදන්ති දන්තයෙන් උද්ඝට්ටන තරුච්ඡපසඤ්ඡන්න තම්මැන්න
අරණ්‍ය ආසන්නවූ නැතෙක තුගතුරෙකමුල විපුල්තෙද කොපුල්
කර සුපුල්වන් උපුල්රුස්නුපුල්වන් උපුල්වන්සුරිඳු සුරරදුන්
මෙයෙවරින් සුර පුරෙන් බැස, පසැස්මුනි වෙසෙස්කර පසස්
කළ තවුස්වෙස්විලස්ගෙන තොලස්වෙම්නවුත් උස්පලස්නෙහි
පිවිස ඉඳ සතොස්රුස් පිරිස්සහ සහස්ඇස් සැලැස්මෙන් පැමිණ
වෙන විජයරජකුමරහට පිරිත්පැන් පිරිත්හු සිරිත්ලෙස දෙමින්
සව්සිරින්දවසරිත ලෙස සලස්වා තිදසපුර පැමිණිසඳ, සුපුල්මල්
බමරබර ලපළුපත් සෙවෙනිඇති ලසල්වට විසල්ටැම්පෙළින්
සුසැදුණු රුවැති සුනිල්දලසමුඩුසාමඬුලු සුදුවියන් ඇති සුපුල්සපු
මුහුළුතුරු රන්රිදියතින් තිති සිඟිල්තල සසල දිගු වැළුක්මල්
සෙමරඇති විසල් වටකෙතකීකැකුළුවට පහන් ඇති සුනිල්
හෙළඇඹුලුපුල විපුල්තල්වැටින් යුති තමල්ලිය වතළලෙළ
පුලිනතල යහන්ඇති යොහොඹුලිය ලැහැප්ලියමඬුවකට
පිවිස තිති තුසරබිඳුනියෙනුදුලලපළුතල ලෙළවමින් බමර
මිණි වෙණ රවන සලෙළ අතු අතින්ගෙන පවරමිණිමුතු දිමුතු
කුසුම්කැන් තනනතන තවරකළ සුවඳරොන් රන්පපින් ගවස
මින් මුවරමල්කෙසුරුදසනගින් මඳසිනා ගෙන මොණර
●ත් කොවුල්රැව් ළියගී කියකියා එන නොහැර සල්පලොල්
සපු තළත් පිරිවරාගෙන ඇඹෙරෙනා ලියලියන් රඟන රඟ
බලං● ා න ළුනර යෝබළන් සහ මදක් උන්සඳ එනන කුවේ
නී යක්ෂිණී* වෙතින් යන දක්ෂවූ යක්ෂිණී යක්තොමෝ මවා
බැලී වෙසක් සෙද එසක්විති කුමරුවෙත පෙනීගිය ලෙසක්
දක පසස්වූ මිහිස්වස් පියසෙකැයි සිනා ඇ ගියා දක පියා
●අව්ස●විල්නෙරට බට යොධයන් නාවිසින් විජයභූපාලවර
●කාපාල ආරූඪ නිර්ධූත ධූමාවලියක්සේ දිගුපෘථුලසිපත්‍රය
දකුණතින් ගෙන චලිතජජ්ජ්වලිතවිද්‍යුල්ලතාවක්සෙ ලෙළව
මින් යෝබළන් හිය ගසරලෙදගොසින් විල්තෙරට බැසළු
වෙන තුඟසෙවෙන ඉඳ සුවඳමුවරදෙහි වැද හමනමදපවන්
විද සිහිදුදිගුපුළුල්, වසළුව පටදෙපටකොට රන්සෙසෙල්කඳසෙ
වටමටසිලුටු වටොරපිට තබා රන්ඉද්ද නටවමින් සොඳ සුපුල්
සපු මල්දමෙව් සලෙළ මොළොකනෙහි මුල පැපැකැටි තුල්පිළ

* යක්ෂණී

නුරාබර ගිරාතුඩු සදිසි ! දිගු නීයෙන් මැදමඳමදින් 'මඳහසින් නුව
නගින් බලා කපු කපින්නිය රුසිරුලොව වපින්නිය කුවේනිය
යකින්නිය ලගවගෙස් දකින්නිය නුවනගින් බලන්නිය මෙමා
යෝබලන් මැවිසින් සැගෙවුවයි රදසිතා ඇගෙ සිරසකොස්වැටිය
අත දවටමින් කඩුවගෙන අඩුවත්ට සලස්වමි කියන සිතකියෙන්
ඔ මලානික වෙලා වැසිවලාලෙස ගලාසෙද කඳුළුහැලි පැහැලි
සුවලැසින් බසිනාසඳෙහි අභයදී දුන් "මෙමට ඔබගෙ සිත්වූලෙස
ට මෙමා අගබිසෝ කොට දවස් අරිනාලෙසට දිවුට දුනහොත්
මෙමට සත්සියක් යෝධයන් සමග සව්සිරින්පිරි මෙසිරිලක රජ්
ඉසුරු සැපත්කර දෙමියි දුන් ඇවිසින් කීවිසින් යහපතැයි
සිපතගෙන සපථ*කොට යෝධයන් ගෙන්නවා ඇ මවා දුන්
විමන රුනිඳු රද උදුසණ සඳ ගත් වෙළඹ වෙෂයෙන් හෙෂ
රව හීෂණෙන් වෙෂවත් පක්‍ෂවූ යක්‍ෂිණිය පිටින් යක්පුරට
වැද වෘතනසඤ්ජාතවූ වක්‍ෂඃස්ඵුරත්ත්‍රාසක්‍ෂවත් දශිනෙන්
රුක්‍ෂවූ කාක්‍ෂුද්‍රලීක්‍ෂ්‍යවූ ලක්‍ෂණෙන් කාක්‍ෂවත් පක්‍ෂගිරි වක්‍ෂ
විකෙක්‍ෂපකර කුක්‍ෂිහර වෘක්‍ෂවත් සථූල ප්‍රතිපක්‍ෂමනුෂ්‍යගණ
භක්‍ෂණෙහි දක්‍ෂ අකෙක්‍ෂපකර අක්‍ෂමප්‍රබලතර යක්‍ෂයන් නාෂ
ක්‍ෂකා කාරවූ දක්‍ෂිණ හස්තයෙන් දක්‍ෂවුන් සේ යකිනි කුක්‍ෂි
යට භක්‍ෂණය කරවමින් ශික්‍ෂණය දක්වමින් පක්‍ෂවූ යක්‍ෂිණිය
උවදෙසින් විජයලැබ විජයසිරි භජනකළ **විජයරජ කුමරවර**
වෘක්‍ෂගිරි කක්‍ෂ සත ලක්‍ෂණෙන් ගහනවූ **තම්මැන්න** රණ
දෙරණ සප්පිත මණිසඞග උතතුඞග ප්‍රාකාර පරිඛාපරික්‍ෂිප්ත
ගොපුරවාරප්‍රාසාදපද්මාලයොද්‍යාන සුරසිඞවිද්‍යාධරොරගනිශා
වර භූතපතිනිවය නිෂෙවිත චිත්‍රශාලාදී නගරාඞශසම්පත්ති
යෙන් යුක්තකර නනා පුර වරක් සොද ගජතුරඟ රියභුජඟ
සමඟ සිවු රඟසෙනඟ සඟ වායකර කුවේනිය බිසෝකර
කලස් දරුවනුත් ලැබ රාජලක්‍ෂ්මිය සමග වසනසඳ, ශික්‍ෂි
තා චාරගුණ රක්‍ෂණෙහි දක්‍ෂවූ පක්‍ෂපාත ප්‍රවර විචක්‍ෂණ ලො
කසංරක්‍ෂණෙහි දක්‍ෂවූ ප්‍රභූමන්ත්‍රී ගණ රුස්ව සහතොස්ව නර
ඹිඳුන් වැද ලකුළුමිණි කිරුළු හිස දරනලෙස දුන්වුවෙන්
ජයරජ උග්‍රවූ අග්‍රමෙහෙසිකාවක් නැතිව ඒ කොසේදසි මෙ
ස් මැලි වූවිසින් නොහඩුපුඩු නොකලබඩු සමුඩු මිණි පඬුරු
කොට පඬිරජුට යවා රට දකුණු මදු රාපුරෙන් ලකුණුසර.
ඤ්කුල ජලධිශශි වජ්‍රිකා වක් අසුරු ස්නිග්ධකස්තු කාමො
ධම්මිල්ල සම්පුල්ල ඉන්දීවරවන්දයක් වන් නයන ප්‍රවර මූඛ අමා

---

* සැපත=මුද්‍රිත.

තනා ර බිම්බ නිභ බිම්බඵල පලලවා සාරාධර කුන්ද කුඩ් මල සදෘශ
මන්දගා සස්ඵුරිත දනත පඞ්ක්තියෙන් අභිනන්දනීය ප්‍රවර කුච
කනක කලසභාරාවනත වලිත්‍රය විචිත්‍රාකාර රොමාවලීරාජී
යෙන් මනනයන බඩමඩ්‍යමප්‍රදෙශයක් ඇති මණිකනක මෙඛ
ලා භරණයෙන් විභූෂිත ජවලිතමද රාජගජ කුම්භසන්නිභ
තුඹුල පෘථුල ජඝනස්ථලා ලඞ්කාර සවර්ණසුර සන්නිර පුෂ්ප
චාරු ජඞ්ඝා වරණ නුරුවලා රැඳි රොමාලි රාජීමත් සුත්වුලල
සරසිජොපමපාදයෙන් රුසිරි බරිතුදුල සුරලියක්මෙන් සව්
සිරින් වැඩි සිටි පාඬිමහරජුන්ගේ රටින් නැව් පිටින් ගෙන්
නවූ සොඳ රදූ සඳ අවුත් මහතොටට බැස එතිය යනු අසා
කුවේනිය ගෙන්වමින් යකුන් මිනිසුන් සමග එක්ව දවසරින්
නට නොපිළිවන. එසින්දරුවනුත්ගෙන දූන්ම මින් යන්ට
රද වදහලෙන් සුසුම්ලා යකින්නී නෙත්කඳුළු ඉසින්නි මෙ
ළෙස සිට කියන්නී සිංහපුර වරසොඳ රජඉසුරු විඳ ඉඳ
කරනනොපණත් සඳ නැව්නභා හලසඳ ලක්දිවට බැස එද
නුග සෙවන වනමැද නතිව උන් සඳ රද බත්බුලත් දීසොඳ
මවා විම නක් සොඳ රැදෙදෙන එහි තිද වූසදෙහි රිවිළද වෙ
ළෙඹ වෙස් ගෙන යොද යකුන්ගේ පුරවැද මරාඋන් ලුහුබැඳ
රජසැපත් නුඹ සොද දවසරින කල එද බිසෝ කර මා සොඳ
නොවෙන්වන ලෙස සඳ දිවුට දෙන සඳ එද යකිනිබව නොද
නුද දූන් මහිමි නුඹ සඳ මහත්දල පෙම්බැඳ සමගවැස නුඹට
ද කොටම දරුවන් වද උන්මෙමා ඇරඅද දූන් සෙනෝ
වෙන යොද හිමිවියෝ වූසද සුපුන් සඳ උදයගින් දිලියවට
පස් පෙනේ. ගමනඹදනල සඳුන් සිහිල්ගිනිසේ දූනේ. සුවඳ
මල් පෙනි අතුළ යහනකටුසේදූනේ. සමදනද කොවුල්රැව්
නනත සවුලෙව් ඇනේ. මදනරද යුදට දූන් දූනෙයි සැර
පසගෙනේ මෙසද මෙවියෝ දුකින් කෙලස වැ වෙමි අනේ
ගෙල'පැලා කුසුම්දම වැලඳ නිදි ගෙනමලභ විදිනකල පහස
අම ගැල්වූ නුනු වන මහිම සොදසඳුන් සොකුම්ඹිම අකලකැයි
හරිනා මම වෙන්වගොස් හිමි උතුම කෙලෙස සන සම්ද ලැම
ලැම්දූ තන තුනකිනේ එකාක්ඉන් ඇතිසෙනේ හිමිපුමකු
දුටුදිනේ මැසොනකී බස්ගෙනේ සිත සිනා මෙම වනේ උන්
සදෙහි නුඹසෙනේ දුටුපිගස එමතනේ මැකී ගිය එමතැනේ
එතැන්සිට හිමිසෙනේ තදව බැන් දෙම්. ඉනේ එසෙවුමා ඇර
අනේ සතොස්කර වෙනතැනේ යන්ට කීවයි දූනේ බිලි
දරු වන්ගෙනේ කොයි ගොසින් කොහී අනේ රැකෙම් දූන්
දෙවියනේ කියකියා අඬමිනේ නෙත් කඳුළු ඉසිමිනේ අනේ

නා කියමිනේ වත්සදෙහි ගොස්වනේ විජයරජ කුමරවර
සපිරිවර පෙරහරින් ගෙහැරපුර වරටසෙද පඬිබිසව අභි
ෂෙක කරවමින් සහපෙමින් දවසරින කලසැපත කළුවිපත
දූත රුහැණි වූ ගිහිණි යක්ෂිණි කොපිවූ දිව් වෙෂ යක් රූගෙන
දෙගවුදිග රුදුරුවූ විදුරුමය දිවක් දිගු කරමහත් දෙර
සතක් සිදුරුකර දැදරුකොට විජයරජු හෘදය මධ්‍යයට පො
වත, එදෙවිරජ එදිව් තිය අගින් සිඳ හළ සදෙහි එජිගවා
ඛණ්ඩයද චණ්ඩගුණ ෂණ්ඩයෙන් මණ්ඩිතාඛණ්ඩවූ පුණ්ඩරික
යන්ගේ වෙෂගෙන භීෂණය කරවමින් දූෂණය දක්වමින්
රජුවෙතට නොවලසා යතතිසා දිවිරුසා ඒ අසා දෙවිරුසා
සහතොසා ඔහුවසා ගනවසා පදලසා ඔහුතිසා සෙදපිසා දිවි
දෙසා දුරගසා දෙෂවිෂ කිල්විෂක්‍ෂාලනය කොට මෙලසා රජ
ඉසුරු විඳිනාමද පසක් සක් විලස් දක් වමින් අට තිසක්වස්
රජයකර ත්‍රිදශපුර පරායණ වූසදෙහි, බෘහජ්ජග දුදරගිරි
කුහර මෘගශත්‍රැවූ සුගත්පද පද්මධෘත හස්තවාරිත්‍රවූ සුභා
ජ්ජන වදනශත පත්‍රවත මිත්‍රවූ ශරත්ශශ ධරසදෘශ
විශද යස මිත්‍රාව අමිත්‍රපසමරවාරණවිශසිපත්‍රවූ ජගත්තල
අඛිල ජයනිජආත* පත්‍රවූ සුමිත්‍රරජ කුමරුහට මහත් තිජ
පුත්‍රවූ අඛිලජග දණ්ඩමණී මණ්ඩපාධාරභෛවතණ්ඩගුණ්ඩා
කාර රුස්භුජ දණ්ඩයෙන් ඛණ්ඩිතා රාතිභූමණ්ඩලඛණ්ඩිතවූ
මණ්ඩිතා වාරගුණ ෂණ්ඩ මණී කුණ්ඩලොල්ලසිතවූඛ මණ්ඩ
ලන් පුණ්ඩරී කයන් ඔද ඛණ්ඩකළ පුණ්ඩරී කාක්ෂයන් චණ්ඩ
තව ඛණ්ඩභූමණ්ඩලොද්වහනවර භින්දිපාල ප්‍රමුඛ දණ්ඩකො
දණ්ඩ දණ්ඩායුදෙහි දක්‍ෂවූ වෛරිහට ෂණ්ඩහෙරුඞමණ්ඩලෙ
ශාධිපති පණ්ඩුවාසනම් රජ මෙලකරජ පැමිණිපසු දිණුනක
ගෙළ වසන්† තුළ සලෙලදල යහන්තුළ තුමූලනිද්‍රොපගත
වූ සදෙහි සවප්නයෙන් දිව්සුරත් විප්‍රසන්නාක්ෂියුත් භයංකර
දිව්වෙසක් දූක භීති යෙන්නැගී සිටියතැන් පටන් සිය කුලග
පිය රජුට මෙන් පැමිණී සාශශ්වාසජමරදුහ මධුමෙහ සහ
දෙහ ශොෂණා දී ව්‍යාධි යෙන් ව්‍යධිතවූ නිරිඳු දූක, උදුලදල
පුඩුලකළ තරලතර තරගිහිණී මිණීකිකිණි රසුදූලින් මූතුලැ
ලින් මදනලින් ලෙලසානසා චලපත්‍ර පත්‍රයෙන්+ චිත්‍රවූ ඡත්‍ර
යෙහි වසන සුර වරරද මන්‍දර ගිරිහිසින් ධරණීසුන්‍දරපුර
න්‍දරපුරට ගොස්එසුර සගාමවහි ප්‍රභාභාර ප්‍රභාධර සභාපුර
සවණ් මණී සාමියෙන් නිර්මිතොතතුඞගවර ශෛල ාසන අරා
දිවසරා පිරිවරා උන්සුරාධිපවරා පුරඳරාදූන, නොයෙක ලක

* නිදයාධ- † වහන්-යහන්. + චලපත්‍රයෙන්-වූ

දනන් රුක නිසැක අණසකින් එකඡත්‍රකර වැජඹි පඬු වස්රදුට පැමිණි දිව්දේෂයට සිරිලකට එනලෙසට මලරජුට මෙහෙවරක් වදහලොත් යහපතැයි යනු අසා සක්දෙවිඳු සඳඉසුරු හට නියොග කෙලෙ. එදෙවි රද නියොග ලත් රාහු අසුරිඳු මලයරද දඹයමෙහි දෑස්වූලොබ ඇතැයි කෘරවූ ඌරුවේෂයක්ගෙන මලයනිරිඳුන්ගෙ මඟුලුයනබැස කුන්දමන්දර අරවින්ද පිචුමන්ද මූචලින්ද ඉන්දීවර ස්එන්දනා චන්දනාගරු සින්ධු වාරාදි කර්පූර සත්පූග පුන්නාග කුද්දාල හින්තාල කෘතමාල තෘණසූල වකුල* වඩෙකාල සුරසාල දූම්ාර තකෝල මධූසාල පනසාම්‍ර ජම්බු ජපාතිම්බ කදම්බ රම්භා තරු ජම්භිර ජම්භාල ආම්‍රාතකී උදුම්බර සනමහ ශෙවතාම්‍ර මාලූර ඛර්ජූර කරවිර සන්නිර ගණ්ඩිර සෞවිර කර්ණිකාර මෘතසාර සහකාර මාලූර එලහාර තුරුසාරමින්-පැරදල නැර ඇත තුමූල් මූල් උදුරමින් කිසල්මල් වගුරමින් දිගන්තර ගුගුරමින් එලාතුරු පලාදළ වලාඑක හෙලාඋකු තලාසෙද ප්‍රලයකල පබලබල අනිල වේගයෙන්මූලිනි'ගිලිගත් කාලකූටයක්සේ සිටිනසඳ තරුණතර අරුණකර කිරණයෙන් තිමිරඝන පටලපුට පාටනය කරගගන තලඋදය ධරධරණීධරශිකර යෙන්උදු සඳ උයන් ගොව් උයන්වැද බලනුයේ උපුටසෙල් විසල්සල් කිතුල්තල් මිදෙල්දෙල් පලොල්මල් තමල්වැල් නකුල්පුල් කමල්විල් කොපුල් බිත තබා තොම තබා බිම්ඔබා ඔබිනොබා දිව නොබා තුරුරුසා ළගසා ගොඩගසා නොවලසා සෙදනසා ලූඑසා උයනදැක අහෝ මේ කිමෙක්දෝ කුසුම්තුරු එලද්දෝ මඟුලුයන නසද්දෝ මලෙසකා ඇවිද්දෝ මිගත්ඇත් රැලෙක්දෝ නොහොත් ගිරි පෙලෙක්දෝ දුටුකෙනෙක් නොමැද්දෝ නිරිඳුහට කියද්දෝ දුවොත්මා තබද්දෝ යනාදී අදෝනා කියන්නේ වැලපෙමින් සිතන්නේ යොදුන් උස මුදුන් කුළු පෙළින් නිති සැදුම්ලත් හිමව් ගිරි රදුන් සහ අදුන්කුළු දක්‍ෂයුග පක්‍ෂපත්‍රප්‍රහරනකොට අවුත් බැස, වෘක්‍ෂකුල කුක්ෂියට හක්‍ෂණය කෙට මෙසඳ කා ඇවිදිනා නැනැද්දෝ විත්තවික්‍ෂෙපයෙන් බැබලා ඇවිදිනේ ඔහුපාද ලක්‍ෂණයදැක, නොහැර ගොස් රතැස්කෙස් කරස්පස් උසස්හිස් කෙලෙස්ලෙස් සරොස්වෙස් විලස්ගත් යක්‍ෂසූකරාදැක, වෘක්‍ෂ ශාඛාතුරෙන් එබී එබී මගට බැස නිරිඳුහට කියන ලෙස ගොසින් පුර සභාමැද ශිශිරකර විශදසිත කිරණයෙන් ජවලිතශරදභ්‍ර නිභ ශුභ්‍රතර විභ්‍රමප්‍රභාධර සුර සවර්ණ වෛවර්ණ්‍ය සතරත්නතාර කාන්විත්‍යුක්ත විත්‍රවිස්තාරවූ විතානාභ්‍යන්තරෙහි ලම්බමාන ප්‍රවර වෘක්තමුක්තාජාලප්‍රතිබිඹ ධවලාතපත්‍රයෙන් යුක්තභාසුරෝ

* "වජ්‍ර" මුද්‍රිතඃ

දූර සිංහාසනාරූඪවෙමි තෙසඳ, මණිකනක නාඩීක කටකාභර ණහාර නූපුරාදිභූෂණෙන් භූෂිතව තුඩගකුචකුම්භ සම්භෘතලලිත කුඞ්කුමාලෙපයෙන් පඞ්කකළ අඞ්ගනාවන්ගෙ මණිකනකතාර, දියෙන් යුක්තමෘදංගසනයෙන් ධූයමානප්‍රවරචමරීමෘගවාලයෙන් හමනමඳ පවන්විඳ මන්ත්‍රිගණ පිරිවරා සක්දෙව්දු ලෙසට උන් මලනිරිඳු වැඳ වැතිර උපිතව කියනුයේ අභිමතර වංශමණි මන්දිර ප්‍රදීපා විමනතෘප සමර සංහාරකෘත් ප්‍රකොපා යුවතිජන නයනආකර්ෂණ සවරූපා දිවසකර කරවිසර නිහතර ප්‍රතාපා අඛිලජය නිජයකළ නිඛිලධරණීධරභූජමලයප්‍රභූපා, කෘෂණ භූධරශිඛර උභයකොටියෙන්දිසි අර්කබිම්බ පතිභ චක්ෂුර්යුග යක් ඇති, චක්‍රවලයාකාර ඛණ්ඩගණ්ඩසප්ලාකර්ෂණය කලත්‍රෑර තර චක්‍රදළදෙකක් ඇති-ධිකකෘත ස්ථූලගිරිශිඛරආකාරවූ අඳුන් වන් විලස්කෙස් නිවෙස් ඉස් කරක්ඇති, දෘශ්‍යමානපෘථුල තුඞ්ග මෛනාකගිරි* පක්ෂපත්‍රවයක් සදෘශකන් දෙකක් ඇති-ශ්‍යාමනිය ප්‍රබල තිමිරජල භරිතවූ ඝොරතර මෙඝකූටයක්බඳු බඳක්ඇති, පුෂ්පඵලභාරතුරු එලංවල් තළාලන මූලින්දළ සබලතුල් තැබළ වල් පතක් ඇති දික්වූ උල් සිව්කූරෙන් ඌරෙකැයි කියනුම්ස ඇතුන්ගේ පතුල්තුල් මහත්පිය පතාඇති මාරගිරි මෙඛලා කාරවූ මහත්ඌරෙක් ඔබගෙ මඟුලුයනබැස නැසූලෙස කියනු කිම-සොඳුරු ඉඟුරලත් නැත. මියුරුපල වැලත් නැත. වීදුරුපල කලත් නැත. ලාදුම්ල බුලත්නැත. දූදුඅබ තලත්නැත. වඳුරුමෑ මුහුත් නැත. පඳුරුදිගු ඉඟුත් නැත. බටුවෙ නටුවකුත් නැත. කූර කූරකුත්නැත. මඳමද ගන්ධ වාහයෙන් සුවඳ හමන නිති මල්ලිකා, මාලතී මාධවී මලුත්නැත. බෘඟමකරඳයෙන් පිඤ්ජරිත කරන නවමල්ලිකා නීලිකා මලුත් නැත. චන්ද්‍රහිම චන්ද්‍රිකාවෙන් විකච පත්‍ර ඇති නන්දසෙව් වන්දිසෞගන්ධික, මලුත් නැත. කුන්ද අර විඤ්ඤශතපත්‍රයෙන් විත්‍රවූ සිලිල්පිරි සිහිල්වූ ඇඹුලුපුල්විලුත්නැත. කිම්ද? නරනින්ද මා කියනුහිමි තුමාගේ මූදනපලදි සුපුල් සුනිල්මහ නෙලුත් නැත. භ්‍රමර කුල භ්‍රමණකොට නාද කොල හලකරන පළොල්සල් කිතුල් දෙල් කෙහෙල් පොල් නොඑත් නැත. සමරබිම අසුරුම්ද තොමඳවැලි තෙලිනුදුල තමල්මල් උකුල්පුල් ලපලු හෝපලුත් නැත. අමෘතජල හරිත ඵල භාර යෙන් අමෘතවූ මධුරසගකාරසනනීරමෝරපළත්නැත. නිභෘත පල කුසුමමධු ගන්ධයෙන් යුක්තවූ පුගපුන්නාගාදි මල්තුරුත් නැත. ලම්බමානප්‍රවර විටපක්ශලයාකුල නිම්බජම්භාමු ජම්භාල ඵලතුරුත් නැත. ජෘම්භමානාවලී විජරාව අභිරාම වූ සම්භ

---

* "මෛනාකයෙන්" මුද්‍රිත.

රම්භාවලී මධුරපලතුරුත් නැත. බොහෝකොට උයන්වන නැසූ
ලෙස කියනු කිම? අහෝ එක ගසක්වත් ලෙසක්සේ නැත උයන-
හිමව් පව්වෙතින්* සෙද අවුත්බැස මහත්වූ සදත් කුල මදැත් කැළ
සැපත් තුඟු බෑහත් ගිරි පෙළක්මෙන් එලාතුරු තලා බිඳ තමින්
හීය තැනක්මිස විතරකුත් වෙනලෙසක් නැත. තොසක් පමණ
කුත් හිමි බසක් නොවදරමින් බලා වැඩ හිදින්නේ කිමෙක්දැයි
කියන සිත් ඔහු බසින් කිපිවිසින් උදහසින් තද රොසින් ශ්‍රීහස්ත
පිටතුබූ එකගපත අතරගෙන මූණයම්ට තුළට වදිනාවිලස වලිත
කොට මඅතකගවූණවෙතට ඇතකුවත් පැමිණිවිට දෙකඩ කොට
හරිනමට මෙතා මඟුලුයනුපුට ගියහිදූන් උෟරකුට කියයි මා
නීවටකොට අනිස කොළ තමාහට මබල නොදැනෙදූයි සිට කියා
ශගත සෙනහගට දඩයමට යන ලෙසට බෙරලවා නුවරවට බඩිග
කොදණ්ඩශර ශකතිතාරාවස්න ඛඩ්ගවෙතාලිකා කුන්තමුද්ගර එර
ශුවූනඳුහාස චක්‍රායුධභින්දිපාල ප්‍රභෘති විවිධආයුධධරා දිගලුකර
විමලමණිකවචසන්නාහසන්නද්ධ යුද්දක්ෂවූ† ප්‍රබල සිවුරඟසෙනඟ
සමඟකැර පටුපටහ දුන්දුභි මුරජවඩකමදීලපණවතාලකාහල
ඩමරු මඩ්ඩුඩිණ්ඩිම ශුෂිර ශංඛ ඣර්ඣර ඝනඣල්ලරීතාල ප්‍රවර
වෙණුවීණාමෘදඟාදීතූර්‍යනාදඝොෂාදියෙන් යුක්තවූ පසඟ
තුරු පෙරටුකර තිරිඳුසඳ පුගත් සැඩ නලිතිපිල මහත් සත් සයුර
ගොඩ ගමන්ගත් විලස් දක්වමින් ගොස් උයන් වැද උපුට ගස්
සාරමින් දෙපිටපස් පීරමින් අවට ගල්බේරමින් වපුට සල් රූර
මින් එවිට විල උෟරමින් කවටකල ලෙසක්මෙන් නැසූ ඒ උයන
දැක, දුටුව විදිනා ලෙසට කැටුවගියවුන් අවට සිටුවමින් නියොග
කොට තුටුව නරනිඳු එවිට කොටුපතෙහි එවෙත හිට බැදී ගසා
විම්සන්ට වැදිදනන් යැවූසඳ ඔවුන් එන එසොල්මන් අසා තම
ඔත්පලින් නැගී සිට රතැස්වට නෙරවමින් දෙකන්පොතු බූරව
මින්‡කෙසරුකර බුරවමින් මහත්කොට ගොරවමින් නැගිට බිය
කරවමින් වෙතටපත් සවුල සූකරා දැක, එවිටඒ භූපතී නියුණු
දිගු පුළුල්වූ කරල්හි යක්අතට රැගෙනසෙද ඇදය මැඩ නබයපිට
නටවමින් හැත්කවා උරපුරා ඇදනරා සයෙන්විදි සැරයවළ
හමින්රජු මූදුනතින් පැනගොසින් සෙදනුවරවැද, උපුට සෙල්
කමල්පුල් සිලිල් පිරිඅගල්ගල් පවුරු බිඳ විසල් වා සල්තොරන්
ගෙවල් හිවි මහල් මාලිග සභා මඩු ඉලංගම් ඉඩම් කුඹම් මඩම් වීපී
වින්‍යාස හස්ත්‍යශ්වශාලා වනසාලා එයිනෙපිට පැනදිවන ඔහු
නොහැර ලුහුබඳවමින්, තුඩගවන මහිෂයන් ශෘඞ්ගයෙන් හඬග

---

* හිමළපවෙතින්-මූදින. † යුඩක්ෂම. ‡ දෙකන්තල උරවමින්.

කළ භෘඞ්ගසඞ්ගීයමාන ප්‍රවර පඞ්කජල පඞ්කජාකුල විලින් රඞ්ග ශෘඞ්ගාරවූ ග්‍රාමනගරාදියෙන් ශඞ්ග ශ්‍රී රඞ්ග භූමිමඞ්ගලාවාසවූ නගරනගරාඞ්ගධජශඞ්ගවනඅඞ්ගනාවන්ගෙ රතිසඞ්ගමෙහි ලිඞ්ග* කල අඞ්ගවූ භුජඞ්ගයන් වසන තිති වංගෝණ්ඩුවට පිවිස, එයින් ගොස් දුෂ්ටවන රිෂ්ටවන වරණපද ඝට්ටනෙන් විෂ්ටකර නෂ්ට කල රිෂ්ට මඤ්ජිෂ්ටවන අෂ්ටමින් ගොසින් විස්පෂ්ටව නාදපරපුෂ්ට යන් අසා සන්තුෂ්ටියෙන් කෙළින දිය ලියන්නෙන් පුෂ්ටවූ කුෂ්ට ෂ්කොෂ්ටාරූ නම් ගහන් පැන සුගන්ධ තල සැපත් ගිරිකුලක්මෙන් චණ්ඩවූ ඛණ්ඩ †දණ්ඩනීතියෙන් නිදණ්ඩනයකර ජගත් මණ්ඩලය යසරැසින් මණ්ඩනය කරන භුජදණ්ඩයෙන් විමත නෘපෂණ්ඩයන් මණ්ඩලෙශයන් සොඳ කෙළින තිති ඛණ්ඩකල හෙණ්ඩු කෙළි ෂෂණ්ඩුවලිපුරව බැස එයින් ගොස් පුල්ලමල් පල්ලවෙන් පුල්ලවන තුල්ලගම් ඇල්ල ලෙල වැල්ලතල බිල්ලවන සල්ලකී පුල්ල දෙඹගොල්ලකින් යුක්තවූ දුල්ලකල කල්ලකුරවිවිශටවැද පාඬිරද දනව්වේ රුපුන්මන් නොලංකළ තුවූදන කලින් කිය තමන්වෙත එලංකල දළින්සක් අලඞ්කාරයෙන් විලම්කුලමටත් වැද, සුපුල් පුල් මාවිලින් සාරල්කන්නේ ඇළින් කිසල් මල් බෝ වලින් විසල් තුල් සාශලිය් එපිටගොස්, යුත්තු හිමසාරසෙ යස පත්තුකල තෙදිගුබිත තුත්තුකුඩියට පිවිස, තන්දිගින් ඔසළ මොළ වඤ්ඤසතුරන්ගෙ මත් බිදීමෙන් සන්දිවල බැන්දිදද ඉඤ්ඤිරා** වාස සරු බන්දි මුද්දිමඤ්ඤ†† නම් ගමින් ගොස් ඒ ඌරු මාලූරුකෝලපට්ටනම් වැද, ඌරුවෙස් දක්වමින් මහත්කොට උක්කමින් තමාබලවික්කමින් ගොස් වලලිමුක්කමින් යානොහැර දුක්කමින් ගොසින් කිලක්කරෙන් සරිය එනරදුට සෙද දිරියපාමින් නොමද පිරියකරවන පබද පෙරියපව්ව නම් වැද එවෙන විල්පල්ලමින් ගොසින් තුරු සොල්ලමින් එකල බිම අල්ලමින් බිදැර පල එල්ලමින් මුහුදු බිස+ සිල්ලමින් ලොල කලෙලාල ඓනාවලීපාලියෙන් සලෙලදුල සකොලහල සිදුසිලිල් මදීනය කරවමින් ගමන්ගත් නැවක්මෙන් පීනමින් දිව ඌරා බලා සෙසු සෙනඟ රඳවමින් රිද්දිලත් මලසරද කින්දසිරිසඳල යන එතුන්දෙන අතින් දුනුදඹු රැගෙනදිය සැඩින් ගොස් කඩින් කඩ වතලරල උඩින් පැන නෙබුය දිවසිය්බඩින් දිවන ඔහු සමග සෙද අවුත් ඌරාතොපින් ගොසින් සාපාපවුස් වෙතිය මීපා වෙනිය ඇවිත් උප්පාරුවෙය ගොසින් ඌමිනිරිරෙණ තුවින්

* ලග †ඛණ්ඩවූ-මඩන-මණ්ඩවූ ** ඉඤ්ඤිවරා ††මුණ්ඩක +බැස.

තොපිත්කිළිම්බිණ්* ගොස් වෙයින් ගල්බසින් පැන අවුත් රන්
මැල්ල ගාමුවැල්ල තම්මැන්න වනමැදින් සීගිරිය සෑගිරිය උල්
සවිස ඔසිනෙතර බැස ගිමන්තරු පොළොන්නරු සොඳුරු
තෝපාවැවින් විත් සාගල්ල† ඉහවැල්ල වනපල්ලයෙන් මූලා
නොව තලන්ගොඩ‡ ගරායක්** නොවින් මෙගොඩ බැස ඇල
සරින් මිනිබඑව අබසයින් අලුවෙහෙර බලා ගොස් ගුරුළුවල
කඩින් බැස අවුත් මාවන ගමින් මහත් අත්තරගමින් ඇවිත්
කුළුගම්මනින් පාළුපැලවකඩින් මඩගල ග්‍රාමයෙන් පිවිස උඹරා
පොලට සබුඩුමුඩුගිරියවැද අතලගල වෙතින් ගොස් කොත
ලගල බලාසෙද බතලගල අරණවැද ඊරිඋඹරාගලට පිවිස එහි
උඩුස්ගිරි සමස්ගිරි වෙතින්+ බැස ලග්ගලෙහි ලග්නොවී
ලොග්ගලත් ඉක්මගොස් මරුගලත් සරුනොකොට කැරගල
වෙතින් ගොස් රිවිගෑලති සිටිකලට ගල්දෙන ඇලදෙන ඊපා
න ලක්ෂපානාදියෙන් වෙතටපත් පක්ෂවූ දක්ෂ වැදි දනන් ගෙන
එසින් ගොස් අරම්රම් තරම් තම් ඔහත් ගම්පල වෙතට අසුර
සුර නර උරග නිකරකර ප්‍රවරතර තඹරකර නිසරකර අරුණ
පියකරන†† මුනි සරණ මිණි කිරණයෙන් තරුණවූ සමන් කුළු
කිරුළු දුරු මෙලඞකාලිය පවර අලඞකාරයට උර පැළඳි
මුතුපටක්වන් සළුර තලමීන පාසීන ශතවඞක කුම්භීල රොහිත
ශඞඛුඅමරමුඤ්ජා ජලුකා ප්‍රභෘති මතස්‍යකතස්‍යපාදී විවිධ ජලචරා
කුල ශිශිර වාලුකා ඇති මහාවැලිගඟිනෙතර බැස උපාසින් එපා
සින් හොමුපෙළින් එපිට ගොස් මලයරද නොහැර ලුහුබඳවමින්
පිවිස වනවන්තාන සුවඳ මුවරඳ වහන සොඳුරු තුරු සන්තාන
දිමුතු මුතු අසුරු වැලිතෙලෙන් සොබමන් තාන සුසැදි වැදි
දනන් ගෙනගොසින් වැද සන්තාන ජම්බුල ජම්භීර සහකීර
බර්ජුර යුත් රමහ ජම්භාල හින්තාල තාලීශ ශතකිඤ්ජකාරිෂ්ට කාර
ක්‍ෂුජ මාලූර සත්සිඤ්ජ වාරාදි සහකාර තාලීස පත් පාටලාශෝක
ගිරිමල්ලිකා යුග්මපත් සපතලා මාලතී මාධවී පුෂ්පවත් භෘඞග
ගණ මුඛර ඣඞකාර නාදයෙන් යුත් බෘන්ද මන්දුර මකරන්ද තුරු
සැදුම්ලත් තුඞග නිර්ඣරාකුල ශීතලෝදක මහත් පඞකජිනී හරි
න තෘණ අදිනටයෙන් ලසත් මත්ත මාතඞග ගොකණ්ණ වෘෂ කාඞ
මත් රක්තසාරඞග ශශ චමරමෘග හරිණ යුත් ප්‍රඵුල්ල කිඤ්ජල්ක
සඤ්ජනනාවූ කමල් නිල් උපුල් මල් ලහෙල්මැලි ඇඹුලුපුල් නිල්
සෙවෙල් පිරීසිලිල් වනවිලින් නිතිසැදුම් ලත් මහත් වන සිරි
නොරැඳැ× ගොසින් එහි අසල්වමනිසල්වූ විසල්ගල්කුළක් මෙන්

* කිලිවෙතින්. † සෑගල්ල. ‡ තලාගොඩ. ** ගැරුයක්. + වෙතින්.
†† තරන–තරණ. × නොතැද–නොතුද.

ලංවසිටි සථූල සූකරා දැක, එවිට ඒ භූපතිහු පුළුල්වූ කරල් හීයක් විද්දකල්හි ගල්වසිටි සූකරාදැක මිලානිකවෙලා සිටි මලතිරිඳු දැක සුරිඳු සුරපුරෙන් බැස, කනක තාඩඞ්ක මණිකනක මුත්තාභරණ රත්නපට හස්තවිභූෂණ අවුල්හර මෙවුල්බර නූපුරාදි සිවුසැටක් අබරණින් එමලතිරිඳුන් සරා ලකුළු මිණිකිරුළු කුළුමුදුන ඔහු පලඳවා පසක් සක්දෙවිඳුලෙස මෙලක්දිව රකින කැත්රජුන් සිය ඇසක්සේ රකිනලෙස ඔවාදී සුරපුරට පැමිණිසඳ, මලයරද විශුද්ධාචාර ගුණරත්නසමුජ්වලිත තිනි සුබුද්ධාගමෙහි අතිවිචක්ෂණ දනන් ඇති විරුද්ධාකාර මහ ශත්‍රු'හඞ්කාරගති නිරුද්ධාධාර භුජ වික්‍රමාර්ජිත තෙදැති ධනුර්ධාරණයෙහි අතිශූර යොධයන් ඇති සමෘද්ධානුරාධාඛ්‍ය ප්‍රවර පුරවරට උතුරුදිග සොඳුරු මුවරදිනුදල පුෂ්පඵල එල්ලෙවෙන් සැදුම්ලත් භ්‍රමර රැව් නෙකොලහල කමල කුවලයාකුල සිලිල් තලවතලසරසියෙන් තිනි සැදුම්ලත් ථූථල මඞ්ගල්‍ය උද්‍යානයට ගොසින් එහි මණි කනක රජතතාරකාවෙන් ඛචිත ශුභ පුෂ්පදාමාවලම්බිත ශුභ්‍රචිත්‍ර විස්තාරවූ වියන්බැඳ අති සුරභි මෘගනාභි ගන්ධයෙන් යුක්තවූ චන්දනාලෙපයෙන් ශීතලාමොදමණි සවර්ණසන්නිභ භූමිභාගයෙහි විවිධ පුෂ්පොපහාරයෙන් ලඞ්කාරකොට කලස වින්‍යස්ත වෙදිකාවෙන් යුක්තවූ රඞ්ගමණ්ඩලයෙහි ධවලාතපත්‍රයෙන් යුක්ත රත්න සිංහාසන අරා දිව්සරා පිරිවරා උන් සුරාධිපවරා පුරඳරා ලෙස එපඹුවක්තිරිඳුදැක සාක් යජුස් සාම අථර්වන් වෙදයෙහි නිපුණවූ බමුණු දෙදෙනෙකුට සවිශෙෂ ආවෙශවූ විලස් දක්වමින් තිස්සයක් වැදිමුළුත් සමග නෘත්‍ය දක්වමින් රජු චිත්තසන්තොෂකරවමින් දිව්දෙශ නිර්දෙශකොට කලක් තව මේලක්දිව රකින ලෙස සලස්වා ලොකශාසන දෙකට මහත් අභිවෘද්ධි වඩීනයකරන ලෙසට දූත් සවසමයාණීව තුඞ්ග මෙරුගිරි රාජවූ සුසමයාධාර ගුණරත්න අභිරාමවූ විෂම නෘප තිමිර සංඝපටල බරකිරණවූ භාසුරොදර දූනයෙන් හරමිත්‍රවූ මත්තගජ දූනදෙන රාජාධිරාජවූ භානුකුල කමලවන සන්තුෂ්ටවන මිත්‍රවූ භක්තිජන චිත්ත කුමුදිනී ශශිරාජවූ සුගත පූජා පුරන්දරොපම භක්තිඇති විගතපාපාරි බලභද්‍ර සමශක්ති ඇති වීර වික්‍රම ප්‍රමූල තුඞ්ග බාහුවෙන් තිති පැහැර අක්‍රම රුපුන් වීර ලක්ෂ්මිය දූරු නැර යස චක්‍රවාලොදරෙහි පිරුණු තිති සාර සත්ක්‍රමාදී රාජකුල රත්නවූ ශ්‍රී පරාක්‍රමබාහු රජතුමාණන් කෙරෙහි කුළුණු මෙත් සිත් වඩා වැඩසිතින් ශත්‍රුභය රොග විස බිය දුරුර යසස් තෙද අණ විකුම් බල දිගා සව්සිරින් අභිවෘද්ධිවඩීනය කැරැ ශතාධික වර්ෂ කාලයක් නිතිගමියෙන් සව පමිත් ඇමතිදන සමඟ සසිරිබර මෙසිරිලක රකිත්වා රකිත්වා රකිත්වා.

# සිහබා* අස්න.

**සවසනී** වර අම්‍ෘත කරරුද්‍ර හරඅද්‍රි ශරදභ්‍රමය ශුභ්‍රතර ඉන්දු නිභ ගඞ්ග සුරකුන්ද හිම සඞ්ඛ හෙළ ජත්‍ර දකීවිත්‍ර යස විස්ඵුරිත පත්‍ර ශත මිත්‍ර වරගොත්‍ර තිල මිත්‍ර මණී ශත්‍රෘ වරගඝතී මෘගරාජ ගිරිරාජ ධෘතිරාජ දිනාගකති ජනනීජ සුර්රාජ කුල ප්‍රණත නර උරග සුර අසුර ඛග ඉන්ද්‍ර ව [illegible] නිද්‍රෘ ති‍ණ මකුට මණී භ්‍රමරගණ භ්‍රමණයෙන් ජවලිත [illegible] වරණ අරවින්දයෙන් උදිතවූ මනුජවර ප්‍රවර්ධිත විවිධසැප සුරද්‍රෑම සිරින් සව් සතුන් කල පිණින් ලොව ජනිතවූ දහම්රජතුමන් සහ චක්‍රතර වික්‍රමෙන් රුද්‍ර අක්‍රම රුපුන් මදීනෙන් විජය ලැබ ශක්‍රසිරි රැගත් තිහි චක්‍රවාලචක්‍රවර්ති මහරජුන්හට නිවෙස්වූ බෘහත් සව්සිරින් පිරි මහත් දඹදිව්තෙලෙහි දිමුත් වගුපුරෙහි ඌල් කමල් පුල් සිලිල් පිරි විසල් තුල් අගල් සිඛ චක්‍රවලයාකාර සුධා කර්මෝපචිත සප්තරත්නාදියෙන් චිත්‍ර විස්තාරවූ ප්‍රාකාර ගොපුරවාරාදී කනකරජතෙන්ද්‍ර ස්ඵටික හිත්ති සනාථ සොපානමාලා ඡදන අග්‍රාවලම්බමාන ප්‍රවර මුක්තාලතාකුලිත මන්දනිලජ්වලිත ස්වර්ණමණී කිංකිණීක රාවමුඛරිත ධ්වජ ප්‍රාසාද පඞ්ක්ති ශත නිෂෙවිත විරාජිත විවිධජනවරාකුල කනක මණී සරාකුල විපුල ආපණනිලය වීථිවින්‍යාසාදි යුක්තවූ පාද පඞ්කජ ගෙම්ණි සිළු යුගම දහලකුළු කනක රම්භාකාර වාරුරු ස්වර්ණමණී මෙඛලාභරණයෙන් විභුෂිත පුළුලුකුළු මූව පුණ්ඩරීක මධු බින්දු සනනාථයණහි ලොල්ව ආවර්ත කුව තුණ්ඩයෙන් යුත් සරත්චන්ද්‍ර බිම්බොදයෙව් ප්‍රභාත [illegible] කුවල දල දිගුපුළුල් නෙතිනි දුල් සුර සුන්දරී සදිසි පුරඞ්පුර සරන තිසි [illegible] සුසැදි උදල් සිසිර පූරිත නීර ජලනිධි [illegible] රාජීව ශුවිප[illegible] ශශිප්‍රිය කෛරව සෞගන්ධිකාදී නෙක පඤ්චපද්මොත්පල සුපුෂ්පිත කණිණිකා මධුබින්දුයෙන් මුදිත ඣුඹුඣුමුරව භෘඞ්ග ඣඞ්කාර නාද පිය රැවින් යුත් සුනිල් දිගු මුදු වරල් සෙවෙල් නෙත් නිල්උපුල් කමල්වත් ලිහි නිවිල් මෙවුල්බර දුවන් තුඞ් පුලිනතල ලකල්තන රතහසුන් තිමල්රල සළුපිරින් වසාසිරි ලකල් වන පුරඹුල් සිංහ කෙශර කණිපූර චම්පක නාගකාරමහ කණිකාර කරවීර ඛර්ජුර [illegible] ස්ඵුල තෘණසුල ත්‍රිපුශඛ† මාලතී මල්ලිකා කත්රී කණ්ඩලා සප්තලා ජීමුත එහිවලලි රඤ්ජනාදී නොයෙක් නිත්‍ය ඵල නිත්‍ය පුෂ්පාමොද ද්‍රෑමලතාශතසහස්‍රාදියෙන් උද්ගත විරාජිත මදපඞ්කයෙන් කිලුටූ කපොලස්ථලගලිත භෘඞ්ග සංගීත ධූමාවල්‍ය

---

* සිංහබා—මූ. † ත්‍රිපුශඛග—මූ.

වලම්බිත තුඹග දක්ෂිණ දන්ත සිඳුරබිඳු සඳෙහ මුඛමණ්ඩලෙන්
අවනිතල සතහසිටි තුඹග ගිරිමෙඛලාකාරවූ මත්ත මාතඞ්ග යූථ
කණ්ණපටලයෙන් තිහි හමන මද පවන් විඳ ගිමන් දුරුකර වැජඹි
දිගන්තර ගතුන් ගෙබි ඇතුන්ගෙන් සමන්විත පතනඋත්පතන
ඛුරසමීරණෙන් නැංග රජනිකරකර අරුණකර සැඩකිරණ වැඩ
එපුර ගගනතල නිබඳ බැඳි වර්ණ ලෝහිත චිත්‍ර විස්තාරවිතානෙව්
දුටන් මන් සතුටුකර මඳුරු මත් පහරලැබ උලැහි තුහු තරඟරඟ
තුරඟසෙන් සැදි එපුර ලම්බමාන ප්‍රවර ස්වර්ණ රජතාදියෙන් ජව
ලිත ධ්වජපඞ්ක්තියෙන් ඉඳු ධනු විද්‍යුල්ලතා ප්‍රභාවිස්ඵුරිතවූ
ඡදනමස්තකෙහි දිසි තෙම්බී කොත්පෙළින් සැදි ඉඳුකුඳ ප්‍රභා
විභාසුර තුරඟයුත් ප්‍රවර රියසේනඟ සැදි මෙවරිගජ කුම්භපුට
පාටනෙන් ගිතසාල සිංහ වික්‍රමොදිත විග්‍ර අසිපත්‍ර තවි හස්ත
මුණපිට තුලට වදිනලෙස වලිතකොට කුන්ත තොමර චාප වජ්‍ර
චක්‍රාදිවූ විවිධ ආයුධ රැගත් ප්‍රබල යොධයන්ගෙන් සැදුම්ලත්
නිඛිල නගරාඞ්ගශ්‍රීයෙන් සමුපෙතවූ ප්‍රවර වඞ්ගපුරවරයෙහි රවිවංශ
වරතිලක රාජාධිරාජවූ රිපුකාන්‍ත ත්‍රිවික්‍රම තෙජොභිරාමවූ තිහඅංශ
තනු රූප නයනාභිරාමවූ මෘදු මඤ්ජු චිත්‍රාභරණ රාමණීයවූ
රණහඬග මිණිකිළිණි දෙන පාරිජාතවූ භුජ මන්දිරප්‍රවර ලක්ෂ්මී
නිවාසවූ එ වඞ්ගරද තේසක් සිව්පා සනග දශරාජධර්මයෙන් එපුර
ජනරඤ්ජනයකරන සඳ සිහිඳු මුදු පුතිල් දිගුවරල සිකිපිංඡ සුබා
තරිඳු අඹතලළ පටුගනන රනකුස තිබා පුබුදු රන්පියුම්වන
දුටන් වඩවන ලොබා කුඹුදු මුතු දසන්පෙළ අදර රතිනුප්පබා
නෙතිඳු වරකුමුකු ගෙලෙ දෙතනනසනෙව් පබා පසිඳු බුජ සො
වුන් ගගසලා සිරිසරනැබා කිරිදුනර මටසිලුවු උරුයුගල පැල
රඹා පුබුදුනු නැඹිලිවල් කන්ඩිදුනුකේ සුබා සිරිදුරුදි පුපිපි රත්
පියුම දෙපතුල් විරාජිත බද තුනුරුවින් යුත් සතන් කලඹන
සොබා කලිහු රජදුවක් අගබිසෝ කනතුරු තබා සුරිදුලෙස එ
වඞ්ගරද වස්ය සව්සිරිලැබා එරජතමගීතුසෙහි අමිත යස පුණ්‍ය
සඤ්චිත ධීගෘ රත්නයක් ජනිත සඟ්හාතුෂ්ටියෙන් ගර්භමඞ්ගල්‍ය සප්
තාහයක් පවත්වා ස්ඵටික මඤ්ජූෂයෙහි කනක බිම්බයක් මෙන්
දසඑනඩමස සපිරිසඳ වලාපටලයෙන් නිකුත් සසඳරසිරින් දිමුත්
එබිසව කුසින් කුමරි බිහිවූසඳෙහි වෘත්තචූඩාකාලතා ප්‍රතිබඩ් ධව
ලාතපත්‍රයෙන් යුක්තවූ ස්වර්ණ සිංහාසනෙහි උදය ගිරිශිඛරපත්
තුරුණු රිවි මඬලමෙන් ධූයමාන ප්‍රවර සෙමෙර මංගලායෙන්
සුරඹුරු වරඹදෙන සිතිඳුමුදු පවන්විඳ පසක් සක් දෙව්ඳුමෙන්
නිරිඳු වැඩ ඉඳ එසඳ වෙදත්‍රයෙහි නිපුණ බමුණු වෙත ගෙන්නවා

ඝබාපුව ඇසූසඳ සලා බොලුපයි එතන බලා සබි අසුබ දූත දූලා
එබිසෝ තදහ කලා සපිරුණු සඳෙහි වලා මෙපුරෙන් ඝොසිත
වෙලා මිගිදෙකු සරණ ලොලා වැජඹෙයි නිතින මූලානොව කිවූ
මෙදූත ඇදුරු කීවදන් අසමින් එම්හිපල් ලවා ලපිරු සොවගින්
විමසමින් තැණින් තුල්ලවා සොඳුරු ගුණ වික්‍රම්ඇති දක්‍ෂමැති
දුන් ලවා විදුරු ගිරිබිතයෙ තුහු පව්රු සුවිපුලලවා අතුරුනොව
තනවිගත් ශොබිළ රුකවල්ලවා මදුරු සෙල්මුදුන සක්පුරය
මෙන් දුල්ලවා සොඳුරු එකපාවිමන තනා වෙපුලලවා මිතුරු
කුල කුමරි කිරිමවුන් සහ එහිලවා වලාගැබතුලෙක වැද කලාපිරි
සඳක් ලෙද දූලා පලමලින් ගිනි දිනෙන්දින වැඩෙන රන්ලියක්
මෙන් සොළොස්වක් සපිරිසඳ වෘතොතාතපල වෘක්‍ෂමසනසොහි
සුපුෂ්පිත කණිකාර පුෂ්ප මධුලොල භෘඞ්ගාවලිරාජියෙව් දිගුසු
නිල්ධම්මිල්ලනිභ අභ්‍රකූටයෙන් දිසි අර්ධචන්ද්‍රාකාරලලාට සඵලිනු'
දූල පිවුමඳ පත්‍රයුග්මයක්වැනි භ්‍රෑයුග්ම පතර තිල කුසුම සංකා
ස තුඞ්ග අඞ්කුශ ඝ්‍රාණ දිගු පුළුල් නෙත් කණ්පුර දලයුගල අති
රක්තාධර රුද්‍ර පුෂ්ප පත්‍රයක්බඳු සප්තලා ජාලකාකාරවූ දන්ත
පඞ්ක්තියෙන් යුත් කඥපී රියවක්‍ර මණිකතන තාඹඹක තපනීය
මිහිගුවන් ලකල් ගෙල කඹරා සෘතමාල ජූලල දම්යුවල මොලො
කත් දුල්ල කුසුම සන්තතිභ හලිනී දිමූතු රත'තුල්ල කීරතුඩු
කරජ කවකුමහ රණහසතුල්ල නාභි ශතපත්‍රවන් සපදපෙල වසා
රොද ශ්ලිෂට සුවිශිෂටවූ පෘෂ්ඨ තපනී පුවරු මිටින්ගතහැකි සො
ඳුරු ලෙලෙන සිහිනිභ ලකළ යොවුන් ගඟ පුලිනතල ලෙසින්
දිසි පුළුලුකුල එරන්රඹ පැල සිරින් මටසි ටවූ ඌරුයුගල ලෙසින්
උලෑගුණු උතුරු සිඳු බුබුළු දනමඬල පහන්ෂිළු කෙතකී කුසුම්
යුග දහනිමල එපණිහිය රන්පලස් පෙළවටෙව් දිසි දළුති රත්
ඇඟිලි සපත් මුදු සිනිඳුවූ පාකමල මෙවන් තුනුරුවින් යුත් රාග
සාගර වෙරළ යොවුන් තව රජනීකර ජොතිමාලා ලකල ලෙසින්
රති අමෘත ජල සපිරි මහ ගඟ උදුල ලෙවන්ගට කුසළපල දූකුම්
රිසිකරඅමල ලඳුන් නවරුවන් මිණිවැලතරලම් ඝි වතළ මෙවන්
සව්සිරින් කැත්ලියන් තිලකෙව් නළලදිමූත් තුනුරුවින් නවයෞ
වුන් පත්වෙමින් දිව මතුරු දපතයට පත් නාමෙනෙවියක්සිරින්
නෙතිග් විසරකුත් නොමදූකම සලෙලුවන් එක පාවිමන තුළම
වැස අසා යෙහෙළියන්ගෙන් එපස්කම්සැප විපුල් අනුරාග තල
සැපත් මහහිමයකින් නිකුත් හස්තිබෙනුවක යුත් විලඹුවන් හැර
දිමූත් දිනිඳු අවරගට පත්සඳෙහි සතරගින්යුත් ඝනඅඳුරු මැද
දිමූත් විදුලියක සිරි රුගත් තමන් කිරිමවුන්ටත් නොදන්වා

යන පුවත් දෙරින් මහවිමන්වත් සොරා රැකවලුන්වත් නොසිත්
මහ වෙයට පත්වෙමින් රන්රජත මිණිතොරන්හි කැළුම් එළිබි
යෙන් සැඟවෙමින් අබිසරුව ගොස් එපුර වහස දෙරින් නික්ම
හුදකලාවම දුලා තුරුනිකර හැර කලාපිරිසඳක්මෙන් යනසඳෙහි
නොයෙක් බඩු රැගෙණ එන වෙළෙඳු පෙරමගටපත් එදිගුනතත
දුටුසඳෙහි ලොමඋත්කම්ණෙන් ප්‍රීතියෙන් ප්‍රමුදිතව තිසවණවත
කැඳවමින් වෙළඳදෙටු සමහ වැස ළඑරටට යනලෙසට දිමුත් සවී
සිරින් පිරි ගම්නියම්ගම් නොයෙක් ගෙවාගොස් සෙල්බැවල් ගිරි
දුදුරු යුත් විවිධ ජලවරා කුලශිකරාකාර ඝන ගජ්ජනඇතු ප්‍රති
බඩ ශීතලාමොද නිර්ඣරාකුලමත් මියුරු පිච්ඡ ආවතීත රහමණඩ
ලෙන් සපෘෂට අහස්කුස නිඃවලිත වෘතඃා මූලසකඛ පත්‍ර ඵලපල්ල
වෙත් වටවිටප සඤ්ඤනා සුපුෂ්පිත පුෂ්ප මධුබිඤ්ඤු සන්තර්පිතව
බමනමත් බමරනාද කොලහල කරන මහත අරණ්‍ය ගිරි ශිඛර
ශත නිෂේවිත භෘඞගාර කුරර සක්වාදි ශකුන්තානන්තරාව මුඛ
රිත මධුරනාදයෙන් යුක්තවූ තුඞග ශාවරුහගලිත හිත්ත මද ගිඟු
දන්ති දන්තයෙන් තුමූල තරුනිකර සාමඩුලු ප්‍රතිහිංසාකර රැඳි
මත්තමාතඞගහරිණ මෘගයූකාරාදී නෛකවිධ චතුෂ්පදිකායන්ගෙ
න් සමන්විත දිමූත් හිමවතට වැද බිසව සවගිනේ වෙළඳ දන
ලැගුම්ගෙන එදවසෙහි සිටිනසඳ දිමුත් සිරි එවන්මැද තරුණ
රවිකිරණ විස්ඵුරිත සන්නිහතුමූල සවර්ණ සිරිතලාවෙක විද්‍රැසෙල්
ගබීයෙහි දිමුත් රන්සුනින් හෙබි භූමියෙක අනිඳිත ප්‍රතිබධ
හස්තපාදදී සථාපිතෙණ් නොව් ඌනත්වයක් දක්ෂිණ පාශ්වයෙන්
සත්දිනක් සිංහශය්‍යාවකොට ඉන් නැසිට දිමුත් රන්නල්තලාවට
පැමිණ බෘහත්ගතඅඳුරුමැද ආලාතචක්‍රයක් භ්‍රමණකල විලස්පැ
වෘතෙතාපචිතව ඔබිනොබට ධාවිතයකර චතුෂ්පාදයෙන් සුසවි
රවසිට අශනිශත ඝන ගජ්ජනාරාව චතුර්විධ යොජනායාම විස්
තාරගත ගස්ති ගොකණ්ණ මෘග සූකරාදී නොයෙක් චතුෂ්පද්
කාදි වන සතුන්ගේ කණීපුට යුග්මයෙන් රුධිර ජලප්‍රවාහරුවා
මහත් අබිරු කෙශර සිංහනාද පවත්වා තමන් සිටිපියෙහි සිට
පෙරට යොදුනක්ද පැන එම අහස්කුසෙහිදී පිම්මවළහා ඇවිත්
තමන් කල කෙසරනද අසා තුටුවෙමින් සිට පශ්චිමය දක්ෂිණය
වාම පාර්ශවයද යන දිගත් එලෙසටම පැන තමන්බල විමසමින්
නැගී ගිරිමුදුනකට මහත් ඇත්මුලක් මැද ත්‍රිමදගලිතයෙන් උජව
ලිත හස්තියෙක් දුන අබිරු සිහනාදයකර කාලඛිරි කුලහපය්
දිමුත් ශිතිසෙනක්මෙන් ඔහුගෙ මස්තකය පැනා ශස්ත කබ්ප්පජ
රෙන් හස්ති මස්තක කුමභ පුටපාටනොචිත මජජ හක්ෂණෙන්

ඝන කෘෂ්ණ පූර්ණයකොට වංසකුමලාදී සීතලෝදක පුෂ්පවිසර්පි
මකරන්දයෙන් රේණු පිඤ්ජරිතව අරුණකිරණප්‍රභා විභාසුර පුලි
නපාල ලෑහැබි ලිය ගුම්බමණ්ඩපාදී වන ෂණ්ඩ මධ්‍යයෙහි දෙව්දු
නව නාග මොණර ලිය කිඳුරු රඟම්බුලුබාද රගනාටක බලබලා
සෙල්ලිදෙලෙන් ප්‍රමුදිතව සඤ්චාරණය කරන සිංහරාජයෙක් ඒ වෙ
ළඳු දැක මනත්කොට අබිරුචිකර සිංහනාදකොට ඔවුන් මධ්‍ය
යට ගොස් පැන්නාසඳ අසා ඒ සිංහනාද වේලඳ භය භීරුතව බිසව
හැර ගියසඳෙහි දෙවඟනකමෙන් දිලෙන බිසව දැක මුවින්දර
රාගසින්මෙමින් තර රුදුරු ගුණ හංකාර වෙගගැර දුරින්දුර
හීතිලද පසුන්කර වෙතට ගොස් පෙමින්කර ජායිකාශ්‍ර පිනින්
පෙර දෙදෙන සතුටුව ලතර බිසව වෙත එලංකාර දෙමින් ගෙලෙ
තියපහර ලපිරු තොාස් වඩමින් මහරු ගුණ අගවමින් එලද
වෙත කැදවමින් තමන්පිට හිඳුවමින් ගිරිලෙනට ගෙනගොයින්
එරගිසැපවිඳ පෙමින් නොගොස් ගොදුරට වෙහින් සත්දිනක්
වැස තිනින් බිසව ගිරිලෙනලමින් ගොයනලෙස නැනකා අන්
වකා සල දෙර නදින් එසිරද නොකාමයින් නැතින්නැත ගොස්
තොමින් උපනරණ ගෙනදෙමින් වසනසඳ මෙම ලෙසින් තමන්
සියකුල කොසරහනවත් ලොබනොහැර එගිරිලෙන වෙත පැනර
එන මහහරිල නොහැර දුටත් ගොදුරට ලොබැර තුනුරුවින්
මනනදේ දිමුඩු සුරඟන ලෙදේ බිසමගට ලොබබැදේ එපස්කාම්
රස විඳේ ලෙසින් ස ලපසදේ නොවෙන්වම ඇසලදේ මෙලෙස
පසුවෙනසදේ පෙරකරපු පව්සඳ සිහරදුට ලොබබැඳ දරුගැබක්
විය සාඳ එතැන්සිට හැමසඳ සිහිව මදුපිය නඳ නොමදවම දුක්
වැද වීය දෙළදුක් නඳ මිරිත්ගනාකි සොඳුරු සිනුවලහදලවියේ
ලෙසින් බදු මදකුසුම අඳර සුදුමැලිවියේ කසුන්වන් කැලුම සුත්
සිරුරු පඬු පැහැවියේ පසන් රසබොජුන් නිති වෑලෙසින් නුබු
දියේ රුවන් පියුමෙවී සුපිපි දියිඋවන මැලවියේ නවුන් සුන් බඳු
න් ගුරු ඇඹුලටද ලොබවියේ කුසුම් තුළු යහනකෙහි හෙවම්
නොව ප්‍රබුදියේ වරින් පිරිතොදුරු පියයුරන්පුඩු කළුවියේ පසන්
වන උතුම් රතිකෙලි ඇළුම් මදවියේ සවන් රන්හොබු මිණිබර
ණ නොම පැලඳියේ නිතින් ඉහ සළුව ලිහිලෙන් මිසක් නොහැ
දියේ මෙලෙස දෙළදුකින් උන් බිසව දැක සිහරදුන් පිවිස වන
තුර කැමියි පලාපල ගෙනදෙමින් සියැස ලස රකිනසඳ නො
ගොස් පිටනට වෙනින් සිතු පෙමින් දසඑකාඩමස සපිරිසදෙහි ගැ
බ මෝරමින් කමදවා බෙලෙන් නොනැවතම විළිපහරමින් නො
මද පින්ලකුණුසුත් මදු දරු දෙබින්නක් පැහැද දෙනුරුන්ගෙ

සිත්වඩා තම සිතු පෙමින් සුහද කුමරුවන්හට කවා බත් සත්
මසින් පබඳ ඒ කුමරුහට සිංහබා නම ලමින් දුලද එකුමරියහට
සිංහවල්ලී නමින් සොඳුරු සක්රුවනලත් එසක්විති රජුලෙසේ
රාම ලක්ෂමණන් ලත් එදසරත නිරිඳුසේ සොම රිවි දෙදෙන
ලත් පොරණ ලෙව්සත් ලෙසේ පෙම ලිය දලුලමින් වඩති කුම
රුන් තොසේ නොබැස එලියට කුමරු දෙදෙන රන් පැලලෙසේ
වැඩී කුමරිඳු සොළොස් වස් සපිරිසඳ දිනෙක සිහබා කුමරු
තම මවුන් වෙත ගොසින් විපුල් සුරතල් බසින් 'කිම්ද? පියසිහ
රදුන් ලෙස නොවිමූ අපි දෙදෙන' මෙලෙස ඇසූවෙන් කුමරු
මවුබිසව එබස'සා පවර මනුරාජකුල තිලක වගුරදුන්හට දවෙ
මින් වැඩි සව්ඉසුරුවිඳ සාරපු පෙර පවින් තද ඇවිත් මේ හිමය
මැද සිහරදුට අසුව ඉඳ දුන් විදිත වෙදුක් තද කියමි කෙලෙ
සහ මෙසඳ මෙමුත් වෙත උරම්සොද කිවෙන් මව්බිසෝලඳ අසා
කුමරුඳු එබස රුදුරු ගුණයුත් අපිස් සිහරදුට සරණ ගොස් සිටි
ලදුන් පෙර දවස් ඇද්ද ඇසුවා එබස් කියා එකුමරු තිදෙස්
පොදින් දිහිදුන් පබා වීකුම් උම්දුන් පුවා යයින් සොම්සන්නිභා
සතුන්කල බන්ලොබා රුවින් මදමන් ඔබා කුමරිඳුන් සිංහබා
මිහිඳු ගොදුරට ලොබා ගිය සඳෙහි වනගැබා සිහරදුන්හට
නොබා හැර එගිරිදෙර තබා පණස් යොදුනක් ගොසින් ඇවිත්
පෙරවරු ලෙඩින් තමන් බල විමසමින් එක්දිනක පෙර ලෙසින්
ගියසඳෙහි සිහරදුන් තම මවුන් නැගණියන් දෙළුරබිත හිඳුව
මින් පිවිස මහ හිමවතට රුදුරු යක්බූ පිසස් මහරු ගජ වගවලස්
ගැඹුරු ගංහෝ අපිස් අතුරු හිමබය මෙලෙස් කුමරු හසුනොව
එගොස් නුදුරු කතරකින් ගොස් සොඳුරු සම්සිරි තිවෙස් ලතර
පියසෙක උදුල අඹර මේ කුලෙක තුල නිතොර දන ඇසුරුකල
බමර රැව් නෙකොළහල තඹරසර ගිම් දුරැර නොහැර මඳනල
වතල සොඳුරු නුගතුරෙක මූල කුමරු එගිපැම්ණිකල එහම්වැසි
දනන්සෙද අසා පොරතුරු පබඳගොසින් සෙබලෙක් එපුරදිමූත්
බිසවගෙ ලකල් නුමුත් රජුගේ මසිල් එපුත් කුමරෙක් විපුල්
සෙනෙවිරත් එතනතුරු ලබා සම්සිරි මහරු එපුර වැජඹෙන
සොඳුරු ඔවුන්වෙත ගොස් සෙබළු කිවෙන් මෙම තතු සියලු
එබස'සා සෙනෙවි මූළු නුවර සරසවා සෙද මහත් මගුලෙන්බිසව
ගෙන්නවා තමන්වෙත විත්‍රවිසාරවූ විනානාභ්‍යනාභරෙහි ලම්භ
මානප්‍රවර රතන තාරකාදි නෛකවිධ පුෂ්පොපහාරෙන් උජ්ව
ලිත තුඞ්ග රඟඞ්ග රළපතර ගිරි එතිර ජවනිකා බැඳ කාලග වි
නාශසප්‍රජ්වලිත මණිදීපයෙන් විගතතම ප්‍රභාකර ප්‍රභාපූර සහායු
රු මඞ්නලය ද ණඞපෙහි තවරුවන් රැසක්පිට සිවුඑමින් දක්ෂිණාව
තීයෙන් යුතවූ ශංඛයෙන් ස්ඵටික මණිවණ් සීතලාමොදවූ දක
ධාරයෙන් අභිෂෙක ධරවමින් සැපපෙමින් දවසරිතසඳ ප්‍රවරත
රතුමූලබල වික්‍රමාර්ජිත සිංහරාජයාතන් ජූලලමල් පලලවෙන්
දුලලවූ හිමවතෙහි තුඞ්ග කුජර කුම්භ තැංග තටපජරෙන් හඞ්ග
කර තුමූල මොල භක්ෂණය කාලතුෂ්ටරාවයෙන් අසනිශත සතග
ජිතාතුලය විද්‍යුල්ලතා විභ්‍රමණයකොට තමාගේ සුරඹයුත් පියඹ
භා තුෂටසංසගීයෙන් එපස්කම් රසය විඳ නොයෙක් ලෙස

සොඳුරු සුරතල් බසින් මුව කමල් පුබුදුකර දෙවන මුවරද අමා
සුරත්නෙත් දිමුත් රන්විතෙහි පුරවා ඕබී ගිරිලෙනෙහිවැජඹෙන්
වයෙමැයි දූන් සිතාගෙන එගිරිලෙන තුළ පිවිස බලා ඕසවුන්
නොදුක ගලා කඳුලැලි දෙනෙත වෙලා ගිනි ඇවිලගත මලා
තික වෙමින් වතබලා වැනෙමින් දසත කිසාල මගෙ දෙදරුවන්
ඕසව දකිමුද නෙතින් නොකළකම් කළ බැවින් උනේ මට දුක්
තදින් සකල හිමවත පවිටු සතෙක් නැත මාලෙසින් මෙකල තිරි
සන් කුලෙහි ඉපිද පෙර කළ පවින් ලකළ තනුරුවින් යුත් කුල
ඝතක් ගෙන ලොබින් කිකලවත් නොකළදේ කෙළෙම් ඉන් දද
බැවින් එකල පෙර කරපු පව් ඉතින් අත්පිට දිටිම් වෙළෙන්දන්
සඹගයන ලියක්දූකලා වනේරුවින් උන්දූලට අසුවෙමින් සිත්
ලොබයෙනේ පසන් දෙවතනකවත් එළද වෙත කරසෙනේ ලො
බින් උරපිටතබා ගෙනඇවිත් ගිරිලෙනේ උනිම් කම්රසෙහි ලො
බකර සුතිර දෙයමෙනේ ඉතින් දූන්අපකුලෙහි සිහරදූන් දුවූතැ
නේ ඔවුන්මම් මුණ කෙලෙසක බලම් දෙවියනේ ලියන් තිරතැ
තිබවත් නොදූන තිරිසන් සඳ සියෝනැ මිතුරුපෙර අඹුවතුන්
නැතූ මෙදූ පයොධර රනහසුන් සිඹ ඉඳිම් කවරදූ උන්වියොගය
උනේ සිංහබාලන් සඳ එසිරද මෙලෙස වන සෝකියාවැද හි
මේ නොයෙක් ගිරිදූදූරු තුරු ලියමඹුලුවල බලා එවනතුරු හිමි
වැළඳි ලීයලියන් ලෙලෙන අතුඅතින් සාමුව සුතන් වැළඳගෙන
කියන සුරතල් තෙපුල් බිඟුරුවින් මුමනගෙන දසත මුවරද සුපු
ල්මල් වතින් බබළමින තිබෙනඅමපල දිමුතු පියයුරත් යුනනදන
දිගු සුනිල් නෙත්දලග වැහෙන පිනිබිඳු කඳුළු කොවුල් කුල්
තද ඝඩින් හඩන තුරුලියන් දූක තොලත් සිත්පිත් පමණ ම
දුක් දූක හඬනකල දිමුත් මගෙ පියඹහැර කෙලෙස වැවෙම් මෙ
වර මෙලෙස තෙපුලෙන් කෙසර සොයනසඳ එගිමතුර හෙළ
වලාකුළු වැළඳිසළු මුදූ දමමිනේ දුලබලාවැල එමුතුහර කඩා ඉසි
මිනේ පුලපුලා රඟන සිකිපිල් වරල් මුදමිනේ ගලගලා එනගඟුල්
හැළි කඳුළු ඉසිම්නේ බලබලා සිහරජුගෙ වි: යෝදුක් නොමදිනේ
මලමලාතික ලෙසින් හඬන ගිරිලිය වනේ සුනිල් දිගු මුදු වරල්
සෙවෙල් දිගු රොදවසා උපුල්නෙත් සාමල්වත් සුදුල් මුවරද හසා
නිමල් පුළුලුකුල් දිසි පුලිනතල වනතොසා කොවුල් මිණි මෙවුල්
දම් පැළඳ ගෙබි මැදදෙසා විපුල් තනහසුන් රළයළුපටින්වසවසා
ලකල් විල්ලඳුන් තිති වැජඹි මේවන තිසා නිමල් මගෙ පියඹ
සුත දුටොත් කිය නොවලසා මෙසේ වනසෝ කියා ඇවිද හිමතැ
නතැනේ කෙසේ මෙවියොග ගිනි නිවනු මම දෙවියනේ ඇසේ
නිදිනොලැබ රසබොජුන් නොමබුදිමිනේ අසේනිව ගොසින් එක්
පසල්ගමකට බැසේ එගම්වැසියෙක් හමුව ඕයෙන් ගිය ඕසව්තතු
කිවෙන් ඔහුයවා සෙද එපුරවර අවටසැදි දිමුත් ගම් නියම්ගම් ද
නව්වල ගොසින් පැන අතරමින් දිගන්තර ගුගුරමින් තමන්තද
කර ගොසින් සවන් ලෙහෙනුතුරමින් සතුන්දිවි වනසමින් නො
මින් බියකරවමින් මෙවන්ලෙස සිහරජුන් කෙළෙන් ගම්වැසි
ගොසින් එපුරදෙර මහත්වූ එකොලහල කළසදෙහි- ඌදයහුඩර

ශිඛරයෙන් උදාවූ තරුණඅරුණප්‍රභා විභාසුර ප්‍රභාකර නිභාමිත
කනක චලපත්‍රපත්‍රයෙන් *චිත්‍රවූ ඡත්‍රයෙන් යුක්ත සිංහාසනෙහි ල
කල්තුනුරුවින්යුත්තිමල්කල්උපුල්වන් සුතිල්දිගුනුවන්බිඟුරදුන්
මුවකමල් දෙසයොමා දෙන සෙමෙරමද පවන්විද පසක්සක්විලස්
ගෙන නොයෙක් මැතිවරන් පිරිවරා වැඩහුන්දළුසඳ දනව්වැසි ගුගු
ළහඬ කිමෙක්දැයි ඇසූසඳ මහත් හිමවතින්විත් සිහරජෙක් දන
ව්වැද නොයෙක් සව්සතුන්දුන් නැසූලෙස කියනුකිම?අමිත භව
භොගසම්පත්තියෙන් යුක්තවූ වෙළඳ ගොවි බමුණු මහසාරකුල
ශත්‍රැහට විටප විධ්වංසනයකරන හැම ප්‍රවරතර යොධභටයන්
සමග කුවකුළහ මධ්‍යගත හෙම මුක්තාලතාමණි කනක මෙඛලා
භරණයෙන් භූෂිතව භ්‍රාජිතයකරන එහි පසන් සුරලියන් වන් එ
ගම්දූරියන්ද නෙකරුවන් බරණිත්සරා පහන්සිළු ලෙසින් දිසි
මුවෙන් කිරි නොහළ ළදරුවන් සමගින් නොයෙක් සව්සතුන්
එහි වනසමින් සැපත්මහ විපත්ලෙස ඔවුන් සැලකළසඳෙහි-එස
ද වනුනිරිදු සඳ මැනිඳු දෙස බලා සෙද මෙපුර මහසෙනග සහ
මිගිඳු සුදයව යන්ට නික්මෙවයි වදහළෙන් එබස්සා විමැති මැති
එපුර බෙර හඬුරුවා ඛඩ්ග තොමර වජ්‍ර චක්‍ර කොදණ්ඩ ශර ශ
ක්ති නාරාචකුන්ත මුද්ගර එරශු භින්දිපාල ප්‍රභෘති විවිධ ආයුධ
දරා මණි කවචසන්නාහ සන්නාහයෙන් යුක්ත මහසෙනග සමග
ගොස් මැතිඳු නරනිඳුන් දැක වරණ තබ මයුඛජාලයෙහි ගැලී
වැද රැගෙන අවසර නික්ම පටහදුන්දුභිමුරජ පණව කාහල ඩම
රු මඩ්ඩු ඩිණ්ඩිම ශුෂිර ඣල්ලරීතාල වීණා වෙණු මෘදඞගාදි පස
හතුරු පෙරටුකර යුගත් සැබ තලිනි'ගිල මහත් සත්සඋර ගොඩ
ගමන්ගත් විලස්පෑ ගොසින් සිහරජුන්සිටි පියෙස් වටලමින් සෙ
ද සකල භූවිතල නොහැර පතළකළ විකුම්යස ප්‍රබල ඉහ යොධ
යසන් රැගත් අවි ලෙලවමින් මහත් ඔල්වරහඬින් දිමුත් රණබෙ
රගොසින් අසනිශත නිඝෙර්ෂිත ඝනජීතාරාව නිහ තුමුල රණරඞග
ඝොෂය අසා සිහරජුන් තම ඔත්පලින් නැගීසිට කෙසරු කර බු
රවමින් ගගනතල වගා තම විදුලි සියදහස්ලෙස භ්‍රමණ විභ්‍රමණ
යෙන් අබිරු කෙශරසිංහ නාදයෙන් මහසෙනග කණිණ්පුට පුග්
මයන් බිහිරිකර උරිරුජල නු'ගුරුවා කුරිරුබව පතුරුවා සතුරු
රණ අසුරුවා සිරු රුබිඳ විසුරුවා ජෘම්භමාණප්‍රවර ජම්භාරි වාර
ණොත්තුඞග ගිරි මෙවුල් තුල් කුම්භ රණගසක්පුට පාටනය කර
නොහැර අනගි මිණිකිකිණි රසුදැලි ගෙබි මහරු රත දූදුරු
කොට තත'විගත් අසරුසමගින් තුරඟසෙනග මැද සැපත් මහ
සෙනක්මෙන් ඞග තබපසඡ්ජෙන් ඔවු'තඞග හඬහකර රණර
ඞගමණ්ඩ ලෙහි විජෘම්භමාණවූ සිංහරාජයා දැක, සෙබළු බිය වැද
නොමද සිදුරුවන ගුම්බමැද පිවිස නද වෙගයෙන් දුවනසඳ අසුව
සිහරදුන්ගට ඉතිරිතුරඟුන් පසුව එනවිලස් දුටුදනන් කොසරුය
සි සලකමින් රැදුරුකටුවෙනෙහිවැද උතුරුසළු හන්පළන් දුහුල්
කඩකඩට ගොස් කොල'තු බැඳ ගෙන ඉගේ සුරතු ලෙහෙයෙන්

---

* ජාලපත්‍රයෙන්-මුද්‍රිත.

ඇගේ උම්තුවූවන්වගේ අමුතු රණමෙව්වගේ නොදතුවෙන් උහු
රගේ මෙලෙස මහසෙනග චල්වැද තැතින්තැන ගොසින් නැවත
ඔහු එක්ව ගොස් තිරිඳු දූක සියතුයේ නොයෙක් මිගබස් කියා
ගිය සෙබළු සිංහයුදට එකෙක්වත් තිබූ අඹියකුත් නැත ඉදිරියට
මෙවක්තැන් පටන්සිට නොමදෙතත් පඹිඅපට එවික්මන් කරනු
යත බවක් නොසිතෙයි සිතට නොයෙක් සව්සත රකින හිමි සඳි
නි! දූන් ඔබට වැඩක් වුවහොත් අපෙන් මෙයුද ;කරවනු කුමට
රුදුරු සිංහරජකු අත නැසුවෙන් ලබන ඵල කිමෙක්දැයි කිය කි
යා නොයෙක්ලෙස බැගැපත් හඬින් හඩ නැඟූසඳ තිරිඳු ඔහු
අස්වසා සෙනහ යළිමින් පිටත මැතිඳුවෙත ගෙන්නවා බැන්ද
දහයින් පියලි ඇතකුපිට තබවමින් කෙනෙක් වික්‍රමොදිත ගෙ
නැත් සිංහරදුන් හිස දූනොත් මේ රන්දහස සමග නෙක ඉසුරු
දෙනු නියතයි කියා බෙරලවයි වදහල සඳෙහි එබස්සා මැතිඳු
සෙද එපුර බෙර ලවනසඳ භුඹගබාහුවෙන් ගත් කගින් රුපු
නොදය සිඳලුන් ලොබාවෙන් තිබද විජය සිරි උරපැළඳ රත්සු
බාවෙන් දියත විකුම්පළකර තිබඳ මන් ලොබා කරන වරඟන
රුවින් එමන්මද මෙන් ඉබා නතනැණින් දිසි යසින් සොමිසර
ද සිංහබා කුමරිඳුන් අසා කළ එබෙරනද තමවුන් වෙතට ගො
ස් සිංහරදුන් යුදට මම යෙමැයිකිබස්අසා එසඳ මවුබිසෝසඳ ඇත
ත් තොප බලවිකුම් පියරජාණන් සෙයින් එයින් දෙලොවටම
වන අයස නොමසලසාමින් මෙලොව යස ඉසුරු සැප හිරව
නොසිතව කුමරුවනි! කියා වැළකුවෙන් තෙවෙනිවර ලැවූ බෙර
හඬ'සමින් මවුබිසව ග ත් නොකියා නොසිත් නවතමින් එබෙ
රනද යාරම් මම යොසරයුද කියා මැතිසෙනඟවැද ගොසින් නර
න්දුන් වැද එබව සැලකළ්‍නිසා එසඳ වනුතිරිදුසඳ නොමද සතු
ටින් පැ ැද පබඳ බලවිකුම් තද මෙසඳ පළකළ සරද එයුදකර
රුපුදිරද සිංද ගෙනදූනොත් සෙද සුගද කුමරුවනි! නඳ පසිඳු
සව් ඉසුරු සැප සමග සෙනවිය දූරද දෙමැයි කී සඳෙහි සෙද
තිරිදු පාපියුම්වැද කුමරු අවසර රුගෙන නික්මගොස් එවනමැද
පිවිස උන් තුමූල සිංහරදුන් දූසා රුගත දූනුහි අතට වරෙන්
සිංහරද යුදට කිවෙන් කුමරිඳුන් සිට එබස'සා මිහිඳු සෙද නැගිට
තම ඔත්පලින් ලපෙම් බැඳ කුමරුහට දූකුම් අටියෙන් නොවද
නිැත්සඳ කුමරුවෙත විසපු දිගු පුළුල්වූ කරල් ගියක් අයා විදි
සඳෙහි සිංහරජුගෙ මෙත්බෙලෙන් මූණය ආපසු බලා වැටුණුබව
නොසලකා යලින් විදිසැරය එලෙසට උවෙන් තෙවෙනි වර විදි
සැරය උවෙන් වෙරදි සිංහ රජුගෙ සිර බිදි ඇට සම් නහර පලා
ගොස් දෙරණතුළ වන්සදෙහි. වැදනොසිඳ ගිරි අරණ ඇවිත්

සුතං'තඹු ලොබින නොලැබ කිසියම් සරණ වැටුණි සිහරජ දෙර
ණ සෙනෙහසැති පෙර සොඳුරු දූක සිංහබාකුමරු දුක් තෙපුල්
මුසු ළපිරු අඬයි මෙලෙසින් කෙසරු මෙපනනල තිබෙනතුරු
මඇස දකිතොත් කුමරු මෙතොප විඳිසැර රුදුරු වෙහෙස නො
දැනෙයි මහරු දකිනලෙස සුතන'ඹුන් ආමෙමට තොපවිසින්
විඳපු සැරපහර දූන්අසා තොප මවුලඳුන් කෙසේ වැවෙති ඉතින්
පෙරත් දරු සෙනෙහසින් ඇතිකරනකල තොසින් නාමද දුක්
විඳිබැවින් අදත් දුක් මෙතොප දුන් විඳිනු කෙලෙසද ඉතින් කී
සඳෙහි සිහරදුන් එකුමරුන් සිංහබා අසා එතෙපුල් ලොබා දමා
දුනු හී තබා අඬා ඉස අත තබා බොජුන්කර තුල් ඉබා නො
සිඳැවිත් වනගැබා වුවෙන් සුතන'ඹු ලොබා මෙදුක් ගත්තෙති
නුඹා ඇවිද හිම නොකමසේ රුගෙනවිත් පලරුසේ ලමින් ගිරි
ලෙනකුසේ දෙමින් අප කැමතිසේ ඇතිකලා දෙනෙතසේ නුඹට
පලඳුනි මෙසේ සුතපිසස් තිසිලෙසේ වාවිතිය දුක්රුසේ යක්දෙ
මවුපිය කුසේ නොවාවිති යන බසේ පෙර පැවති තතුලෙසේ මෙ
දූන් අත්ථට ලසෙ දවිමි බොරු නැතිබසේ වැනසුවෙන් පිය නි
මල් කරනි නිත්දූ සියල් තිරාදුක් විඳ නැඹුල් මිදීයෙම්දේ කිකල්
ගිවිස රජු බස් මෙකල් සියැසලෙස රුකි ලකල් නොගෙන ඔබ
ගුණ උදුල් අතිස කළදෙය කුහුල් කෙලෙස කියම්ද, මෙකල් මෙ
සේ සිහබා කුමරු අඬන අඬ අසමිනේ සියැස ඇර කුමරු දෙස
බලා තදසොවහිනේ පවසන්ට වනිය තම විඳපු දුක් නොමදිනේ
සොඳුරු තොප මවුලඳුන් වෙළඳදෙටු සිත්හෙනේ මිතුරු නැසි
යන්හැර ඔහු සමඟවිත්වෙනේ අඳුරුගැබ තුලටපත් කාලාපිරිසඳ
මෙනේ තඹුරු කොඳ සුපුල්මල් බමර බර මයවෙනේ සිරුරු
සියරසින් අලුකල එතුරු ලියවෙනේ බමර දිය ලිය ලෙසින් එලඳ
දූක විය සෙනේ අබිරු සිහනදයකර ගොසින් මා වන්තැනේ
අතුරු හිමවත පිවිසි සඳ වෙළඳ බියනෙනේ ළපිරු සෙනෙහසින්
ලඳ මපිට හිඳුවාගෙනේ විදුරු ගිරිලෙනටවිත් තබාමෙන සිතු
මිණේ මහරු කම්රසෙන් නොවෙනස්ව රන්රසමෙනේ ඉසුරු
උමයහන්ලෙස වසනැඳ සමගිනේ කුමරු දෙදෙනෙකු වදනස
ඳෙහි තද දුක්ගෙනේ කවුරුවත් නොමැතිතැන තොප මවුන්
සමගිනේ අසුරු විළඹුවක දූහොතටම වදවාගෙනේ තඹුරුමුව
උපුල්නෙත් සිඹවැළඳ වඩමිනේ සපිරු සක්මසින් බත්කවා සුබ
මොහොතිනේ සොඳුරු සිහබා සිංහවල්ලි යන නමකිනේ ඇදු
රු කී පොරණබස්ලෙස මඟුල්කරමිනේ මියුරු රසබොජුන් පල
වැලද ගෙන දෙවමිනේ ලපිරු සෙනෙහසින් තොප ඇතිකෙ
ලෙම් මෙලෙසිනේ රුදුරු පෙර පවෙන් දූන් මට මෙලෙස සැල

සුණේ කවුරු කොයි කිවත් තුඹවෙතම සිතලොබ දනෝ මහරු
තොප මවුන් සිහිකලබවත් කිය අනේ මිතුරු සිළු පබා සිහවල්
ලිවත් එව්දනේ සිතුරුවත යුතු නුඹත් ඵවතු සැපවිඳිමිනේ මෙ
ලෙස වනසෝසුලා කියන කල කරලොලා සිහරජුගෙ මනකලා
සැහවුනෙය පණතලා එබම කුමරිඳු බලා සොවින් මියුඩුහුරුලා
එන කඳුඑහැලි ගලා යුවලතින් පිසහෙලා රැගෙන කගපතඳුලා
කපා හිස සිහබලා එගෙන ඔහු තික්මිලා එනසඳෙහි නොයෙක්
රට දනව් වැසි පඬුරුගෙන ඇවිත් පෙරමගට දක මහත් ඔල්වර
හඬින් නුමුත්වන තුතිගොසින් පසහතුරු පෙරටුකොට විරිඳු
කොලහල නදින් සියල් නුඹකුස වසා ලකල් කුඹකොඩි රැගෙන
මගුල් පෙරහරින් කුමරිඳුන් වැඩමවාගෙන විපුල් පුරවරට සෙද
පැමිණිසඳ–දිමුත් කුමරිඳුන්ගේ එමුත්රද මහත් සගසැප'ත්කර
එසත්වෙති දිනත් පසුවූවෙන් සෙද ගෙනාබව කෙසර සිර අසා
මවුබිසව සහ සිංහවල්ලී දෙදෙන විත් වැළඳ සීරදුන් හිස නුවත්
කඳුලෙන් පිවිස තමන් රැකිබවකියා නොයෙක් ලෙස විලාපෙන්
අඩාවැළපුණු සඳෙහි එපුර මහසෙනග සහ විමැතිමැති රැස්ව
දක රාම් උත්කම්ණෙන් හෂ්ණව දශීනෙන් එරුෂ රුදු කෙසර
රණ වම්ගණනක් අමුතු පවනින්ට පුරුෂවික්‍රමය පෑ විලස් යස
සඳුන්දික් ලලන උරබිනෙහි අංකම්ණසකල විලස් යහපැතැයි
කියා මග පම්දස් සතුටුව් එපුර රජසිරිත්ලෙස අවමගුල් වෙසින්
ගෙනගොසින් සිහරජුක් හිස දවා හැර සොඳුරු එපුරට නුදුරු
මහරු හිමවතක් දක නුවරු හැම එක්වගොස් එතුරුලිය ලැ
හැබි හැම සිදුරැකර දදුරුතැන් සපිරුමෙන් එබෙරඇස සිරින්
කර ඇදුරු කීලෙසින් පෙර ගැඹුරු සිලිලෙන් සපිරු රුදුරු
දුතිමොහොර කුමහීර සංජනන තිරකදීම ගුණකා අගල් තුංකින්
ලකල් විදුරුගිරි බිතසෙ තුඟු පවුරු පදනමින් යුත් මඳුරුසෙල්
වියල් තුල් ගොපුරමාර ශත තිශෙවිත උදුල සිසිකිරණපට මිණි
කොතිති ගෙත'සුකොට තිබුවමෙන් පුරලුකොට රජපතඉ
දිලෙනවට එපුර සුරතිඳු පුරට තිසරුකොට මැවූ තිවට ලතර
පහපෙලැති තුටපසක් සව්සිරින් පිරි එසක්විති රජුන්හට සපැත්
පින්බෙලෙන් හෙබි මහත් පුරවරක් මෙන් සිංහබා පුරය යන
නම් තබා එපුර විසිතුරුකමින් තිවවමින් නොනසමින් තමන්
කුල නගුන් වෙත ගෙන්වමින් පසත් සුරලියක් මෙන් නොමින්
හන්පලන් සිව්සැටක් බරණින් සරා දමත් සත්රුවන් රුස මස්
තකෙහි සිටුවමින් දක්ෂිණාවෘත්ත ධෞත ශඞ්ඛප්‍රක්ෂිප්තවූ ස්ඵ
ටික මණිවණ් ශලිල ධාරායෙන් අභිෂෙක ධරමමින් සැපසිරින්
පුරබුවන් මනකමල් පුබුදුසා තෙදරැසින් උදයගිරි ශිඛරයෙන්
උදුවූ දිනිදුමෙන් තෙසක් සිවුපා සතහ දශරාජධම්යෙන් එපුර
ජන රඤ්ජනය කරනසඳ සිංහබා රජු නිසා සිංහවල්ලීබිසව කු
සෙහිඔත් දෙබින්නන් දෙතිස් බෑයන් ඉපිද එයින් දෙටු විජය
රජ මෙලක රජ සිරිපැමිණ කුවේනිය බිසවකර වසනසඳ ලග්ග
ලට යකහතක් රැගෙනයන මඟුලකට යක්ෂසෙන් රැස්ව කළ
එකොළහල අසා රජු පසක් අසඹුවක් ලෙස වෙසක් ගත් එයක්

බිසවගෙ පිටින් මෙලක්දිව සාලක්උන් නොයෙක් යක් බූපිසස්
වනසමින් අසිරිමත් මෙසිරිලක රජපැමිණ අපරිමිත රාජානු
භාවයෙන් එපුර සව්සිරින් වැඩවසනසඳ, ප්‍රවර රවිවංශ පෙර
රජුන්ගේ සිරිත්ලෙස දිමුත් කිරුළිස පැළඳ සොඳුරු මදුරාපු
රෙන් මිතුරුකුලතිලකවූ තුනුරුවින් දිවසරන් සිරිරුගත් බිසව්
මහපෙරහරින් සිඳුතෙරින් මහතොටට බැස එනිසි රජු අසා
කුවේනිය ගෙන්වමින් රුදුරු යකහනක් මෙහි වසන්නට නපු
රුයයි යන්ට වදහළ බසට යක්බිසෝසඳ එවිට මහත් දුක්වැද
සිතට නිසයි බස් මේලෙසට දිවූටදී පෙර මෙමට පැමිණ රජසිරි
සැපට අනිසකළදේ මෙමට මමත් දන්වමි ඔබට කියාගොස් වැද
වලට මවාගත් දිව්වෙසට බයාපත් වෙන ලෙසට හයා දිව රුදු
රුකොට එයාඅදර දුදුරුකොට විජයරජතුමා ːග් හෘදයම්ඩ්‍යට
පොවනසඳ, වරම් රජතුමන්ගේ නියෙන් සිඳ හළසදෙහි පසක්වූ
එසක්රජ එසත්පැයකට පැමිණ ආයුෂය දෙලොස්වෂියක් නර
සුරපුරට පැමිණිසඳ– එරජ ියඇසක්සේ මෙලක්දිව සතන්රුක
එවක්සිට දෙලොස්වස් රජයකර නිදස්පුර වඩිනලෙස නික්මෙ
මින් එරද පියරජුන් තම දෙතිස්බෑයන්තුරෙන් කණිටු සොහො
යුරුව පත් දිමුත් සුමිතුරු රජුට එපුත් පඬුවස් කුමරු මෙලක්
දිව පැමිණ රජකරනලෙස එපත් අස්නක් සමග මහත් මැනි
දෙක් යවා විජයරජ නිරුඩව සුරදුම සියෙන්හෙබි බෘහත්වර
සුරපුරට පැමිණිසඳ– සිංහබා පුරට ගිය මැතිඳු තම ගිය කරුණු
පඬුවාසනම් රජතුමන්හට දන්වමින් එගිය මැතිදුන් සමග මෙ
ලක්දිව පැමිණ රජඉසුරු ලැබ අසිරිමත් එරජ සැප විඳින සඳ
දිනෙක සිරියහන්තුළ එහිම් සැතපෙන සදෙහි සිහයෙන් භානු
යුග්මයක්මෙන් පීත අක්ෂිවයෙන් වක්ත්‍ර ඇති රුදුවූ අදුන්වන්
සුරත් දිව් මහත් දිව්වෙසක් දුක රජබියෙන් පිබිද සිටි තැන්
පටන් පියරජුට සැපත් දිව්දෙස් සිරින් උග්‍රරොගාදි අග්නිජ්වාල
යෙන් තප්ත කිශලයාකාරවූ චිත්‍රශතපත්‍රවනමිත්‍ර ශුචි ගොත්‍රවූ
එපඬුවස් නිරිඳුහට සැපත් දිව් විපත් දුක තාරකා නිකර පිරි
වැරු කුමුදමිත්‍ර යුත් දිමුත් ධවලච්ඡත්‍රයෙහි වසන වරසුරඹ සුර
පුරට ගොස් සුරඹ පිරිවරා උන් සුරිඳු වැඳ මුනිඳු ලක් සසුන්
රුක විරිඳු රුපුඅරිටු බිඳ නරිඳු බදු යසින් දිසි පසිදු පඬුවස්
රජුට සැපත් දිව්විපත් දුරුකාලොත් ඔබ යසත් මතු කලක් පව
තින්ට යහපතැයි සැලකොලෙන් එසක්රජ පසන් මුනිතුමන්
ගෙන් බාරලත් මෙලක්දිව කලක් මතු රකින කැප්රජුන්හට
සැපත්වන විපත් සහ එපඬුවස් රජුන්හට පැමිණි දිව්දෙස් දු
රුර රකිනලෙස කවර සුරඅසුරඹ තුමන්ගෙන් සමත්දැයි මෙ
තුන්ලොව දිවනෙතින් නරඹමින් දුෂ්ටවන රිෂ්ටයන් භ්‍රෂ්ටකාර
අෂ්ටදිගු යෂ්ටියෙහි තුෂ්ට යසකෙහෙලි සුවිශිෂ්ටකළ විෂ්ටරය
පුත්‍රවූ එකිත්සිරි සඳල මලරදුන් දුක එසුරරද රාහු අසුරිඳු නවා
රුගත් සූකරවෙසින් ඔවුනු'යන වනසමින් රජුකුනුල් වඩවමින්

එතුන්බෑ රජතුමන් මෙතුම්ලක ගෙන්වමින් පඝන්ව එසන්තා තා වෙනෙහි සව්සන්තානයෙන් උවමන් සොයා යක්‍ෂසුනර වෙ සැර ගල්ව සිටිසදෙහිදි තුන්දෙලොස් වැදිමූළුත් සමග කිත් සිරි සදල මලරදුන් සහ එතුන්දෙන එතැන් දෙම්නසින් සිටි විලස්දූසා සුරිඳු සුරපුරෙන් බැස සමුද්‍ර කෙවඩම් නුපුරාදි සිව් සැටක් බරණ සහ ලකුළු මිණිකිරුළු හිස පළඳවා එපඬුවස් රජුන්හට පැමිණි දිව්දෙස් දුරුර මෙසින්මතු මෙලක්දිව පැමිණි කැත්රජුන් සිංහතෙහක්මෙන් රකිනලෙස ඔවුංදී එසුරරජ් තිඳ සපුර වන්සදෙහි එතුන්බෑ රජුන් තුන් දෙලොස් වැදි මුළුත් සහ එපඬුවස් පුරට ගොස් මැතිඳ සහ තිරිඳුහට ඉදුබෙලෙන් දන්වමින් වේදත්‍රයෙහි නිපුණ බමුණුවරු දෙදෙනෙකුට ආවෙශවූ විලස් පෑ සතිස් වැදිමූළුත් සහ පටහ දුන්දුභී මුරජ බර තුරුනාදින් යුක්තවූ නෘත්‍ය ගීතාදියෙන් රජු විතත සනෙනාෂ සාරවමින් ක්‍රෑරවූ රෝගබිය පැර හැර දිගාසිරි වසා සව්සිරින් පිරි මෙසිරිලක දනන් රැක තෙදනසක උසස්කර අරිවූ තම සහ ස්කර එරජසැප වෙසෙස්නර සැලැස්වූ විලස දන් භානුකුල හෙම්නිල යුදර මණි මිත්‍රවූ මුණුසැට අමරගුරු මෙධතින වක්‍රවූ නිනු උර විජයසිරි වික්‍රමාදිත්‍යවූ පීනු ගුණසයුර මුපිල ලනකර ඡනුවූ නැබලවර වික්‍රමොදිනෙන් බලහද්‍රවූ සකල මනුරාජ ගුණ ධම්මයෙන් යුක්තවූ පුවල සිවුසැටකලා ශිල්පයෙන් ශික්‍ෂිතවූ විපුල් පින් ඞබලෙ‍ාන් ලක එකාත පත්‍රවූ සුරරාජ සමභොග දිතරාජ ඉවතෙජ ගිරිරාජ දෘඪවිර තුරුරාජ කාව්හොජ ශශිරාජ හරතාර සිඳුරාජ සුරක්‍ෂිර සුවිරාජ යසපුර රිපුරාජ ඉභවිර මෘග රාජ සමශුර මදරාජ තනුසාර නිහතීජ නැබවීර මුනිරාජ කෘත පූජ මනුරාජ නරවීර රාජාධිරාජ පරරාජ රාජෙශ්වර ශ්‍රී වීර පරා ක්‍රම නරෙන්ද්‍රසිංහ නම් රජගුමාණන්කෙරෙහි කෘපාපූරිත හකති බෘහත් මෙත් සිත් වඩා වක්‍රානු වක්‍ර ග්‍රහඝට්ටන පෘථිවිකම්පන ධූමකෙතු* දිග්දාහ රුධිරාම්බර කලිකාලග වෛකල්‍ය රක්ත භානු ප්‍රභා ගන්ධර්ව ගීතී උල්කාපාත යක්‍ෂ භූත ප්‍රෙත පිශාචාදියෙන්වන දුස්වපන දුර්නිමිත්ත අෂ්ටාතිරෙක නවතියෙක් වන රෝගයද නවාතිරෙක නවතියෙක් වන ව්‍යාධියද දෙතිස් අන්තරායාදී විපුල සර්ව උපද්‍රව මිතුරු දුටු අදුරු මෙන් ක්‍රෑරතර ශත්‍රුසඞ්ඝ විධ්වංසනය කරවමින් යසස් තෙද උසස්කර ශතාධික වර්ෂයක් දිගාසව්සිරි දෙවං දිවාකරකුලගපත් මේ අප හිමිතුමන් සහ මෙ සිත්පසු මෙලක්දිව සැපත්වන රජුන්වත් අසිරිමත් සසිරිසැප සලස්වා නොයෙක් වික්මෙන දිමුත් තුමූත් මැතිඳුන් සමග මෙ ලක වැසි දනන් හැම මෙපස්වා දහස්කල් රකිත්වා රකිත්වා

ගම්.

---

* ධූමකෙතු.

# ග්‍රන්ථපද විවරණය.

නමඃ ශ්‍රී ගණාය.

**1.**

සුවස්ති–සු අස්ති; යහපතක්වේවා. (මේ වනාහි ග්‍රන්ථාරම්භයෙහි යොදන මඞ්ගලාර්ථ සූචක පද යෙකි.

ත්‍රිභුවන– තුන්ලෝකය. (ස්වර්ගී, මර්ත්‍ය, පාතල, හෝ කාම, රූප, අරූප හෝ සත්ව, සංස්කාර, අවකාශ හෝ වේත්.

ගුණරත්නාවර– උතුම්ගුණ නමැති රුවන්.

ආකර–උත්පත්තිස්ථානය.

උදාර–මහත්, හෙවත් එඞ්ගතියෙන් හෝ තෙජෝ ගුණයෙන් යුක්වූ.

දුර්වාරතර– අතිශයින් දුරුකළ නොහැකි.

ඝෝර—දරුණු.

මාර—පඤ්ච මාරයෝ, (මෘත්‍යුමාර (මරණය) ස්කන්ධමාර (පඤ්චස්කන්ධය) ක්ලෙශමාර (කෙලෙස්) අභිසංස්කාර මාර(සසර ඉපදීමටහෙතු සිත්) දෙවපුත්‍ර මාර (වශවර්තිමාර)- යී පඤ්චවිධයි.

අරි— සතුරන්ගේ.

අන්ධකාර—දපිය, එඩිය.

කුලහාර—(හාරකුල) දුරුකළ

හර— මුතුවැල.

තාර— තාරකා.

ඝනසාර — කපුරු.

කහ්ලාර— හෙල්මැලි.

ඩිණ්ඩිර— පෙන.

සිත—සුදු.

ක්ෂීර — කිරි.

අමෘතසාර— චන්ද්‍රයා.

අවිශෙෂ-- වෙනසක් නැති, හෙවත් යටදූක්වූ හාරාදීයට සමවූ.

සද්ඝොෂමය — උත්තුඞ්ග ගුණ ඝොෂයෙන් හටගත්.

වෙෂධර— වෙස්දරන්නාවූ, විලාස දරන්නාවූ.

කීර්ති පරිවෙෂයෙන්= කීර්ති නමැති පිරිවරින්, හෙවත් වට කොට ගත් කීර්තියෙන්.

අශෙෂ— ඉතිරිනැති

භවන · වාසස්ථානය, ගෙය.

කුහර - අවකාශය.

ජගත්ගුරු— ලොකාචාර්‍ය.

සුගත්—සර්වඥයන්වහන්සේ. (ශොභන ගමන් ඇතිහෙයින්ද, සුන්දරවූ නිර්වාණට පැමිණිහෙයින්ද, මනාව කිය හෙයින්ද, මනා තෙපුල් ඇ:යි

හෙයින්ද, බුදුහු සුගත්නම් වෙත්.

මුනිතුමා— සම්බුදුයන්වහන්සේ. (මුනි යනු තපස්වියාට නම්, අප බුදුහු ශ්‍රෙෂ්ඨ තපස්වී හෙයින් මුනිතුමයයි කියති. අගාරිය මුනි (ගෘහස්ථ තපස්වි) අනගාරියමුනි (ගිහි ගෙයින් නික්මුණු තපස්වි) සෙඛ මුනි (සොවාන් මාර්ගස්ථ ඵලස්ථ සකෘදගාමිමාර්ගස්ථ ඵලස්ථ අනාගාමි මාර්ගස්ථ ඵලස්ථ අර්හත්මාර්ගස්ථ යන හික්මියයුතු සත්දෙනා) අසෙඛමුනි(රහත්හු) පචෙචකමුනි (පසේබුදුහු) මුනිමුනි (සම්මාසම්බුදුහු) යයි මුනිවරයෝ ෂඩ්විධ වෙත්.

විකච- පිපියාවූ.

ශතපත්‍රයෙන්—සියගණන් මල් පෙතිවලින්.

චිත්‍ර- විචිත්‍රවූ, විසිතුරුවූ.

අරවින්ද- පියුම්.

ඉන්දීවර- නිල් මහනෙල්.

කුන්ද- කොඳ.

මකරන්ද- මල්පැනි.

මධුගන්ධ- මල්පැනියෙහිවූ සුවඳ.

ලුබ්ධ- ඇලුනු.

මුග්ධ—බොළඳ.

ෂට්පාද—භෘඞ්ග,මීමැසි,(පා සයක් ඇති හෙයිනි)

චලිත—සෙලවුනු.

ලලහරිත—දියපිරුණු.

ගම්භීර—ගැඹුරු.

උත්තුඞ්ග—උස්

ප්‍රාකාර—පවුර, තාප්පය.

පරික්ෂිප්ත—වටකරනලද.

ස්ඵටිකමණි- පලිඟු.

ස්තම්භ- කණු.

සොපාන- හිණ, තරප්පිය.

ගොපුරචාර- ගේට්ටුව.

හිම- පිනි.

ධරණිධර- පර්වතය.

ශිඛර- මුදුන.

ප්‍රතිභාග- සමාන.

මන්දිර- මාලිගාව.

උජ්ජෘම්භ- බැබලීම.

ශෘඞ්ගාර- කොත්.

මදපඞ්කජල- මද නැමැති සනවූ ජලයෙහි.

භෘඞ්ගගණ—භෘඞ්ග සමූහයා විසින්

ශෘඞ්ඛලිත- වෙළාගන්නාලද.

අනඞ්ගරණ- අනඞ්ග යුඬයට

රඞ්ග- යුඬභූමිවූ.

රිපුභඞ්ගකළ—ශත්‍රැ විනාශයකළ.

මාතඞ්ග—හස්ති.

තුරඞ්ග—අශ්ව.

අසිරිමත්- පුදුම.

සසිරිබර- ශ්‍රී භාර සහිත.

ප්‍රුලල- මහත්.

භුජ= බාහුව.

උල්ලසිත- බැබලුනාවූ.

ප්‍රුල්ල- පිපියාවූ.

සරසිජ- නෙළුම්.

වදන- මුහුන.

පල්ලවිත- හටගත් දළු ඇති.

වෘත්ත- වටවූ.

විටප- ශාඛා මණ්ඩලය.

වට—තුගරුක.

මත්ත—මත්වූ.

කොකිලධ්වනි- කොවුල්හඬ

ගිරිරඞ්ග- පර්වත නෘත්‍යය.

ඝාතන-නටනලද.
සිඛිපිච්ඡ- මොනරපිල්.
ආවත්තියෙන්- විදහීමෙන්.
ව්‍යක්ත- ප්‍රසිද්ධ.
නික්ම මුනි- මුනි නික්ම, සර්වඥයන්වහන්සේ ප්‍රවිෂ්ටව.
යුග්ම—දෙක.
ශයනය—ඇඳ.
වදින-ප්‍රවිෂ්ටවන.
ප්‍රවරතර-අතිඋතුම්.
තුමුල-මහත්.
බලභද්‍රසම—බලභද්‍රයාට බඳු
මන්ඔබා-මාන්නයයටපත්කොට
භානුකර—සූර්යයා.
සන්නිභා-වැනිවූ.
පභා-ප්‍රභාව, රශ්මිය.
රණරත්—රණ + අරත්, යුද්ධ නමැති වනයට.
ඉභාවෙන්-හස්තියකු වැනිවූ.
දෙරණ—ධරණියෙහි.
වෙන්සුබාවෙන්—විෂ්ණු සවභාවයෙන්.
ඉන්සබාවෙන්- ඉන්ද්‍රාකාරයෙන්.
නිජයසස—ස්වකීය කීර්තියට.
අමෘතකර—චන්ද්‍රයා වැනිවූ.
කෙසරපුර-සිංහපුරයෙහි.
සමරභට-යුද්ධ භටයන් නමැති.
තිමිරඝන පටලපුට— අන්ධකාර නමැති බහල පටලාවලිය.
පාටන-පැළීම පිණිස.
උදිත-පහළවූ.
අරුණකර—සූර්යයාගේ
කිරණපුරු-රශ්මිබඳුවූ.
රොධසුත්— සතුරන් ව ලකීමේ ශක්තියෙන් යුක්ත.

ප්‍රබල-ශක්තිමත්.
පවනබල-වාතබලයෙන්.
සඞ්ඝාත- නසනලද, විසුරුවන ලද.
ජ්වලිත—දිලියෙන.
සමුද්භූත—හටගත්.
මණිසඞ්ග—මාණික්‍යයෙන් සම්මිශ්‍රවූ.
භඞ්ග-බිඳීමෙන්.
සංඝට්ටිත—මොනවට ගටනලද.
ගිරි-පර්වතයන්ගේ.
කටකතට-මධ්‍යප්‍රදෙශයෙහි.
ලුලිත-සෙලවෙන්නාවූ.
ශීකරාසාරයෙන්=(ශීකර + ආසාර) මද වැස්සෙන්.
චණ්ඩ- සැඩ, රළු.
කුණ්ඩලිනිභ- සර්පයන් වැනි.
ස්වාහ—අග්නිභාර්‍යාව.
මුහුදුදරයෙන්-මුහුදු උදරයෙන්, සමුද්‍ර කුක්ෂියෙන්.
පළ—ප්‍රකට.
හෙළ - ධවල.
පුවළ—ප්‍රෞඪ.
දළ—දෘඪ.
පබළවැල—ප්‍රවාලාවලියගේ.
තරලරැලින්-රශ්මි තරඞ්ගයෙන්
මින්වැල— මණ්‍යාවලියෙන්.
ගහල—ගැවසීගත්.
ඔසළු-රැස්වුනාවූ,
වෙරළතට- වෙලාන්තයට, මෙහි අත්යනු. සවාමියෙහියි
නිකට—සමීපය.

2 පිට

ත්‍රැටිත—වැහෙන්නාවූ.
මුඹර—දෙබමළු.

ඛඛකාරනාද — භ්‍රමර නාදය
පීනගණ්ඩතල - පිරුණු කොපු
ල් පෙදෙස් ඇති.
වාහ්‍යමදදහති වෙනෙහිවූමත්ත
හස්තීන්ගේ.
උද්භින්න — බිඳීතලද
තරු — වෘක්ෂ.
සඤ්ඡන්න — ගැවසීගත්.
විපුල්තෙද — මහත්වූ තෙජස.
කොපුල්කර — කපෝලයන් හි
කොට.
පුපුල්වන් — මොනවට පිපියාවූ
උපුල්රැස් — උත්පල සංඝාතය
නුපුල්වන් — බැහැරනොකළාවූ.
උපුල්වන්සුරිඳු — උත්පලවර්ණ සු
රේන්ද්‍ර, විෂ්ණු.
සුරරදුන් — ශක්‍රයාගේ.
වෙහෙවරින් — විධානයෙන්.
ෂසැස්-ඇස්පසක් (මසැස්-දිවැස්,
පැණැස්. සමතැස් බුදුඇස්)
ඇති.
පසස් — ප්‍රශංසා.
සතොස්රැස් — සන්තොෂරාශිය.
සැලැස්මෙන් — විධානයෙන්
සහස්ඇස් — ශක්‍රයා.
පිරිත්හු — පිරිත්නුල්.
තිදසපුර — ශක්‍රපුරය.
(ශක්‍රයා ප්‍රධාන දිව්‍යපුත්‍රයන්
30 දෙනෙක් මෙහි ප්‍රධානව
වසන හෙයින් මෙනම් වීය)
බමරබර — භ්‍රමරයන්ගෙන් බරවූ
ලපලුපත් — ලාදළු.
පෙවෙති — පීයසි.
ලසල්වට — තරුණ ශාලවෘක්ෂ
හාත්පස
විසල් — විශාල.
වැමි — කණු.

දලසඹුඩු — පත්‍රයෙන් ගැවසීගත්;
මුහුලු — වකුල, මුහුනමල්.
යතින් — යන්ත්‍රයෙන්.
නල — මාරුතය, වාතය.
සසල - චඤ්චලවූ.
දිගු — දික්.
සෙමර — චාමර.
වටකෙතකි — වැටකේ වෘක්ෂය.
කැකුළුවට — කුඩ්මල හාත්පස.
ඇඹුල් — ඕලු.
උපුල් — මහනෙල්.
තල්වැටින් — තාල වෘන්තයෙන්.
පවණ්පතින්.
තමල්ලිය — තමාල වෘක්ෂයන්ගේ
(මෙහිවූ ලියශබ්දය ප්‍රශස්තා
ර්ථයි)
පුලිනතල — වැලිතලාව.
යොහොඹුලිය — මාධවීලතා.
ලැහැප්ලිය — ලතා ගුම්බය වැල්
පඳුර.
තුසරබිඳු පිනිබිඳු.
නිෂයනුදුල - නඛයෙන් උජ්වලිත.
නල — අත්ල
බමරම්ණිවෙන; භ්‍රමරමණිවීණාව
මිණුමුතු - පිපියාවූ
නනන නන — චඤ්චලපයොධරය
න්හි
මුවර - මකරන්ද, මල්පැණි.
කෙසරු පරාග, රේණු.
දසනගින් දත්අගින්.
ලියගි — ලයාන්විත ගීතිකා.
නලන් නාට්‍යකරුවන්.
ඇඹරළුනා — කරකැවීළුන්නාවූ.
ලියලියන් — ලතා නමැති ස්ත්‍රීන්.
රඟනරඟ — නටන ආකාරය.
ලතර — අති තරුණ.

යෝධලුන්-යොධභටයන්.
බැලිවෙසක්- බැල්ලියකගේ ආකාරයක්.
සෙද-ශීඝ්‍රව.
දූතපියා—දූතලා.
තාවිසින්– නොපැමිණි හෙයින්.
භූපාල—රජ.
කොෂනල-ක්‍රොධනමැතිගින්න.
ආරූළ—නැංගාවූ
නිර්ධූත—කම්පිතවූ
ධූමාවලියක්සේ— දුම්වලල්ලක් මෙන්.
පුළුල් පළල
අසිපත්‍රය -කඩුව.
චලිත—සැලෙන.
ජ්‍වලිත— අතිශයින් දිලියෙන
හසර—මාගීය.
චතොර—කලවා.
මොලොකතෙහි-- මොලොක් අතෙහි.
පිලු—පිණ්ඩය, ලිය.

**8 පිට**

නුවනගින් –නුවන් + අග + ඉන් ඇස් කොණින්.
මෙමා—මේ මාගේ.
රද—රජ
සිරස—හිස.
අඩුව - හානිය.
හැලි—නිර්ඣර, ඇලි.
පැහැලි—ප්‍රණාලි, පීලි.
දිවුව -- දිවිරීම.
සිපත—අසිපත, කඩුව.
සපථකොට—දිවුරුම්කොට.
හෙෂරව—අශ්වනාදය.
වේෂවත්-කොපඇති.
ව්‍යාතත—එවවූ,
සන්දෘෂ්ටවූ-දෂ්ට.
චක්‍ෂුස්ඵුර—ඇසින් බබලන.
ත්‍ර්‍යක්‍ෂවත්—ඊශ්වරයා වැනි.
ර්‍ැක්‍ෂවූ—රළුවූ.
කක්‍ෂ—පාර්ශ්වභාගය.
දූර්ලක්‍ෂ්‍ය-දක්කනොහැකි.
කක්‍ෂවත්-ලැහැබක්වැනි.
පක්‍ෂ —පාර්ශවයෙහි.
ගිරිවක්‍ෂ-පර්‍වතමඩ්‍යයෙන්
වික්‍ෂෙපකට විසිකොට.
කුක්‍ෂින්භර - බඩජහර.
ව්‍යක්‍ෂවත්සඩූල— ගසක් මෙන් මහත්.
ප්‍රතිපක්‍ෂ —හතුරු.
අපක්‍ෂපකර —බැහලා.
අක්‍ෂම - ඉවසීම් රහිත.
න්‍යක්‍ෂකාකාරවූ— අධම (දිළිඳු) ආකාරවූ.
ගිරි—පර්වත.
සාක්‍ෂසත- තෘණගහනවූ
පරිඛා—අගල.
පරික්‍ෂිප්ත—වටකරනලද.
නිශාචර --[යක්‍ෂ]රාත්‍රියෙහි හැසිරෙන්නෝ.
තතා--සාදු.
වාසකර—විසීමකොට.
මිණිකිරුළු- මැණික් ඔබ්බවා කරනලද ඔටුනු.
නොහඩු —අඩුනැති.
පිඩුනොකල- කැවි(ගණන්)නොකල
බඩුසුඹුඩු- බඩු සමූහය.
පඹුරු ප්‍රාභෘත, ත්‍යාග.
ජලධි-සාගරය
ශශිවත්‍රිකාවක්-සඳරැසක්.

අගුරු-ආකාර.
ස්නිග්ධ—සිනිදු.
ආමෝද—විහිදෙන සුවඳ.
ධම්මිල්ල—කොණ්ඩය.
අමෘතාකාරබිම්බනිභ-චන්ද්‍රයා වැනිවූ.

**4 පිට.**

බිම්බඵල-කෙම්ගෙඩි.
පල්ලව-දලු, ලාපත්‍ර.
අධර—තොල්.
කුඩ්මල-කැකුළ, මොට්ටුව.
කුච-පයොධර.
කලස-කලගෙඩි.
රෝමාවලි රාජියෙන්-නැබ මට කොට පිහිටි ලොමයන් සම්බන්ධවූ රේඛාවෙන්
සුක්ඵුල්ල-මොනවට පිපියාවූ.
සරසිජොපමා-නෙලුම්මලක් වැනිවූ.
රදූසඳ-උතුම් රාජදුහිතෘව.
මහතොට-මාත්තෝට්ටම.
ඉඳු-ඉඳලා.
නොපණත්-නීති විරොධ.
සඳු-සන්ද, හන්ද; නිසා.
උන්සඳ—උන්කල්හි.
රිවි-සූර්‍ය්‍යා.
සෙනේ-සෙනඟය.
සුපුන්සඳ-සම්පූර්ණ චන්ද්‍රයා.
උදයගින්-උදය පර්‍වතයෙන්.
යවටසේ-යකඩ ගුලි මෙන්.
මදනල-මන්‍දානිලය, මදසුලඟ.
සමදනද-මද සහිත නාදය.
යවුලෙව්-යවුල් + එව්,එනම් ආයුධයමෙන්.
මදනරද-අනඞ්ගයා.
සැර—ශීතල,
ගෙල'තලා-(ගෙලෙ + අතලා)බෙල්ල බදාගෙන.
පහස-ස්පර්ශය.
අමා-අමෘතය.
මහිම—උතුම්.
කොකුම්සිම්- කුඞ්කුම තල්කය.
අකලකැයි— කල්ක නොවේයයි නොහොත්, අකල්‍ය (අයහපත්) යයි.
මැකෙතෑ-මැකෙත්යයි කියනලද.
ඉනේ-ඉන්නිසා.
සතොස්කර-සන්තොෂකරවූ, සතුටුවූ.
කොයි-කොහි, කොතැන්හි.
කොයි-කවරලෙසකින්.
අඥතා-දුක්මුසු වදන්.
වත් -ප්‍රවිෂ්ට.
වනේ-ආරණ්‍යයට.

**5 පිට**

රුහැණී—කොපයෙන්.
ගිහිති-ගහන.
විදුරුමය- වජ්‍රයෙන් කරනලද.
ගුණසණ්ඩ—ගුණසමූහය.
අඛණ්ඩ-නොකැඩුනු.
පුණ්ඩරීක-කොටියා.
දිවිරුසා- දීපිරාශිය, දිවියන් සමූහය.
වසාගෙන-සඟවාගෙන.
සාප-දෙස්.
දලසා-දැස්වූයේම.
නිසා-ආශ්‍රිතවූ.
සෙද-සීඝ්‍රව.
පිසා-පිසදමා.

දෛෂවිෂකිල්විෂ- විෂ දෙසින්වූ රෝගය.

ක්ෂාලනය-සේදීම, දුරුකිරීම.

බෘහත්-මහත්.

ජගත්උදර-ලෝකකුක්ෂි නමැති.

මෘගශත්‍රුවූ— සිවුපාවුන්ට හතුරුවූ.

දුඃඛහකති—දුඃඛි ඇල්ම.

සුහෘජ්ජන-මිත්‍රජනයන්ගේ.

අමිත්‍රප-අමිත්‍රයන් රක්නාවූ.

සමරවාරණ-යුඬ හස්තීන්ට.

විෂාසිපත්‍රවූ-විෂ පෙවූ කඩුපත් වැනිවූ

නිජ-ස්වකීය.

ආතපත්‍රවූ - ඡත්‍රයක්වූ.

ජගදණ්ඩ-ජගත්අණ්ඩ, ලෝකයාගේ ශාන්තියට; ආරක්ෂාවට.

ඍචෙතණ්ඩ- ස්ථිරතරවූ.

ශුණ්ඩාකාර -සොඬවැනි.

රූඪභුජ-ප්‍රසිඬ බාහු නමැති.

අරාති - සතුරන්ගේ.

මණ්ඩිත-සරසනලද.

කුණ්ඩලෝල්ලසිත-කුණ්ඩල නම්වූ කර්ණාභරණයෙන් භ්‍රාජිත

පුණ්ඩරීකයන්-පද්මයන්ගේ.

ඔද-ඔජස්,

පුණ්ඩරීකාක්ෂිවත්-හෙල පියුම්කට බඳු ඇස් ඇති.

නවඛණ්ඩ- කොටස් නවයකින් යුක්.

භූමණ්ඩල—පොළෝතලය.

භින්දිපාල—අණ්ත ආයුධයක්.

දණ්ඩ—මුගුර.

කොදණ්ඩ—දුන්න.

යුදෙහි —යුඬයෙහි.

දණ්ඩ—සිවු වැදූරුම් යුඬ සේනාවිනාශයන් අතුරෙන් දණ්ඩ ක්මෙන් සරස්කොට සිටවීම දණ්ඩනම්, දණ්ඩායි පෙණෙන දීඝීය උච්චාරණසුඛය පිණිසයි.

ගණ්ඩ- ඉත්තැවන්ට.

භෙරුණ්ඩ—එනම් පක්ෂියාවැනි.

මණ්ඩලශාධිපති- (මණ්ඩල+ඊශ+අධිපති)ප්‍රදෙශ රජුන්ට ප්‍රධාන, මහරජ.

වසනතුල—වස්ත්‍ර අතුරනලද.

සලෙළ—චඤ්චල.

දළ—මහත්.

නිද්‍රොපගත—නිද්‍රාවට එළඹි.

දිව්සුරත්-අතිරක්ත ජිහ්වා.

විප්‍රසන්න -විශෙෂයෙන් පැහැදුනු.

අක්ෂි- ඇස්,

අගපිය—මහපීය, පියාගේ වැඩිමහල් සහෝදර.

ශ්වාස—ඇදීම.

ජ්වර-උණ.

දුඃඛ—දුර්වල්ල.

මධුමෙහ-එනම් ප්‍රමෙහ රෝගය මීපැනි වැනිව මූත්‍ර යාම.

ශොෂණ-කෙට්ටුවීම.

ව්‍යාධිතවූ—රොගීවූ, [ඛකෘත.

දළපුඩුලකල-ඇත්දත්සාමින්අල

තරලතර—අතිශයින් චඤ්චලවූ.

තරඟිහිනි-රශ්මියෙන් ගහනවූ.

මිණි කිකිණි රසු-මිණිගෙඩි,කුඩාමිණිගෙඩි; ගෙජ්ජු. මේශබ්ද ත්‍රය එකාර්‍ථ බැව් කොෂවලින්පෙණේ. වෙනස්කරහොත්කුඩා මහත් වශයෙනි.

මුතුලැලින්- මුක්තාලතිකායෙන්.
මුතුවැලින්.
කාංචන චලපත්‍ර පත්‍රයෙන් - රන් බෝපතින් "චලපත්‍ර" යනු බෝගසට නම්.
සුරවරරද්‍ර—උතුම් දෙව්දුව.
මන්දරගිරි—එනම් පර්වතය.
ධරණී- දරන්නාවූ.
සුන්දර—සොඳ.
පුරන්දරපුර- ශක්‍රපුරය.
ප්‍රභාකර- සූර්යයාගේ,
ප්‍රභාධර-කාන්ති දරන්නාවූ.
සභාසුර සවර්ණ—බැබලීම් සහිත රත්රන්
නිර්මිත- මවනලද.
ශෛලාආසන-ගල් අස්න,දිගින් යොදුන් 60 ක් හා පුළුලින් 50 ක් හා ඝණින් 15 ක් ඇති උස්පහත්වන ස්වාභාව යෙන් යුත් වදමල් පැහැ ඇති ගල්අස්න. ශක්‍රදෙවෙන්ද්‍රයාගේ නිසීදන ස්ථාන යයි.
අරා - ආරූස
දිවසරා—දිව්‍යස්ත්‍රීන්.
සුරාධිප—දෙවියන්ට අධිපති.
පුරඳරා – පුරන්දරයා, ශක්‍රයා.

6 පිට.

ඊසුරුහට- ඊශ්වර දෙවියන්ට.
කුන්ද—කොඳ.
මන්දාර- වරා, මදාරා.
අරවින්ද-පියුම්.
ළවුමන්ද—කොසඹ.
මුචලින්ද- මිදෙල්ල.
ඉන්දීවර- නිල්මහනෙල්.
සර්ජන- කෝන්.
චන්දන—සඳුන්.
අගරු- අඟිල්.
සින්ධුවාර—නික.
කර්පූර—කපුරු.
පූග—පුවක්.
පුන්නාග—දොඹ.
කුද්දාල -- කොබෝලීල.
හින්තාල—කිතුල්.
කෘතමාල—ඇසළ.
තෘණරාජ- තල්.
වජ්‍ර - ඉරිවේරිය, ඉකිරි.
වඤ්ජුල—අශෝක.
වඩෙකාල—වැල්මී.
සුරසාල-දෙවවෘක්ෂය, සාල ශබ්ද ය වෘක්ෂපර්යායයි.
දූර්වාර- තුග.
තක්කෝල—තකුල්.
මධූසාල—මීගස්.
පනස කොස්.
ආම්‍ර—අඹ.
ජම්බු- දඹ.
ජපා—වද.
නිම්බතරු—එරබදු.
කදම්භ-කොළොම්
රම්භා—කෙසෙල්.
ජම්භීර—දෙඩම්.
ජම්භාල—ජම්බෝල, මහනාරන්,
ආම්‍රාතකී- ඇඹරැල්ල
උදුම්බර-අත්තික්කා.
සතම්භ ගිරිනිල්ල.
සේවතාම්‍ර-සුදු අඹ.
මාලූර—බෙලි.
ඛර්ජුර—රටඉඳි.
කරවීර—අලරිය, කණේරු

හණ්ඩීර-නාරන්.
සෞවීර—ඩෙබර.
කණිකාර-කිණිහිරි.
සහකාර-මීඅඹ
මාලූර-දිවුල්.
පැරළු-දළ විදහා
නෑඹුල්මුල්-මහමුල්.
තිසල් රෙණු.
දිගන්තර- දිශා.
එලාතුරු-ගස් හෙලා.
පලාදලවලා-දළවලින් පලා.
උකුතලා-බඩතලා.
ප්‍රලයකල-විනාශ කල.
ප්‍රබලබල-අතිශයින් බලවත්වූ
කාලකූටයක්-කළුගලක්.
උදුසඳ-පහලවූකල්හි.
උපුට-උදුරනලද.
සෙල්—ගල්.
කොපුල්බිත—කම්මුල් නමැති
භිත්තියෙහි.
දිව-දුවලා.
නොබා හය රහිතව.
තමල්වැල්—තමාලවෘක්ෂය, වැල්
ශබ්දය ප්‍රශස්තාර්ථයෙහි වේ
තකුල්-කපුකිතිස්ස.
පුල්-උපුල්, නොහොත් පිපියාවූ
කමල්විල්-නෙලුම් තඩාගය.
එසා-එබඳු
කුසුම්තුරු-මල්ගස්.
ගිරිපෙලෙක්දෝ පර්වත පඞ්ක්ති
යෙක්දෝ.
කුළු-කූට.
හිමවීගිරිරදුන්—හිමාලය පර්වත
රාජයන්.
අඳුන්කුළු—අඤ්ජන පර්වතය.
පක්ෂපත්‍ර—පියාපත්.

ප්‍රහරණකොට—සලා, ගසා.
වෘක්ෂකුලකුක්ෂියට—ගස් අතරට,
රතැස්—රත්+ඇස්, රක්තවර්ණ.
ඇස්.
කරස්පස්-බරශ්පර්ශ ඇති
උසස්හිස්—උස්වූ හිසක් ඇති.
කෙලෙස්ලෙස්— කෛලාශය
වැනිවූ.
විශද—ප්‍රකට.
සිත කිරණයෙන්—ශ්වෙත රශ්මි
යෙන්,
ශරදභ්‍රනිභ-සරත් වලාවැනි (වප්
ඉල් දෙමස සරත්සමයයි)
ශුභ්‍රතර-අතිශයින් සුදු.
විභ්‍රම-විලාශය.
වෛවර්ණ්‍ය-නානාවර්ණ ඇති.
විස්තාරවූ-පළල්වූ; පැතුරුණාවූ
විතානාභ්‍යන්තරයෙහි- වියන්
ඇතුළෙහි.
ලම්බමාන-එල්වෙන.
ප්‍රතිබඬවූ-යුක්තවූ.
ධවල ආතපත්‍ර- සුදුකුඩය.
භාසුර-බබළන.

7 පිට.

වෙම්නෙ සඳ-වෙමින් එකල.
තාඩඞ්ක— තොඩු; කර්ණාභරණ
යක්.
කටක—වළලු.
හාර—මුත්හර.
කුම්භසම්භාශ—කල (ගෙඩි) වැනි
ආලේපයෙන්—ගෑමෙන්.
නාරාදියෙන්—මුතුආදියෙන්.
ධූයමාන—කම්පාවෙන.
චමරමෘගවාලයෙන්-සෙමර නම්
මුවාගේ වලිගයෙන්.

වැතිර-වැටී.
අහිමකරවංශ-සූය්‍යීවංශය.
මණිමන්දිර-මාණික්‍යමාලිගාව.
ප්‍රදීප-පහන්වැනි.
විමත නෘප-විරුඩ රජුන්.
සමරසංහාර කෘත්-යුඩය විනාශ කරන්නාවූ.
ප්‍රකොපා- බලවත් කොපඇති.
යුවතිජනනයන- යෞවතියන් ගේ නේත්‍ර.
ආකර්ෂණ-ඇදගැනීම.
ස්වරූප-ආකාරය.
දිවසකර-සූය්‍යීයා.
කරවිසරනිභ- රශ්මි සමූහයක් වැනි.
ප්‍රතාපා-තෙජස් ඇති.
අඛිල ජය-සියලු ජය.
නිජයකල-ස්වකීය කළාවූ.
නිඛිල-සියලු.
ධරණීධරභුජ- කඳුකර ප්‍රදෙශය රක්නාවූ.
මලයප්‍රභූපා-මලයරජු.
කෘෂ්ණ-කලු.
භූධරශිඛර-කඳුමුදුන්.
උභයකොටියෙන් — දෙ කෙළව රින්.
අර්කබිම්බප්‍රතිභ- සූර්‍ය්‍යබිම්බයවැනි.
චක්‍රවලයාකාර චක්‍රයක්සේ වට කුරු.
ඛණ්ඩන-කැඩුනු.
ගණ්ඩස්තල-කොපුල්තලය.
කුරතර-අතිශයින් රළු.
චක්‍ර-වටකුරු.
තීක්ෂ්ණ-තිඝුකරනලද.
විලස්-විලාශ; වැනි.
කෙස්නිවෙස්- කෙශයන්ට වාස ස්ථානවූ.

දෘශ්‍යමාන-පෙනෙන.
කරක්-අතක්.
මෛනාක මෙන්- එනම් පර්වතය මෙන්. පූර්වයෙහි පර්වතයන් ගේ පියාපත් නසනලද න මුත් මෛනාකපර්වතය සැඟ වී පියාපත් රැකගත්හ.
තිමිර ජල- අන්ධකාර නමැති ජ ලය.
මේසකුටයක්-වැසිවලාවක්.
ශ්ලාඝනීය-පැසසියයුතු.
බඳක්- බොන්දියක්-ශරීරයක්.
එලා-හෙලා.
වල්-වනය.
සබල-බලසහිත; ශක්තිමත්.
තුල්-මහත්.
වල්පතක්-වලිශයක්.
උල්සිවුකුරෙන්- උල්වූ කුරසත රින්.
පතුල්තුල්-පතුල් (තුල්‍ය ; වැනි;
පියපතර-පාද ප්‍රස්තාර.
මාර-මාරයාගේ.
මියුරලත්-මධුර අලත්.
ඉඟුරුල-ඉඟුරුඅල හෝ හිඟුරල.
පලවැල කුඩාමහත් ඵල.
විදුරුපල-දෙළුම්ගෙඩි
කලත්-කොල්ලු.
මලබුලත්- මලයතාම්බුල; මල්ල උරුක්කන්.
මූහුන්-මූගහ; මූංඇට.
ඉහුත්-උක්ගසුත්.
කුර කුරකුත්— කුරතම්පලා හැට්ටකුත්.
ගන්ධවාහයෙන්-සුලඟින්.
මල්ලිකා-ඉද්ද.

මාලතී-දෑසමන්.
මාධවී-යොහොඹු.
වෘන්ද-සමූහය.
පිඤ්ජරිතකරන- පීත හෝ රක්තවර්ණ කරන්නාවූ.
නවමාලිකා-සීනිද්ද.
නීලිකා- කළුතලා; නිල් සෙඵාලිකා.
චන්ද්‍රහිම චන්ද්‍රිකාවෙන්- සීතල චන්ද්‍ර රශ්මියෙන්.
නන්ද-ආනන්දජනක.
සෞගන්ධිකා-හෙල්මැලි.
සිලිල්-ජලයෙන්.
ඇඹුල්-ඕලු.
පොල්ගොලුත්-ගොබලුත්.
සමරබිම- යුධ භූමියෙහි.
මදනොමද-බොහෝවූ.
ලපලු-ලාදලු.
නීභෘත-දරනලද.
ජම්භ දෙඩම්.
ජෘම්භමාණ-වැජඹෙන
ආවලී-වැලක්මෙන්.
පිජරාව-පක්ෂිනාදයෙන්.

8 පිට.

රම්භාවලී— කෙසෙල්ගස් සමූහයෙන්:
සදන්කුල-ඡද්දන්ත කුලයෙහිවූ.
මදන්කුල- මත්තහස්ති සමූහය.
විතරකුත්-විස්තාරයකුත්.
මුණ- අග;
කොළ!- බොල! ආමන්ත්‍රණයෙහි
ශර-ඊය.
ශකුනි-අඬසටිය.
තාරාවසන-ඊතල වෂීංව.
ශඞ්කු-හෙල්ල.
වෛතාලිකා- කැත්ත.
කුන්ත-කොන්තායුධය.
මුද්ගර-මුගුර.
ඵරශු-පොරව.
චන්ද්‍රහාස-කඩුව.
චක්‍රඅසි -චක්‍රායුධය.
කවච-යුධසැට්ටය.
සන්නාහ-යුධ ඇඳුම.
සන්නද්ධ- සන්නාහයෙන් සැරසී
පටහ- යුධයෙහි පාචිච්චිකරන බෙරය.
දුන්දුභී-බෙර.
මුරජ-මිහිඟුබෙර.
ඪක්ක-එනම් බෙරවිශේෂය.
මද්දල-මිහිඟුබෙරයටබඳු වාද්‍යයක්
පණව-ගැටබෙර.
තාල-කයිතාලම්.
කාහල-නලාව.
ඩමරු-කබලින් රුකෙන යොගීන්ගේ එනම් වාද්‍ය විශේෂය
මඩ්ඩු-ඩමරුවම මහත්වූයේ. මඩ්ඩුනම්.
ඩිණ්ඩිම-පණාබෙර.
ශුෂිර- හුණ කුලල්
ඣර්ඣර එනම් වාද්‍යභෙදය.
ඝන- කුළුතාලම්.
ඣල්ලරී- වාද්‍යභෙදයක්.
වේණු-හුණදණ්ඩ.
වෙණු- වීණාව.
මෘදඞ්ග-මිහිඟු බෙර.
පසඟතුරු- ආතතය, විතතය, ආතත විතතය, ඝනය, සුෂිරය යන අඞ්ග පසින් යුත් තූර්යය.
යුගන් සැඩනලිති- කල්පාන්ත චණ්ඩ මාරුතයෙන්.

සත්සයුර-සප්ත(සිදන්ත)සාගරය
දෙපිට-උභයපාර්ශ්වය, දෙපැත්ත
වපුට-වපුරනලද, සිටුවනලද.
රුරමින්-සූරමින්.
උඟරමින්-උතුරුවමින්.
කලව්වක්- බලමණ්ඩලයක්, කම තක්.
ඔත්පලින්- ඝොත්තැතින්.
බුරවමින්-ශබ්දකරමින්.
ඇදයමැඩ-ඇදලා
තබය-තියපොත්ත.
තරාසයෙන්- මහත් උත්සාහ යෙන්.
වහසල-දොරටුව.
හිමි උස්.
ඉලඞගම්-කෝලම්.
කුඩම්-කුඩා ගෙවල්.
මඩම්-මහාශාලා.
ශෘඞග-අං.

9 පිට.

සඞගීයමාන- මොනවට ගීතිකා කරනු ලබන්නාවූ.
පඞකජල-මඩ හා දිය.
පඞකජ-නෙලුම්.
ශෘඞගාර- කාමරතියෙන්වූ ලීලාව.
ශ්‍රීරඞග- ශ්‍රී රූපය.
රිෂ්ටවන- අරිෂ්ට (තපුරු) වන් නාවූ.
චරණපද- ඇත් පියවර.
පිෂ්ට- පිටි.
නෂ්ට-විනාශ.
විෂ්පෂ්ටවූ-ප්‍රකටවූ.
පරපුෂ්ටයන්-කොවුලන්ගේ.
බණ්ඩනු-නොකැඩුනු.
සණ්ඩයන්-සමූහයන්.

හෙණ්ඩුකෙළි-පන්දුක්‍රීඩා.
එල්ලවන-ඉලක්ක වැන්නාවූ.
ඵුල්ල-විහත්.
ඇල්ල-තිර්ඛර.
වැල්ලතල -වැලිතලා ඇති.
බිල්ලවන-බෙලිවනය.
සල්ලකී—ඉදුසල්.
ගොල්ලකින්-සමූහයකින්
නුවූදන-අවිද්‍යමාන ජනයන්.
කලන්කිය-කැලල්
ඇලින්—ශාලිව්‍රිහියෙන්
පත්තුකල—දල්වූ.
ඔසල රුස්වූ.
මොල—වණ්ඩ.
ඉන්දිරාවාස-ශ්‍රීදෙවියට වාසවූ.
සරුබන්දි-සාරත්‍වයෙන් බඳනා ලද.
උක්කම්න්—උත්කර්ෂයෙන්.
දුක්කරින්-දුෂ්කරයෙන්.
සරිය-සමානව.
පල්ලමින්—ප්‍රපාතයෙන්.
එලා-හෙලා.
ලොල—චඤ්චල.
කලෙලොල මහරුල.
ඵේනාවලීපාලියෙන්- පෙනවැල් පෙලින්.
සලෙස-චඤ්චල
සිඳුසිලිල්-මුහුදු දිය.

10 පිට.

වෙයින්-මාගීයෙන්.
ඔඩිනෙතර- ඔයින් එතර, ඔය නම් කුඩා ගඟකි.
අතලගල-එනම් ගම නොහොත් ගල්පොත්ත.
ලග්නොවී —නොලැඟ
අරම්රම්— ආරාමවලින් රම්‍යවූ.

උරග-සර්ප.
නිකරකර- රශ්මිසමූහය.
තඹරකර—තාමරසරශ්මියට.
නිසරුකොට—නිගාකොට.
ශඵර-පෙටියා.
තලමීන ඉස්සා.
පාඨීන-පෙටියා
ශතවඞ්ක-එනම් මත්ස්‍යයා.
රොහිත- රේ (මස්).
ශඞ්කු-ඒනම් මත්ස්‍යයා.
කුම්භීල-කිඹුලා.
මුඤ්ජ-එනම් මසු
අමර-ආඳා
ජලූකා-කුඩැල්ලා.
ප්‍රභෘති-පටන්කොට ඇති.
ජලචර-මත්ස්‍ය.
ශිශිර-ජලය.
එපායින්-ඒ ප්‍රාසාදවලින්.
ගොමුපෙලින්-ගුම්බ පඞ්ක්තීන්.
තුරුසන්තාන-වෘක්ෂසමූහය.
තාලීසපත්-තලිස්පතුරු.
අරිෂ්ට-කොසඹ.
තින්දුක-තිඹිරි.
කාරඤ්ජ-කරඳ.
සින්දුවාර-නික.
පාටල-පළොල්.
අශොක-හෝපලු.
ගිරිමල්ලිකා-කෙලින්ද.
යුග්මපත්-කොබෝලිල.
සප්තලා-දෑසමන්.
නිර්ඛජාකුල-ගඟුලැල්ලෙන් ගැවසීගත්.
පඞ්කජිනි-පියුම්විල්.
හරිතතෘණ—නිල්තණ.
අද්‍රිතටයෙන්— පර්වතතලයෙන්.
ගොකණ්-ගෝන්නු.

වෘෂ-වෘෂභ.
සාරඞ්ග-චිත්‍රමෘග.
හරිණයුත්- මුවන්ගෙන් යුක්ත.
කමල්-නෙලුම්.
ලහෙල්මැලි-ලා කහ්ලාර.

11 පිට.

සථූල-මහත්.
රත්නපට-රුවන්පට්ටය.
හස්තවිභූෂණ-වළල්ල.
අවුල්හර-පතාව.
මෙවුල්බර-මෙඛලාභරණය.
නූපුර-සිලම්බු, පාවලලු
සිවුසැටක් අබරණින්— හැටසතරක් ආභරණයන්ගෙන්
1 රන්පටි, 2 රුවන් සෝළු, 3 නාගවඩම්, 4 කාදුකාප්පු, 5 මුතුපට, 6 පට්ටෝඩම්, 7 බාහුදණ්ඩ, 8 මිණිකෙවඩම්, 9 ගිගිරිවලලු. 10 හස්තාඞ්ගුලි, 11 හස්තමුද්‍රිකා, 12 කෙපෝට්ටු, 13 අඞ්ගදාභරණ, 14 එකාවැල, 15 කණ්ඨාවතංශ, 16 ග්‍රීවාභරණ, 17 පදක්කම්, 18 කණිසුතු, 19 මනීබඩි, 20 ගල්මුතු මාල, 21 රන්මුතු මාල, 22 ගෙල මුතුමාල, 23 මිණිමුතු මාල, 24 දශීනමාල, 25 නිල්මුතුමාල, 26 රන්පෙති මාල, 27 ලියරන්මාල, 28 රුරන් මාල, 29 වටරන්මාල, 30 තුන්කොන්මාල, 31 සිවුකොන් මාල, 32 හස්තපෝට්ටු, 33 මෙඛලාදම, 34 පස්රු, 35 පස්පෙරගැර, 36 සත්රුවන් වැල, 37 රන්සවඩි 38

රිදී සවඩි, 39 මුතු සවඩි, 40 සත්රුවන් සවඩි, 41 රන් මිණිසවඩි, 42 කෙයූර, 43 ඌරුජාල, 44 ඉනහැඩ; 45 උදරබන්ධන, 46 මකරපට, 47 තලල්පට, 48 පාදශඞ්ඛලා, 49 පාදාභරණ, 50 පාදජාලා 51 කිඞ්කිණිකජාල 52 පාදඞ්ගුලි 53 පාද ජඞ්ඝාවලය, 54 පත්‍ර වළලු, 55 සත් දම් 56 මුතුදම්, 57 රන්දම්, 58 රිදීදම්, 59 මිණිදම්, 60 මුත්හර, 61 අවුල්හර, 62 සිඞ්ඛවුනු, 63 ව්‍යාඝ්‍ර ඔටුනු, 64 සිංහ ඔටුනු.

සරා-සරසා.
පසක්-ප්‍රත්‍යක්ෂ.
කැත්-ක්ෂත්‍රිය.
නිරුඩාධාර- නැතිකිරීමට ආධාරවූ.
භුජවික්‍රම-බාහුබලය.
අර්ජිත-රැස්කරනලද.
රුවින්-නාදයෙන්.
කුවලය-උපුල්.
ව්‍යාප්ත-ව්‍යාපත.
අවලම්බිත-එල්වනලද.
අතිසුරභි-අතිශයින් ශුභට ගන්ධයක්වූ.
මෘගනාභි ගන්ධයෙන්- කස්තූරි ගඳින්.
ආලේපයෙන්-ගෑමෙන්.
ආමෝද-පැතිරෙන සුවඳ.
වින්‍යස්ත—වින්‍යාශකරනලද.
වෙදිකාවෙන්— බරාදෙන්, පිලෙන්.
සවසමයාණිව-ස්වකීය ආගම් නමැති සමුද්‍රමථනයට.
සුසමය—යහපත් ශාස්ත්‍රය.
අභිරාම—සිත්කලුවූ.
හරමිත්‍රවූ— ඊශ්වරයා තුටුකරන්නාවූ.
කුමුදිනී—උපුල්විල.
විගත—පහවූ.
පාපාරි—පාප සතුරන් ඇති.
අක්‍රම—මැඩියනොහැකි.
සත්ක්‍රමාදී— යහපත් නීතික්‍රමාදියෙන්.
වැඩිසිතින්- අභිවෘඩි චිත්තයෙන්
දිගා-දීර්ඝායුෂ.
ශතාධික-සියයකින් වැඩි.
හඬියෙන්-සතුටින්.

කුවෙණි අස්නෙහි

**ගැටපදවිවරණය නිමි.**

---

## 12 පිට.

අමෘතකරරුද්‍ර- චන්‍ද්‍රරශ්මිය.
හරඅද්‍රි- ඊශ්වරයාගේ පර්වතය (එ
 නම් කෛලාශය)
ශරද භ්‍රමය— ශරදවලාහෙන්වූ.
ඉන්‍දු— චන්‍ද්‍ර
ගඞ්ගසුර— සුරගඞ්ගා, අහස්ගඟ.
දධි- දී.
විස්ඵුරිත- පැලඹෙන.
ශතපත්‍රමිත්‍රවරගොත්‍ර- නිලමණි
මිත්‍ර— සූර්‍ය්‍යවංශ යට නිල් මැ
 ණික් පහනක් බඳුවූ
මෘගරාජ— සිංහ.
ගිරිරාජධෘති- මහමෙරසේ ධෛ
 ර්‍ය්‍යය ඇති.
රාජදින— දිනරාජ; සූර්‍ය්‍යයා.
රාජකුල ප්‍රණත - රාජ සමූහයා
 විසින් වඳිනලද.
ඛග— නවග්‍රහයෝ.
ඉන්‍ද්‍රවර— ශක්‍ර රාජයා.
මකුටමණි— ඔටුනුමිණි.
භ්‍රමණයෙන් — සිසැරීමෙන්.
චරණාරවින්‍ද— පාදපද්මය.
සුරද්‍රුම— කල්පවෘක්‍ෂය.
දහම්රජතුමන්- ධර්මරාජයන්.
චක්‍රකර— ආඥවෙන් ජනිතවූ.
රුද්‍ර- දූෂිවූ (තෙජසින්)
අක්‍රම- මැඩිය නොහැකි
චක්‍රවාළ චක්‍රවර්ත්ති- සක්වලෙහිප
 වත්වන ලද අනසක ඇති.
චක්‍රවලයාකාර— චක්‍රයක් සේ
 වටකුරුවූ.
අගල්ඛිත— පරිබාහිත්‍ර්‍යය.
සුඛකාමී— සුඛප්‍රිය.
උපචිත- රැස්කරනලද.

සප්තරතන— සත්රුවන් (රන්,
 රිදී, මුතු, මැණික්, වෛඩූ,
 ය්‍ය,දිමන්ති).
ආනන්ද ස්ඵටික— සඳකතපහන්.
සොපානමාලා-තරප්පිපෙල.
ඡදනාග්‍ර -- පියසිකොළවර.
අවලම්බමාන— එල්වෙන.
මුක්තාලතාකුලිත— මුතු වැලින්
 අවුල්වූ
රාවමුඛරිත— නාදයෙන් ගැවසී
 ගත්.
ජනවරාකුල— ජනයාගේ හැසිරී
 මෙන් ආකුලවූ.
ආපණාතිල(ය)— වෙළඳහල්
ගෙම්ණිසිළු-ගෘහප්‍රදීප සිඛාකාර
 (ගෙයි පත්තුවෙන පහන්
 දැල්ලක් වැනිවූ.)
යුග්මදන— කොණ්ඩදෙක.
රම්භාකාර-කෙසෙල්කඳන් වැනි
වාරුරු—මනොඥ කලවා.
පුළුලුකුළු— පළල් ජඝන.
ආවත්— වට.
ප්‍රභාන්ත—කාන්තිමත් මුහුන.
කුවලදල— නිළුපුල්පත්‍ර.
සුර සුන්‍දරි සදිසි — දෙව්ඟනන්
 වැනි.
පුරඹ-පුරස්ත්‍රී.
සරන- සඳවරණයකරන.
ගෙදිගුවිල්- ගෘහදීර්ඝිකා තඩාග.
සිසිර— ශීතල.
නීර — ජලය.
ජලනීලි- සෙවෙල්.
කුම්භිකා— දියපරණලා.
රාජීව- පියුම්.
ශුචිපණ්- සුදු නෙලුම්.

ශශිප්‍රිය- නිල් උපුල්.
මුදිත- සතුටුවූ.
රැවින්— රාවයෙන්.
වරල්- කෙශකලාපය.
කමල්වත්- පද්ම නමැති මුහුන.
ලිහිණි විල්— විල්ලිහිණි.
දුවන්— ජඝන, උකුල.
සිංහකෙශර- මුහුණමල්.
කණීපූර— මාරගස්.
චම්පක- සපු
කාරම්භ— පුවඟු.
කරවීර— අලරිය.
ත්‍රිසුගන්ධ— ත්‍රිජාත, (එන්සල්, කුරුඳු, කොල්ලන් කොළ.)
කකීරී— කැකිරි.
කෘෂ්ණලා— හුනිඳ.
ජීමූත- දෙවදලී.
එනිංල්ලි— බුලත්.
රජන- රත්සඳුන්.
ආමොද— ඉතා විහිදෙන පෙම් කරුසුවඳ.
භෘඞ්ගසඞ්ගීත ධූමාවලී භ්‍රමර-භෘත්‍යනමැති දුම් වළල්ලෙන්.

**13 පිට.**

සින්දූර බින්දු සංදොහ- සින්දුරම් චූර්ණයෙන් කරණලද බින්දු සමූහය.
අවනිතල- පොලෝ තෙලෙහී.
සතහඞ්ගි- සප්තාඞ්ගයකින් පිහිටි. (එනම්: ගිවුපා සොඬ, වලිගය, ලිඞ්ගය, යන ස්ථාන.)
ගිරිමෙඛලාකාරවූ— එනම් ඇති වසවත්තී මරුගේ ඇතු වැනිවූ
දිගන්තර- දිශාවන්හි.

සතුන්— සත්‍රින්.
පතනොත්පතන- (පතන උත්පතන) වැටීම නැඟීම.
ඛුරසඞ්ඝට්ටනෙන්— කුර ගැටීමෙන්.
රජනිකරකර— ධූලි සමූහයගේ රශ්මියෙන්.
නෙමිණි- නොයෙක් මැණික්.
ඉන්දුකුන්ද— චන්ද්‍ර හා කොඳ.
විභාසුර— විශෙෂයෙන් බබලන
කුන්ත—කොන්තායුධය.
තොමර— හෙල්ල.
චාප — දුන්න.
චඤ්චක්‍ර- ජීවිශෙෂයක්.
නිඛිල - සියලු.
රිපුකක්ෂ — ශත්‍රුපක්ෂය.
ත්‍රිවික්‍රම - විෂ්ණුවබඳු තෙජසින්.
නිහඟ ශතතුරූප -- අනඞ්ගයාගේ දෙහ ශ්‍රී සදෘශවූ.
නයනාභිරාම- ඇසටප්‍රිය.
මඤ්ජු — මධුර.
විත්‍රභාෂණ-විසිතුරු වචනයෙන්
නිලිණ— ත්‍යාගය.
පාරිජාතවූ— දිව්‍යවෘක්ෂය.
භුජමඤ්ජර -- බාහු අතර) නමැති ගෙය.
ලක්ෂ්මී- ශ්‍රීදෙවිය, විෂ්ණුභාර්‍යාව.
තෙසක්- උත්සාහ මන්ත්‍ර ප්‍රභු යන ශක්ති තුන.
සිවුපා— භෙද; දණ්ඩ, සාම, දාන, යන උපාය සතර.
සතහ— අමාත්‍ය, මිත්‍ර, කොෂ්ඨාගාර, ජනපද, දුර්ග, සෙනා පුරවැසි, යන අඞ්ගසතයි.
දශරාජධර්ම— රාජධර්මදශය.
(දාන, ශීල, පරිත්‍යාග, ආර්ජ්

බ`. මෘදු බව, තපස, ක්‍රොධ නොකිරීම, හිංසා නොකිරීම, ක්‍ෂමාවීම, විරුඬනැතිබව යන දශය.
සිකිපිල්— මොනර පිල්.
තරිදු අඹ— අඹි වන්‍දයාසේ.
ගඟන=ඝ්‍රාණය, නාසය.
රණකුස— රන් අකුස්ස.
තිබා— තිභ, සදෘශ.
පියුඹුවන— පියුම් + උවන, පද්ම නමැති මුඛක.
දසනපෙල— දන්තපඞ්කතිය.
අදර—අධර, තොල්.
රතිඟුල්— රක්තහිඞ්ගුල.
කුඹුකු— කුම්බක, පුඑක්.
හසතෙව්— හංසයන් වැනි.
පණිඳුබුජ- නාගයන් වැනි බාහු ඇති.
සලා— සුලි.
නැබා— නාභි ඇති.
කිරිඳුකර— ඇත්සොඬ.
පැලරඹා— කෙසෙල් පැල.
සිරිදු— ශ්‍රීකාන්තාව.
උරැයුගල— කලවාදෙක
පුබුදුනු— නොපිපි.
දුනුකේ— ධනුකෙතකී.
විබා-විශෙෂයෙන් බබලන්නාවූ,
සතන්— සත්ත්වයන්
සොබා— ශොභා ඇති
එරජකමනී- ඒ රාජකුමරියගේ.
සැඤ්චිත— රැස්කරනලද.
ගර්භමඞගල්‍යය— ගැබ් මඟුල.
සප්තාහයක්— (සප්ත + අහ) සත් දිනක්.
මඤ්ජූෂ— පෙට්ටිය
සසදර— චන්‍ද්‍රයා.
තුරුණු— තරුණ.
(?)යමාන— සලනුලබන.
(?)රඹ—වරාංඞ්කා, උතුම් ස්ත්‍රීන්.
නිපුණ— දක්‍ෂ.
(?)ලා— හලා, බහා.

14 වෙ.

බොලුපයි— කාවති පසුම්බිය.
නදන— නඳැති, දුව.
වලා—මිනයෙන්
මිගිදෙකු— සිංහයෙකු.
පල්ලවා— මිහන්වූ
සුපිපුල්ලුව— මිහන්වූ.
විදුරැගිරි බිතසේ— වජ්‍ර පර්වත භිත්තියක්සේ
අතුරුදෙව— අතරක් නැතිව.
නනවි— නන් + අවි නානා ආයුධ.
මදුරසෙල්— මන්‍දර පර්වතය.
එසාපා විමන— එකාසප්විහගෙය.
වෙපුලලවා— වෙපුලල පර්වතය සේ.
පලුමලින්— දලු හා මලින්.
රාජීයෙව්— රොදක්මෙන්.
අභ්‍රකූටයෙන්— වැසි වලාවෙන්.
භ්‍රැයුග්ම— දෙබැම.
සංකාස— සමාන.
කණිපුරදල— තිලුපුල්මල්පෙති.
රුදු පුෂ්ප— වදමල්.
ජාලක— දැල.
කඤ්ජි— අනඹගයා
රියවිකු— රද රොදය වැනි
තපනීය මිහිඟුවන්— රන් මිහිඟු බෙරයක් වැනි.
ගෙල— ගල, බෙල්ල.
කාඩිරා— මිහනහර
ජුල්ලදම්— පිපියාවූ මල්දමක්.
මොලොකස්- මොලොක් + අත්.
සගාති ඉහ— සඬුගයක් වැනි.
හලිනී— රන්ලිය.
රතතුල්ල- රතු අතුල්.
කරජ— ඇඟිලි ඇඟ
කුචකුම්භ— තන (පයොධර) කලස්.
තුල්ල- සමාන.
සපදපෙල— හංඩගපඩ්කාති.

චසා රෞද- නාභිය හාත්පස්හිවූ රෝම රාජිය.
පෘෂ්ඨ— පිට.
පුලින- වැලි.
පුවරු- ලෑල්ල.
මට — මට්ටම්.
සිලුටු— ශ්ලිෂ්ඨ.
සිඳු- සින්ධු, සාගරය.
දහ – ජන්ඝා, කෙණ්ඩය.
පණ්හි— විලුඹ,
පෙඳවටෙව්- පන්දුවක් සේ වටවූ.
රජනිකර — චන්ද්‍රයා.
ජෝතිමාලා- රශ්මි මාලාවෙන්.
අමල- නිර්මල.
වතල- ව්‍යාප්තවූ, (ගැවසුනු)
නවරුවන්- නවරත්නය.
දිවමතුරු- දිව්‍යමන්ත්‍රය.
දපනයට- ජපකිරීමට.
අනුරාගනල- රාගගින්න.
හිමඃකින්- වනයකින්.
විලඹුවන්- තඩාග නමැති අම්බිකාවන්.
අවරගට- අපරපර්වතයට.
සතරඟින් යුත් අඳුරු— මාඝේ පෝය. වනලැහැබ, වැසිවලා, මධ්‍යමරාත්‍රිය, යන අංග සතරින් යුක්ත අන්ධකාරය.

**15 පිට.**

විමන්වත්— විමාන වස්තුවෙහි, රජමාලිගාවෙහිවූ.
සොරා— සැහවී.
වෙයට- වීදියට
අබිසරුව— අභිසාරිකාවක් සේ, අබිසරු නම් පුරුෂයා කී තැනට යන ස්ත්‍රියයි,
එදිගුනෙත-ඒ ස්ත්‍රිය, ඒ කුමරිය.
ලොමොනකම්පයෙන්— ලොම් ඩැහැ ගැනීමෙන්.
ලඑරටට— ලාටරටට.
සෙල්— සෙල, ගල්.
බෑවුල්- බෑවුම, ප්‍රපාතය.

දද්දුරු— ජර්ජර.
ජලචර- මත්ස්‍ය.
සීකරාසාර- ජලබින්දු ධාරාව.
නිජ්ඣලිත- හාත්පසින් බබලන.
ස්කන්ධ — කඳ.
භෘංගාරී— රැහැසියා.
කුරර— උකුස්සා.
සකුන්ත-- ගොෂ්ඨ කුකුට පක්ෂියා.
අනන්ත- (අන් + අන්ත) කොණක් නැති.
කටරුහ- කොපුල් පෙදෙසින් හටගත්.
දන්තිදන්ත- ඇත්දත්.
ගිරි තලාවෙක— පර්වත තටයෙක්හි.
විදුරු සෙල්- වජ්‍ර පර්වත.
අනිඤ්ජිත- නිඤ්ඤ නොකරන ලද.
ස්ථාපිතෙන්- තැබීමෙන්
අලාත චක්‍රයක් ගිනිපෙනෙල්ලක් කරකැවීමෙන් සෑදෙන චක්‍රය.
චෘතොතාපචිතව-කචාකාරයෙන් සිටගෙන.

අශනි හෙන.
චතුර්විධ යොජනායාම- යොදුන් හතකරක් දිගින්
නුතුරුවා- පිටනොකරවා.
පිම්මවලහා- පැනීම වලක්වා.
ත්‍රිමද- දෙකපොල, ලිඟුව යන තුන් ස්ථානයෙන් වැහෙන මදය.
කාලගිරි- කළුගලක්.
සෙන- අශනි, හෙන.
නබපඤ්ජරෙන්- නිය පොත්තෙන්.
මජ්ජ- හිස්මොල.

**16 පිට.**

පුෂ්පමඤ්ජරී- මල්කැන.
කෙළිදෙලෙන්- ක්‍රීඩා ධූරයෙන්.
මූවින්දර- මෘගෙන්ද්‍ර.

හීහිලද- කුමරියගේ හීහිය
ප්‍රසුන්තර- විනාශකොට.
සලදෙර- ගල්දෙර.
නොකම්සින්- අකැමැත්තෙන්.
සිඟුවලඟ- සිහින්වූ මධ්‍ය ප්‍රදේශය.
දලවිසේ- මහත්විය.
බඳවද කුසුම්- වදමල්.
තවුන්- අළුත්.
සුන් බඳුන්- බිඳුනු වලන්.
ගුරු- ගුරු ගල්.
පලාපල-කුඹාමහත් ගෙඩි, නොහොත් මහත් කුඹා ඵල
කමදවා- කම්ජ වාතය.
දෙබින්නක්- දෙන්නෙක්.

**17 පිට.**

මෙමුත් - මෙසින් මිදීමට.
මදමන්- අනඞ්ගයා.
වග— ව්‍යාඝ්‍ර.
අපිස්අතුරු- නොසිතියහැකි අන්තරාය ඇති.
කතරකින්- කාන්තාරයකින්.
මේකුළ- මේඝකූටය, වැසි වලාකුළ
සෙබළු- සෙවාහට.
උපහාරයෙන්- දීමෙන්, පිදීමෙන්.
ජවනිකා- කඩතුරාව.

**18 පිට.**

විතෙහි- වෂක (කෝප්ප) යෙහි.
දද- මුග්ධ, මෝඩ.
ඉමන- නාද.
දසන- දත්.
කුල්නද- කුල්මත්ව කරන නාදය.
දලග- කොලඅගින්.
නොමදිනේ- බොහෝවූ.
බලාවැල- සොක්රල.
වත්- මුහුනු.
හස- සිනහ.

අසෙනිව- ක්‍ෂුධාශුකනාව.
උදයගුඩර- උදයපර්වතය.

**19 පිට.**

නිමල්කල්- නිර්මල කාන්ති.
අතරමින්- බැසගනිමින්.
විහාසුර- විශේෂයෙන් බබලන.
ප්‍රභාකර නිභ- සූර්යා වැනි.
අමිත- අප්‍රමාණ.
ගුගුළ- ඝෝෂාකරනලද.
ගම්දූරියන්- ග්‍රාමදූරිකාවන්.
මයුඛජාලයෙහි- රශ්මි ජාලාවෙහි.
උරිරුජලන්- රුධිර (ලේ) ජාලාවන්.
අයුරුවා- ආකාරයට.
ජෘම්භමාන- පැලඹෙන.
ජම්භාරිවාරණ-- ශක්‍රයාගේ හස්තියා.
සිදුරු වන තුම්බ- නිකවන පඳුර
උතුරු සළු- උත්තරසාටකය. ශරීරයෙහි උතුරු පාර්ශ්වයෙහි පළඳින හෙයින් මෙනම් විය.
හන්පලන්- ඇන්දවූද, පැළැන්දවූ.
දුහුල්කඩ- දුකූලඛණ්ඩ, එනම් රෙදි වර්ගයෙන් කැබෙල්ලක්.
කොලතු- කොල + අතු.
ඉගේ- ඉනෙහි.

**20 පිට.**

අමුතුරණමෙව්වගේ- අමුතු යුධයක් වැනි.
අත- ආත්මය.
නිබද- නිතර.
ලොබාවෙන්- ලොභයෙන්.
රන්සුබාබෙන්- රත්න ස්වභාවයෙන්.
මන්මද- අනඞ්ගයා.

ඉබාතන නැතින්- ගණ්ඩෙදවියන්ට බඳු නුවතින්.
සොමිසරද- ශරත් චන්ද්‍රයා.
හඩ'සමින්- හඩ + අසමින්.
පබඳ- මහත්.
දිරද- ධෛර්‍ය්‍යය.
භ්‍රමණවිභ්‍රමයෙන්- කරකැවීමෙන් හා විශෙෂයෙන් කරකැවීමෙන්.
ඔත්පලින්- හොත් (උන්) තැනින්.
විසපු- විෂ පොවනලද.
අයා- ඇද.
දෙරණ- ධරණිය, පොළොව.

**21 පිට.**

සුතනඹුන්- (සුතන් + අඹුන්) දරුවන් හා අඹුව.
වැවෙති- ඉවසාද.
තුල්ඉබා- මහත් හසතින්.
පලරුසේ- ගෙඩි සමූහයක්.
කුසේ- කුක්ෂියෙහි.
සුතපිසස්- යක්ෂයා.
පල- විපාක.
වාවිතිය- ඉවසන්යයි.
ලසේ- සිත්වූ පරිද්දෙන්.
තැඹුල්- මහත්.
කුහුල්- සැකය
සිරුර සියරසින්- ස්වකීය ශරීර රශ්මියෙන්.
බර- භාර
තබාගෙන සිතුම්ණේ- චින්තාමාණික්‍යයක්මෙන් සිතෙහි තබාගෙන
ඉසුරු- ඊශ්වරයා.
උවසනන- ප්‍රාණීන්, ඊශ්වරභාවයෙන්
විලුඹුවක- විල්තණුවකගේ

**22 පිට.**

මිතුරු- සූර්‍ය්‍යයාගේ.
සිළු- රශ්මිබිඳු.
සිතුරුමන- චින්තාමාණික්‍යයක් වැනි.

වනසොසුලා- විරහ ශොකය උසුලා.
මියුඩුහුරුලා- ශොකයෙන් යුක්ත සුසුම්ලා.
එමුත්රද- ඒ මුතනනුවූ රජු.
සගසැප අත්කර- මැරී.
හශීණව- සනෙතාෂව.
දූතිමොහොර- දූතිමෝරු, එතමතස්‍ය.
කුමසිර- කිඹුල්ලු.
නිර- ජලය.
කදීම- මඩ.
එතුරුලිය ලැහැප්- ඒ වෘක්ෂලතා පඳුරු.
ශුෂ්ක- වියළි.
සිසිකිරණපට- චන්ද්‍ර රශ්මි නැමැති වස්ත්‍රය.
මැවු- මවනලද.
තිවට- මහබඹු.
ලකර- මහත්.
වෙත ගෙන්වමින්- විවාපත් වෙමින්.
බෑයන්- සහෝදරයන්.
අසඹුවක්- වෙළඹක්

**23 පිට.**

බූපිසස්— භූත පිශාච.
මතුරුකුල—සූර්‍ය්‍ය වංශයට.
තෙරින්— තීරයෙන්.
එයා— ඒ යකඩ.
එවක්— එදා.
තිදස්පුර — ශක්‍රපුරය.
තියෙන්— තබයෙන්.
පත්අස්නක්— හසුන්පතක්.
නිරුඩව — මැරී
භානු— සූර්‍ය්‍යා
පීත — පිරුණු
තපා— තවනලද.
කිශලය— දලු
ශතපත්‍ර වනමිත්‍ර ශුචිගොත්‍රවූ — පවිත්‍ර සූර්‍ය්‍යවංශ ඇති
කුමුදුමිත්‍ර — චන්ද්‍ර.

තරිඳු— තාරසොඳු, චන්ද්‍රයා.
සැපත්වන— සම්ප්‍රාප්තවන.
අරිෂ්ටයන්— නපුරු පුද්ගලයන්.
කොහෙලි— කොඩි විශේෂයක්.
විෂ්ටරසපුත්‍ර— රාජපුත්‍රවූ.

**21 පිට.**

සන්තානාවෙනෙහි— එනම් වන
    යෙහි
සවසන්තානයෙන්- තමාවෙතින්,
වෙසැර— වෙෂය හැරලා
වැදිමූළුත්— වැදි සෙනගත්.
සමුදු—මුද්‍රසහිත
කොවඹම්-එනම්ආභරණයෙන්,
තුන්දෙළොස්— සතිස්.
තුරු නදින්— තූර්‍ය්‍ය නාදයෙන්.
තෙද— තෙජස.
අණසක— ආඥ චක්‍රය.
තම— අන්ධකාරය.
සහස්කර - සූර්‍ය්‍යා
හෙමතිලය සුදර- සවර්ණ මන්දිරා
    භ්‍යන්තරයට.
මණිමිත්‍රවූ— මාණික්‍ය ප්‍රදීපයක්
    වැනිවූ
මුණුසැට— මුහුණු සය.
අමරගුරු—බෘහස්පතී.
මෙධතිභ— ප්‍රඥවට සමවූ.
නිතු— තොරතොවී.
වික්‍රමාදිත්‍යවූ— තෙජසින් සූර්‍ය්‍යා.
    බඳුවූ.
ලලතකර- උද්දීප්තයෙන්
සිවුසැටකලා - 1 අක්‍ෂරය, 2 ලි
    ඛිතය 3 ගණිතය, 4 මණිත
    ය, 5 තර්‍කය, 6 ව්‍යාකරණය,
    7 ඡන්දස්ය, 8 නිඝණ්ඩුය 9 අ
    ලඞ්කාරය10ශාලීය,11ගොත්‍ර
    ය, 12 මන්ත්‍රය,13 තන්ත්‍රය,14
    යන්ත්‍රය, 15 ආත්මොදකය,
    16 ජ්‍යොතිඥනය. 17 ඉති
    හාසය, 18 පුරාණය 19 අග්
    නිස්ථම්භය, 20 ජලස්ථම්භය,
    21 කුච්මාරය, 22 කූපශා
    ස්ත්‍රය, 23 සූපශාස්ත්‍රය, 24
    කාම ශාස්ත්‍රය, 25 ශාස්ත්‍ර
    විත්‍යාශය, 26 ශාස්ත්‍ර කර්මය,
    27 අශ්වාරොහනය, 28 අවි
    කසමාරණය, 29 මාරණය,
    30 මොහනය, 31 ස්තම්භන
    ය, 32 උච්චාටනය, 33 ත්‍රො
    ටනය, 34 දූරගමනය, 35
    දූරදර්‍ශනය, 36 භෙරි ත්‍රොට
    නය, 37 පත්‍රචෙඡ්දනය, 38
    චිත්‍රකර්මය, 39 මාලාබන්ධන
    ය, 40 ගන්ධයුක්තය, 41 දූත
    ය 42 භරතය, 43 ස්ත්‍රීලක්‍ෂ
    ණය,44පුරුෂලක්‍ෂණය,45න
    පුංසක ලක්‍ෂණය, 46පරහිත
    ඥනය, 47 කනකපරීක්‍ෂාය,
    48 රතනකපරීක්‍ෂාය 49 වා
    තුර්වාදය 50 ධාතු වාදය,
    51 බිල්වාදය, 52 කර්‍ණ්‍යාවා
    දය, 53 ආකර්ෂණය, 54 ආ
    කාශ ගමනය, 55 ශිල්ප්‍යකර්
    ය, 56 කෘෂිකර්මය, 57 හෙම
    කර්මය, 58රතන පරීක්‍ෂාය,
    59 කඩරණය, 60 ශුද්‍යානය,
    61 අදෘශ්‍යකරණය, 62 පර
    කාය ප්‍රවෙශණය, 63 වෙ
    ණු වීණාවාද්‍යය, 64 විෂ හ
    රණය, යන මොව්හු වෙත්.

මෙසේද සූසැටක් දක්නා ලැබේ.

1 පදය,2වාක්‍යය,3ප්‍රමාණය,
4 ධර්මශාස්ත්‍රය, 5 රාජනීතිය,
6 ව්‍යායාම විද්‍යාය, 7 ආයුධ
ශිල්පය, 8 රථාචාර්‍ය්‍යය, 9
ගජාරොහණය, 10 අශ්වා
රොහණය, 11 වාද්‍යය, 12
නෘත්‍යය, 13 ශස්ත්‍රය, 14
ගන්ධර්ව වෙද විශෙෂය, 15
හස්තිශික්‍ෂාය, 16 තුරඞග ව
ශොඥනය, 17 පුරුෂ ලක්‍ෂ
ණ, 18 ස්ත්‍රීලක්‍ෂණය, 19
චිත්‍රකර්මය, 20 යන්ත්‍ර චෙඡ්
ද්‍යය, 21 පුස්තක ව්‍යාපරය,
22 ලෙඛ්‍යකර්මය, 23 දද්‍යුත

ක්‍රීඩාය, 24 ගන්ධ ශාස්ත්‍රය, 25 ශකුණිරුත ඥානය, 26 ග්‍රහ ගණිතය, 27 රත්නපරීක්ෂාය, 28 දරුකර්මය, 29 දන්තව්‍යාපාරය, 30 වාස්තුවිද්‍යාය, 31 ආයුර්වේදය, 32 මන්ත්‍රප්‍රයෝගය, 33 විෂාපහරණය, 34 ශාබ්දෝපදේශය, 35 තරණය, 36 ලඞ්ඝනය, 37 ප්ලුතය, 38 ආරෝහණය, 39 රත්නතන්ත්‍රය, 40 ඉන්ද්‍රජාලය, 41 කථාය, 42 නාටකය, 43 ආඛ්‍යායිකාය, 44 කාව්‍යය, 45 සර්වලිපිය, 46 සර්වදේශභාෂාය, 47 සර්වසංඥාය, 48 ශිල්පය, 49 ඡන්දස්ය, 50 චාපවිද්‍යාය, 51 චක්‍රවිද්‍යාය, 52 වජ්‍රවිද්‍යාය 53 කෘපාණවිද්‍යාය, 54 ශක්තිවිද්‍යාය, 55 තෝමර විද්‍යාය, 56 එරශු විද්‍යාය, 57 ගදා විද්‍යාය, 58 පිණශය 59 වෙනු වාද්‍යය, 60 මූරජ වාද්‍යය, 61 කාංසවාද්‍යය, 62 තාලවාද්‍යය 63 දූර වාද්‍යය, 64 ඉතිහාසය යන මොහුයි

තවද මන්ත්‍ර ශාස්ත්‍රා ගත සූසැට කලාවෙක්ද ඇත්. එනම්:- 1 ශූලිකරණය, 2 පාටලීකරණය, 3 එකාඞ්ග වෙදනය. 4 අෂ්ටාඞ්ග වෙදනය, 5 පිශාචිකාරණය, 6 ජර්දිකරණය, 7 කුබ්ජිකරණය, 8 කුෂ්ටිකරණය, 9 සෙවතීකරණය, 10 අන්ධීකරණය, 11 ග්‍රීවාභඞ්ගය, 12 ශිරස්කම්පනය. 13 බාහුනාශනය 14 පාදභඞ්ගය, 15 අඞ්ගුලිස්ඵොටනය, 16 නාශිකාච්ඡේදනය, 17 ශ්‍රොතභඞ්ගය, 18 අපානබන්ධනය 19 උම්මත්තකරණය, 20 වසීකරණය, 21 මොහනය, 22 විද්වේෂනය, 23 උච්චාටනය, 24 මාරණය, 25 ගතිස්ථම්භනය, 26 මතිස්ථම්භනය, 27 ග්‍රාමොච්චාටනය, 28 ජිහ්වාස්ථම්භනය, 29 පුරුෂ ප්‍රාණ හරණය, 30 පුරුෂ රුධිර ශ්‍රාවනය, 31 ද්‍යූතවිජයීකරණය, 32 සඞ්ග්‍රාමවිජය, 33 පරවිද්‍යාච්ඡේදනය, 34 පරයන්ත්‍ර හරණය, 35 පරමන්ත්‍ර හරණය, 36 සෛන්‍යොච්චාටනය, 37 සේනාස්ථම්භනය, 38 සේනොච්චාටනය 39 අග්නිස්ථම්භනය, 40 ජලස්ථම්භනය, 41 ඛඞ්ගස්ථම්භනය, 42 ශරස්ථම්භනය, 43 අෂ්ටිබන්ධනය, 44 ස්ත්‍රී රුධිර ශ්‍රාවනය, 45 පශුවශීකරණය, 46 දුෂ්ටමෘගවශීකරණය, 47 දුෂ්ටභයවශීකරණය, 48 දුෂ්ටගජවශීකරණය, 49 දුෂ්ට ගොවශීකරණය, 50 බහුක්ෂීර කරණය, 51 මන්ත්‍රවාදනය, 52 තන්ත්‍රවාදනය 53 රාජවශීකරණය, 54 පුරුෂ වශීකරණය, 55 ස්ත්‍රී වශීකරණය, 56 පුරපුටවශය, 57 ප්‍රතිමාකම්පනය, 58 ප්‍රතිමා වෙශ්‍යය 59 අදෘශ්‍ය කරණය, 60 බිලසාධනය, 61 පාදුකාසාධනය, 62 දූරදර්ශනය, 63 දූරශ්‍රාවය, 64 මෘත්‍යු වඤ්චනය යන මොහුයි.

මෙහිම ක්‍ෂුද්‍ර කලා 64 ක්ද වෙත් එනම්:-1 ව්‍යාධිකරණය, 2 සම්‍යක්සාධනය. 3 ගුලිකා සාධනය, 4 අඤ්ජන සාධනය, 5 ගරලය, 6 ග්‍රහභජනය, 7 ෂඩ්කරණය, 8 භගබන්ධනය 9 ලිඞ්ග බන්ධනය, 10 යොනි බන්ධනය 11 මුඛීකරණය, 12 ගාත්‍ර සඞ්කොචනය, 13 වාතනිවාරණය, 14 ශෛත්‍ය මොහනය, 15 භුජඞ්ගකර්ෂණය, 16 භූතාකර්ෂණය, 17 ග්‍රහාකර්ෂණය, 18 වනිතාකර්ෂණය, 19 මද්‍යවිනාශය, 20 මද්‍යකර්ෂණය, 21 ලිඞ්ගාච්චාටනය, 22 සත්‍රිපරිඩාතොද්ධාරණය, 23 ධූපය, 24 ලෙපය, 25 මාද්‍යය, 26 පානය 27 ස්ථානහරණය, 28 බාලහරණය, 29 සර්ප මොහනය, 30 අඞ්කමොහනය, 31 දණ්ඩෝච්ච පාතනය, 32 වාෂ්පීකරණය, 33 ඵල කරණය, 34 ඵල පාතනය, 35 අග්නිකරණය, 36 වමන කරණය, 37 මාරුතකරණය, 38 ගන්ධච්ඡිදශීතය, 39 ජ්‍යොදශීතය, 40 බෙවරතනය, 41 පාදුකාසිද්ධිය, 42 යොග ජනාසිද්ධිය, 43 සලිල ශොෂනය, 44 සුඛීපාතනය, 45 පජීතොත්පාදනය, 46 උල්කාපාතනය, 47 භූමි කම්පනය, 48 රකනය, 49 පාෂාණ වෘෂ්ටිය, 50 පාංශුවෘෂ්ටිය, 51 භූමිප්‍රවෙශය, 52 අග්නි ප්‍රවෙශය, 53 ජල ප්‍රවෙශය, 54 ධූමකරණය, 55 සාරස්වත සාධනය, 56 සම්පත්ති සාධනය, 57 මූෂික විනාශනය, 58 මශක විනාශනය, 59 සර්ප විනාශනය. 60 දීපි විනාශනය, 61 මජ්ජාර විනාශනය, 62 කපිවිනාශනය, 63 අලක්‍ෂිවිනාශනය, 64 භූතාතුර විෂනාශනය.

ශෛවතන්ත්‍රයෙහි අනිකුදු 64 දක්වනලදී.

ඒ මෙසේය,

1 නෘත්‍යය, 2 ගීතය, 3 වාද්‍යය, 4 නාට්‍යය, 5 ආලෙඛ්‍යය, 6 විශෙෂකච්ඡේද්‍යය. 7 තණ්ඩුලකුසුම බලි විකාරය, 8 පුෂ්පාස්තරණය, 9 දශනවසනාඞ්ගරාගය, 10 මණිභූමිකා කර්මය, 11 ශයනරචනය, 12 උදකවාද්‍යය, 13 උදකඝාතය, 14 චිත්‍රායොගය, 15 මාල්‍යග්‍රථනවිකල්පය, 16 ශෙඛරාපීඩයොජනය 17 නෙපථ්‍ය යොගය, 18 කණ්පත්‍ර භඞ්ගය, 19 ගන්ධයුක්තිය, 20 භූෂණයොජනය, 21 ඉන්ද්‍රජාලය, 22 කෞචුමාරයොගය, 23 හස්තලාඝවය, 24 චිත්‍රශාකාපූපභක්‍ෂ්‍ය විකාරක්‍රියාය, 25 පානකරසරාගාසවයොජනය, 26 සූචිවාපකර්මය, 27 සූත්‍රක්‍රීඩාය, 28 ප්‍රහෙලිකාය, 29 ප්‍රතිමාලාය, 30 දුර්වචකයොගය, 31 පුස්තකවාචනය, 32 නාටිකාඛ්‍යායිකා දර්ශනය, 33 කාව්‍යසමස්‍යා පූරණය, 34 පට්ටිකාවෙත්‍රවාණවිකල්පය, 35 තර්කුකර්මය, 36 තක්‍ෂණය, 37 වාස්තුවිද්‍යාව, 38 රූප්‍යරත්නපරීක්‍ෂාය, 39 ධාතුවාදය, 40 මණිරාග ඥානය, 41 ආකාර ඥානය, 42 වෘක්‍ෂායු

ච්ඡේද යොගය, 43 මේෂ කුක්කුටලාවක යුඬවිධිය, 44 ශුකශාරිකාප්‍රලාපනය, 45 උත්සාදනය, 46 කේශමාර්ජනකෞශලය, 47 අක්ෂරමුෂ්ටිකා කථනය, 48 ම්ලේච්ඡිතක විකල්පය, 49 දේශභාෂාඥානය, 50 පුෂ්පශකටිකානිමිත්ත ඥානය, 51 යන්ත්‍රමාතෘකාය, 52 ධාරණමාතෘකාය, 53 සම්පාට්‍යය, 54 මානසිකාව්‍ය ක්‍රියා, 55 ක්‍රියා විකල්පය, 56 ඡලිතකයොගය, 57 අභිධාන කොෂච්ඡන්දොඥානය, 58 වස්ත්‍ර ගොපනය, 59 ද්‍යූතවිශෙෂය, 60 ආකර්ෂක්‍රීඩාය, 61 බාලක ක්‍රීඩනකය, 62 වෛනායිකීයන්ගේ විද්‍යා පිළිබඳ ඥානය, 63 වෛජයිකියන්ගේ විද්‍යා පිළිබඳ ඥානය, 64 වෛතාලිකියන්ගේ විද්‍යා පිළිබඳ ඥානය, යනමෝහුයි.

සුරරාජ — ශක්‍රයා.
දිනරාජ— සූර්යයා.
ගිරිරාජ– මහමෙර.
තුරුරාජ— කල්පවෘක්ෂය.
කවිභොජ– පණ්ඩිතයන්ගේ පරිභොග වස්තුවක්වූ.
ශශිරාජ– චන්ද්‍රයා.
හර— මුක්තාහාරය.
තාර– තරුය.
සිඳුරාජ– ඓරාවත හස්තිරාජයා.
සුවිරාජ– අතිශයින් බබලන.
රිපුරාජඉභ– ශත්‍රුරාජ නමැති හස්තීන්ට.
වීර– උතුම්.
ශූර– දක්ෂ.
මදරාජ— අනඞ්ගයාට බඳු.
තනුසාරනිභ- සාරවූ දෙහශ්‍රීයට සමවූ.
නිජ නෘපවීර — ස්වකීය රජවරුන්විසින්.
මතිරාජ— සර්වඥ.
මනුරාජ– මනුෂ්‍යයන්ට රජවූ.
නරවීර– නරශ්‍රෙෂ්ඨවූ.
රාජාධිරාජ– රජවරුන්ට රජවූ.
පරරාජ– අන්‍ය රජවරුන්ට.
රාජේශ්වර– රාජොත්තම.
කෘපා– කරුණාව.
වක්‍ර– ආපසු ගමන.
අනුවක්‍ර— ආපසු අතික් රාශියට යාම.
ග්‍රහසට්ටන- ග්‍රහයුඬ.
ධූමකෙතු– වල්ගාතරු
දිග්දහ– දිශාදාහ.
රුධිරාම්භර · ආකාශය රක්තවර්ණව පෙනීම.
කලිකලහ– කොලාහල.
වෛකල්‍ය–විකලබව, රවුන් විරුඬවීම.
රක්තභානුප්‍රභා– සූර්යයා රක්තවර්ණව පෙනීම.
ගන්ධර්වගීති– ගන්ධර්වයන්ගේ ගීති ඇසීම.
උල්කාපාත– අහසින් එළිය හුල් බිමට වැටීම.
දුස්වප්න– නපුරු හින.
අෂ්ටාතිරෙකනවති— අටක්වැඩි අනූවක්, 98.
දිගා- දිග් + ආ, දීර්ඝායුෂ.
දිවාකරකුලශපත්– සූර්ය වංශයාගේ මුද්‍රිතව පැමිණි.
සැපත්වන– සම්ප්‍රාප්තවන.
නුමුත්–මුක්ත නොවූ, නොමිදුනු.
වා– වර්ෂය, අවුරුද්ද.

සිඟබාඅස්තෙහි

**ශෑමපද විවරණය නිමි.**

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුධ. | | ශුධ. |
|---|---|---|---|---|
| 1, | 1, | කුවේනි | — | කුවෙණි |
| 2, | 8; | මවස් | = | ඓවස් |
| | 14, | රිදි | – | රිදී |
| | 18, | වමින් | – | වමින් |
| 3, | 23, | සැවිකා | = | සළුවිකා |
| | 36, | අමා | – | අමෘ |
| 5, | 23, | කාංක්ෂවත් | — | කාංක්ෂිවත් |
| | 36, | මශෙලාසන | — | ශෛලආසන |
| 6, | 2, | එකජත්‍ර | – | එකච්ඡත්‍ර |
| 7, | 25, | බෘන්දම්කරන්ද | — | මකරන්දබෘන්ද |
| 9, | 16, | කලින් | — | කලං |
| 11, | 31, | බලහද්‍ර | – | බලභද්‍ර |
| | 32, | වික්‍රම | — | වික්‍රම |
| 13, | 23, | වඩිවන | — | වඩවනා |
| 14, | 12, | වක් | – | වජ් |
| 15, | 4, | වහස | – | විහසල් |
| | 15, | භූඩිගාර | — | භාඩිගාරි |
| 16, | 19, | රැල | — | රැළ |
| | 35, | නොනැවතම් | — | නොනැවතම |
| 17, | 36, | රඟසිග | – | සුරඟසිය |
| | 39, | ත්නවු | — | යෝනවු |
| | 39, | දකඩාරමසන් | — | උදකඩාරාමවක් |
| 20, | 19, | කවට | – | කවච |
| 8, | 21, | නාඳ | – | නොනඳ |
| 21, | 33, | දෘගානාවම් | – | සඳගනාවම් |

| පිට. | පෙළ, | අශුඬ | | ශුඬ. |
|---|---|---|---|---|
| 22, | 28, | වියල් | — | පියල් |
| | 38, | පුබුදුක | — | පුබුදුකර |
| 24, | 18, | මෙධනිග | — | මෙධනිඝ |
| | 21, | පුවල | — | පුවලු |

## ගැටපද විවරණයෙහි

——o:o——

| | | | | |
|---|---|---|---|---|
| 2, | 33, | ලල | — | ජල |
| | 42, | හිම | = | හිම |
| | 72, | කිරි | — | කිරි |
| 3, | 37, | චාත | — | චාත |
| 4, | 61, | බ්‍රමර | — | භ්‍රමර |
| 5, | 21, | ළිය | — | ගුළිය |
| 6, | 5, | අම්‍ෘතාකාර | = | අමෘතාකාර |
| | 36, | සථඥත | — | සථඥත |
| 16, | 21, | වලිභ්‍රමර | = | වලී=භ්‍රමර |
| 18, | 70. | කුතුරුවා | — | ජලකුතුරුවා |
| | | පිටනොකරවා | - | දියපිටකරවා |



